
S THE MOST FAMOUS MYSTERIOUS STORIES THE MOST FAM

# මරණාසන්න අත්දැකීමක් !



## A NEAR DEATH EXPERIENCE !

kathapothak.blogspot.com

ලසිත රවීන් උමගිලිය

kathapothak.blogspot.com

# බිහිසුණු සිදුවීමක්

"රොජර් හිතන්නෙ මැරෙන එක ද ලේසි? ජීවත් වෙන එකද?" පොලිස් පරීක්ෂක ඉයන් කෲස් පැවසුවේ ලිපියක් රොජර් වෙත විසි කරමිනි.

ඉයන් පැවසුවේ කුමක් දැයි කියා රොජර්ට එක්වරම නොවැටහිණි. එහෙයින් ඉයන් තමා වෙත විසි කළ ලිපිය දිග හැරි රොජර්, ඒ වෙත සිය පූර්ණ අවධානය යොමු කළේය.

> *මහත්මයාණනි,*
>
> *දෙවැනි වරටත් වන රොදක තිබී තරුණියකගේ දෑත් දෙපා සහ හිස සුන් මළ කඳක් සොයා ගැනිණි. ස්කොට්ලන්ඩ්යාඩ්හි මැදිහත් වීමක් අත්‍යවශ්‍ය බව පෙනී යයි. මෙම මිනීමැරුම සම්බන්ධයෙන් මෙතෙක් කිසිවක් අනාවරණය වී නොමැත.*
>
> *W. හෙල්ගසන්*
>
> *මැකල්ටන්*
>
> *උතුරු එංගලන්තය.*

"රොජර්ට මතකද මීට සති දෙකකට කලින්නුත් මේ වගේම දෙයක් සිද්ධ වුණා, මැකල්ටන් වල? ඉයන් විමසීය.

"ඔව්, මට හොඳට මතකයි. හැබැයි මේ වගේ දේවල් අහද්දි නම් හිතෙනවා ජීවත් වෙනවට වඩා මැරෙන එක අමාරුයි කියලා. මේ අපරාධකාරයා නම් මානසික විකෘතියකට ලක්වෙච්ච මිනිහෙක්. එහෙම නැත්නම් අමානුෂික විධියට මේ වගේ ලස්සන කෙල්ලෙක්ගෙ අතපය කපලා දාන්න පුළුවන්ද? මේක බලන් ඉන්න හොඳ දෙයක් නෙවෙයි ඉයන්. ඔය හෙල්ගසන්ට තවම මොනාවත්ම හොයා ගන්න බැරිවෙලා ද මේ සම්බන්ධව?"

"ඔව්, කිසිම දෙයක් හොයාගන්න බැරිවෙලා. අඩුම තරමෙ අර මීට සති දෙකකට කලින් මැරුණ ගෑනු ළමයා කවුද කියලවත් තවම හඳුනාගෙන නෑ."

"ඒ ගැන විස්තර අපි පත්තරවල පළකරා නේද ඉයන්?"

"ඔව්. ඒත් වැඩක් වුණෙ නෑ. කොහොම වුණත් ඒ ළමයා මැකල්වන් පැත්තෙ කෙනෙක් නොවෙන බව නම් විශ්වාසයි."

"ඒ කාත් කවුරුවත් නැති අනාථ කෙල්ලෙක් වෙන්න බැරි ද?"

"මමත් ඒ ගැන කල්පනා කළා. ඒත් අපි කොහොම කියලා දැනගන්න ද ඒ කවුද කියලා?"

"අතුරුදහන් වුණ ගෑනු ළමයින්ගෙ විස්තර හොයලා බැලුවද ඉයන්. සමහර විට ඒ අතරෙ ඉන්න පුළුවන්, මේ මළ සිරුරෙ තියෙන ලක්ෂණවලට සමාන ලක්ෂණ තියන ළමයෙක්."

"ඔව්, මම ඒ ගැන හොයලා බැලුවා රොජර්. මළ සිරුරෙ උසට, මහතට, හමේ පාටට ටිකක් හරි ගැලපෙන එක්කෙනයි හිටියෙ. නම සාරා මාස්ටර්. ඒත් ඒ කෙල්ලගෙත් චරිතෙ නම් එච්චර හොඳ නෑ. කාටත් තේරෙන භාෂාවෙන් කියනවා නම් සාරා කියන්නෙ ගණිකාවක්."

"ඔව්. ඒ වගේ අයට තමයි ඉයන් ලේසියෙන්ම මේ වගේ කරදර සිද්ධ වෙන්නෙ. ඇයි යන්නෙ එන්නෙ



බොන්නෙ මොනව ද කියලවත් හොයන්න කවුරුවත් නෑ. ඒ කොහොම වුණත් අන්න ඒ සාරාගෙන් තමයි ඉයන් අපි පරීක්ෂණේ ආරම්භ කරන්න ඕනෙ."

"ඒත් වැඩක් වෙලා නෑ රොජර්, පරීක්ෂණ සම්පූර්ණයෙන්ම අසාර්ථක වුණු බව හෙල්ගසන් දන්වලා එවලා තිබුණා." ඉයන් පැවසීය. මොහොතක් නිහඬව සිටි රොජර් නැවත දොඩමළු විය.

"හොඳයි අපි හිතමුකො ඇත්තටම ඒ කිසි දෙයක් හොයා ගන්න පුළුවන් කමක් තිබුණෙ නෑ කියලා. ඒත් මේ අළුත් සිද්ධිය නිසා හෙල්ගසන්ට මිනීමරුවා ගැන පුංචි හෝඩුවාවක් හරි හොයා ගන්න පුළුවන් වෙන්න ඕනෙ."

"ඔව්. කිසි සැකයක් නෑ. මේකත් ඒ මිනීමරුවගෙ ම වැඩක් තමයි. මේ මිනීමැරුම් දෙකම සිද්ධ කරලා තියෙන්නෙ එකම විධියට. අතපය වෙන් කරන්න පාවිච්චි කරලා තියෙන්නෙ ලොකු මන්නයක්, පිහියක් වගේ තියුණු බර ආයුධයක්." ඉයන් පැවසීය. මට හිතෙන්නෙ හෙල්ගසන්ගෙ අදක්ෂකම නිසා තමයි තවම කිසි දෙයක් හෙළිකරගන්න බැරිවෙලා තියෙන්නෙ.

එදින පෙරවරු එකොළහ පමණ වන විට මැකල්වන්හි පොලිස් පරීක්ෂක හෙල්ගසන් ලන්ඩනයේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලිස් මූලස්ථානය වෙත ළඟා විය.

දුටුවන් තුළ බිය සහ සන්ත්‍රාසය උපදවනසුලු ගාම්භීර පෙනුමක් තිබූ වෙන්ස් හෙල්ගසන් ඉයන්ට සහ රොජර්ට අතට අත දී ආචාර කළේය. ඔහු තිස්පස් වැනි වියෙහි පමණ පසුවන්නට ඇතැයි රොජර්ට සිතිණි.

"රොජර්, මගේ පණිවිඩේ ලැබෙන්න ඇති නේද?"

"ඔව්, අපි උදේ ඉඳලම කතා කර කර හිටියේ ඒ ගැන තමයි. අර මීට සති දෙකකට කලින් සිද්ධ වුණු මිනීමැරුම ගැන මොනවත් හොයා ගන්න බැරි වුණා ද හෙල්ගසන්?"

"ඒ ගැන කතා කරලා වැඩක් නෑ රොජර්. සැකකාරයො නම් දෙතුන් දෙනෙක්ම ඉන්නවා. ඒත් වැඩක් වුණේ නෑ. උන්ව මෙතනට සම්බන්ධ කරන්න පුළුවන් විධියෙ කිසිම දෙයක් නෑ. මට දැන් මේක තිත්ත වෙලා." හෙල්ගසන් පැවසීය.

"මට නම් දැනගන්න ලැබුණේ පත්තරවල පළවෙච්ච දේවල් විතරයි. හෙල්ගසන්ට පුළුවන් නම් පසුගිය සිද්ධිය ගැන අපිට තව ටිකක් විස්තර කරන්න, ඒක අපිට ගොඩක් ප්‍රයෝජනවත් වෙයි."

"ඔව්, මම මේ තකහනියක්ම ආවේ ඒ ගැන කතා කරන්න තමයි..." මම මුලින්ම අර මීට සති තුනකට උඩදී හමු වුණු මළ සිරුර ගැන මට හොයා ගන්න පුළුවන් වුණ දේවල් කියන්නම්. ඒ මළ සිරුර තිබුණෙ කැලෑ රොදක. ඒ හරියෙ ජනගහනය බොහොම අඩුයි. මැකල්ටන් ටවුමෙ ඉදල පල්ලිය පැත්තට යොමුවෙලා තියෙන ප්‍රධාන පාරෙන් තවත් අතුරු පාරකට හැරිලා යන කොට හමු වෙනවා පුංචි දොළ පාරක්. අන්න ඒ හරියෙ වනරොදක තිබිලා තමයි මේ මළ සිරුර හොයා ගෙන තිබුණෙ. මුලින්ම ඒක දැක්කෙ විලියම් කියන මනුස්සයා. මිනිහා බොහොම දුප්පත් අසරණ මිනිහෙක්. ඒ කිට්ටුව මිනිහට දර මඩුවක් තියෙනවා. උදේ ගෙදර ඉදලා දර මඩුවට යන අතරතුර විලියම් අහම්බෙන් වගේ අර දොළ පාරට ආවා මූණ කට හෝදා ගන්න. ඒ අතරතුර තමයි විලියම්ට අර දැන් දෙපා හිස නැති මළ සිරුර දැක ගන්න ලැබුණෙ.

මළ සිරුරෙන් හිස, අත් පය මේ හැම දෙයක්ම වෙන් කරලා තිබුණා. මළ සිරුර එතනට වෙන තැනක ඉදල ගෙනත් දාපු එකක් බව පැහැදිලිව පෙනුණා. ඒ හරියෙ තණ පඳුරු තැලිලා පොඩිවෙලා තිබුණත් අඩි සලකුණු සටහන් වෙලා තිබුණෙ නෑ. ඒක පුදුමයක් නෑ. මොකද ඒ හරියෙ පොලොව ඝන තණ පිල්ලකින් වැහිලයි තියෙන්නෙ.

අධිකරණ වෛද්‍ය පරීක්ෂණයෙන් ඔප්පු වුණා, මරණයට හේතුව බර මුවහත් ආයුධයකින් සිදු කළ තුවාල වලින් අධික ලෙස රුධිරය





වහනය වීම කියලා. ඒක දොස්තර මහත්තයා අමුතුවෙන් කියන්න ඕනෙ කමක් නෑ. බැලූ බැල්මටම පේනවා මරණයට හේතුව මොකක්ද කියලා. මෙතන තිබුණු අමාරුම දේ තමයි මළ සිරුර හඳුනා ගැනීම. ඒක ලේසි පහසු කටයුත්තක් වුණේ නෑ. මළ සිරුරෙ කිසිම ඇඳුමක් තිබුණෙ නෑ. ඒ නිසා අධිකරණ වෛද්‍යවරයගෙ වාර්තාව තමයි අපේ පිහිටට තිබුණෙ. ඒ වාර්තාවෙ සඳහන් වුණා. 'මිය ගිය තැනැත්තිය වයස අවුරුදු විසි හයත් විසි අටත් අතර, උස අඩි පහයි අඟල් පහක් පමණ වන දරුවන් ප්‍රසූත නොකළ තැනැත්තියක්.' කියලා.

රොජර්ට තේරෙනවනෙ මේ වගේ විස්තරයක් කොහොමටවත් ප්‍රමාණවත් නොවන බව. ඉතින් අපේ පරීක්ෂණ සම්පූර්ණයෙන්ම අසාර්ථක වුණා." හෙල්ගසන් පැවසීය.

"හොඳයි, මේ අලුත් සිද්ධිය ගැන මොනවද කියන්න තියෙන්නෙ?" රොජර් විමසීය.

"මේක ඊට වඩා සූක්ෂ්ම විධියට සැලසුම් කරලා සිද්ධ කරපු අපරාධයක්."

"මට තවම මේ ගැන වැඩි විස්තරයක් දැනගන්න ලැබුණෙ නෑ... ඒ නිසා මම කැමතී හෙල්ගසන් ඒ ගැන තොරතුරු ටිකක් මට කියනවා නම්..."

"මේ මළ සිරුර සොයා ගත්තෙත් කැලෑවක තිබිලා... මැකල්ටන් කනත්ත පහුකරන් ටිකක් දුර ගියහම එල්ම් වනයක් හම්බ වෙනවා. මුළු කැලෑවම යෝධ එල්ම් ගස්වලින් පිරිලා. ඒ නිසා දවාලටත් ඒ හරියෙ මහ අඳුරු පාළු ගතියක් තමයි තියෙන්නෙ. ඊයෙ උදේ පාන්දර හයට විතර මගේ බංගලාවට පණිවුඩයක් ආවා, වහාම පොලිස් මූලස්ථානයට එන්න, මිනීමැරුමක් ගැන ආරංචියක් ලැබුණා කියලා. ආරංචිය ගෙනත් තිබුණෙ වයස අවුරුදු දාහතරක විතර කොළු ගැටයෙක්. අහම්බෙන් කැලෑවට ඇතුළු වුණ මේ

ළමයට දකගන්න ලැබුණාලු. දුඹුරු පාට යමක් ඇත ගහක් පාමුල වැටිලා තියෙනවා. එතැනට ළං වුණාම තමයි ඒ ළමයට දක ගන්න ලැබිලා තියෙන්නෙ, ඒ අත, පය, හිස නැති මළ කඳක් බව. ඒක දකලා මේ ළමයා දැඩි කම්පනයකට පත්වෙලා මිනිත්තු කිහිපයක් ගල් ගැහිලා වගේ බලාගෙන ඉඳලා තියෙනවා. ඉන් පස්සෙ කෙලින්ම දුවගෙන ආවේ පොලීසියට.

මම එතනට ගිහින් පරීක්ෂා කළා. මේකත් අර කලින් සිද්ධිය වගේමයි. මැරිලා තිබුණෙ තරුණියක්. කිසි සැකයක් නෑ. මේකත් අර මිනීමරුවගෙම වැඩක්." හෙල්ගසන් පැවසීය.

"පශ්චාත් මරණ පරීක්ෂණයෙදි මොනවද කිව්වෙ?"

"කලින් කතාවම තමයි. වයස අවුරුදු විසිදෙකත් විසිහතරත් අතර. උස අඩි පහයි අඟල් හතයි... තවත් විස්තර ඇති. මෙන්න ඒ වාර්තාව..." හෙල්ගසන් රොජර් අත ලිපියක් තැබුවේය.

එම ලිපිය දෙස මදක් වේලා බලා සිටි රොජර් නැවත දොඩමළු වූවේය.

"හෙල්ගසන්, මට තව පැයක් දෙන්න. මේ ප්‍රශ්නෙ තවත් ඇදී දුවන්න දෙන්න බෑ. මමයි ඉයනුයි එනවා හෙල්ගසන් එක්ක." රොජර් පැවසුවේ තීරණාත්මක ලෙස සිය සුරතේ දබරැඟිල්ලෙන් ලිපිය වෙත තට්ටු කරමිනි.

ජ ජ ජ

kathapothak.blogspot.com

# මැකල්ටන් වෙත

රාජකාරිය සහ පෞද්ගලික ජීවිතය එකිනෙක පටලා ගැනීම රොජර්ගේ සාමාන්‍ය සිරිත නොවේ. එහෙත් හිටි හැටියේ මැකල්ටන් වැනි දුර බැහැර ප්‍රදේශයක් වෙත ගමන් කිරීමට සිදුවීම පිළිබඳ සිය පෙම්වතිය වූ ප්‍රින්කාට දන්විය යුතු යැයි රොජර්ට සිතිණි. කුලී රියකට ගොඩවූ රොජර් ප්‍රින්කාගේ නවාතැන බලා පිටත් විය. ඇතැම් විට පරීක්ෂණය දින ගණනාවක් දිග් ගැස්සීමට ඉඩ ඇත. එසේ වූවහොත් තමාට පෙරළා ලන්ඩනය වෙත පැමිණීමට දින කිහිපයක් ගත වනු ඇතැයි කුලී රියෙහි ගමන් ගන්නා අතර ඔහු අනුමාන කළේය. රොජර් ඇය නවාතැන් ගෙන සිටි කුලී නිවස වෙත පැමිණෙන විට ඇය සිටියේ විසිත්ත කාමරයේ දිගු සෝපාවට වී පොතක් කියවමිනි.

නිවස ඉදිරිපිට නැවැත්වූ අස් රියේ හඬ ඇසුණු ඇය පැමිණ දොර හැරියාය.

"රොජර්, මම පුදුම වුණා මේ වෙලාවෙ ඔයාව දකලා. මම හිතුවෙම නෑ ඔයා මේ වෙලාවෙ මාව බලන්න එයි කියලා." ඇය පැවසුවේ මුව පුරා සිනාසෙමිනි.

"මට හදිස්සියෙ මැකල්ටන් යන්න සිද්ධ වෙලා ප්‍රින්කා. ඒකයි මම මෙ දුවගෙන ආවේ ඒ බව ඔයාට කියන්න." රොජර් පැවසුවේ හාන්සි පුටුවකට බර වෙමිනි.

"ඒ කියන්නෙ ඔයා මාව දාලා දුර යනවා කියන එකනෙ.. මතකද ඔයා මට පොරොන්දු වුණා... ආයෙත් දුර යන්න වුණොත් මාවත් එක්ක යනවා කියලා..." ප්‍රින්කා පැවසුවේ පැමිණ, රොජර් අසුන්ගෙන සිටි අසුනේ ඇන්දට බර වෙමිනි.

"ප්‍රින්කා, මේක ඔයා හිතන විධියට විනෝද වෙන්න පුළුවන් අවස්ථාවක් නෙවෙයි. මෙතන මහ භයානක මිනී මැරුම් දෙකක් සිද්ධවෙලා තියෙනවා..." ඉන්පසු ඔහු මැකල්ටන්හි සිදුවී ඇති ව්‍යසනය ඇයට සැකෙවින් පැහැදිලි කළේය. එය අසා ඇය හිනියට පත් වූවාය.

"මම ඔයාව අධෛර්යයට පත් කරන්න හිතාගෙන නෙවෙයි කියන්නෙ. ඒත් මම කැමති නෑ, ඔයා මේ වගේ අවධානම් දේවල් වලට අත ගහනවට. කරන දෙයක් පරිස්සමෙන් රොජර්..."

"මට තේරෙනවා ඔයා කියන දේ..."

"මම කැමතියි ඔයත් එක්ක ඇවිත් ඔයාට ශක්තියක් වෙන්න."

"එපා.., මම කැමතියි ඔයා මං ළඟින්ම ඉන්නවට. ඒත් මට හිතෙනවා ඔයාව එක්කරන් යන එක නුවණට හුරු නෑ කියලා. අනික මමත් එක්ක ඉයන් යන නිසා බය වෙන්න දෙයක් නෑ. අවධානමක් නැත්නම් මම ඔයාව එහෙට ගෙන්ව ගන්නම්.." රොජර් පැවසුවේ ඇගේ බඳ වටා සුරත යවමිනි. ඉන් අනතුරුව ප්‍රින්කාට සමු දුන් ඔහු කුලී රියක නැගී නැවත පොලිස් මූලස්ථානය බලා පිටත් විය.

× × × × ×

රොජර් එහි ළඟා වන විට ඉයන් සහ මැකල්ටන් හි පොලිස් පරීක්ෂක හෙල්ගසන් උද්ගත වී ඇති ගැටලුව පිළිබඳ සාකච්ඡා කරමින් සිටිනු පෙනිණි.





"ආ... රොජර්, අපි එහෙනම් තව විනාඩියකින් පිටත් වෙමු නේද? මම එන ගමන් දුම්රිය කාලසටහන බැලුවා. හවස දෙකයි තිහට මැකල්ටන් වලට යන කෝච්චියක් තියෙනවා. අපිට ඒක අල්ල ගන්න පුළුවන් වෙයි." හෙල්ගසන් පැවසුවේ සිය අත් ඔරලෝසුව දෙස බලමිනි.

හෙල්ගසන්, ඉයන් සහ රොජර් කුලී රියක නැගී ලන්ඩන් දුම්රිය පොළ වෙත ළඟා වන විට දුම්රිය වේදිකාවේ නතර කර තිබෙනු දක්නට ලැබිණි. එය මන්දගාමී දුම්රියක් වූයෙන් ඔවුනු ගමනාන්තය කරා ළඟා වන විට සවස් වී තිබිණි. දුම්රියේ ගමන් ගන්නා අතරතුර හෙල්ගසන් විසින් මැකල්ටන් පෙදෙස පිළිබඳවත් සිය වෘත්තීය ජීවිතය පිළිබඳවත් තොරතුරු රාශියක් රොජර් සහ ඉයන් සමඟ පැවසීය.

"ඊයේ හොයාගත්ත මළ සිරුර ගැන විස්තර පත්තරවල පළ කරන්න කියලා දැනුම් දුන්නා නේද ඉයන්?" රොජර් විමසුවේ මැකල්ටන් වලට පා තැබූ පසුවයි.

"ඔව්... මම පත්තර තුනකට ඒ විස්තර යැව්වා."

"විශේෂයෙන් පහුගිය දවස්වල අතුරුදහන් වුණු ගැහැනු ළමයි ගැන විස්තර හොයලා බලන්න වෙයි. මට හිතෙනවා, මේ විදාලෙට මැරුණු ගැහැනු ළමයාව හඳුන ගන්න පුළුවන් වෙයි කියලා." රොජර් පැවසීය.

එහෙත් හෙල්ගසන් සහ ඉයන් ඊට කිසිදු ප්‍රතිචාරයක් නොදැක් වූහ.

"හෙල්ගසන්, අපි මේ යන ගමන්ම මෘත ශරීරාගාරේ පැත්තෙ ගියොත් හොඳයි."

"ඒ මොකටද?" හෙල්ගසන් විමසීය.

"අර ඊයෙ හොයා ගත්ත මළ සිරුර තවම එහෙ ඇති නේද?"

"ඔව්"

"මට හිතෙනවා මගේ ඇස් දෙකෙන්ම ඒක ටිකක් බැලුවොත් හොඳයි කියලා."

"රොජර්ගෙ කැමැත්තක්. මෙතන ඉඳලා වැඩි දුරක් නෑ මෘත ශරීරාගාරෙට. එන්න අපි කුලී කරත්තයක් අල්ලගමු." හෙල්ගසන් පැවසීය.

ඉන් පසු ඔවුහු කුලී රියක නැගී මෘත ශරීරාගාරය වෙත පිටත්ව ගියහ. රාත්‍රිය උදාවෙමින් පැවතියෙන් වීථි දෙපස නිවාසවල ගෑස් පහන් දැල්වීම අරඹා තිබිණි.

* * *

kathapothak.blogspot.com

kathapothak.blogspot.com

# බිහිසුණු දසුනක්

"මං හිතන්නෙ රොජර්ට දොස්තර මහත්තයවත් මුණගැහෙන්න පුළුවන් වෙයි." හෙල්ගසන් පැවසුවේ මෘත ශරීරාගාරයේ ගේට්ටුවෙන් ඇතුළුවන විටයි. ඉන් අනතුරුව ඔහු අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාගේ නිල මැදිරියට රොජර්ව සහ ඉයන්ව කැඳවාගෙන ගියේය.

"රොජර් මහත්තයා, මට හිතාගන්න බෑ මිනිහෙක් කොහොමද මේ වගේ දරුණු අපරාධයක් කරන්නෙ කියලා. ස්ථිර වශයෙන්ම මට කියන්න පුළුවන් මේ මිනීමරුවා ගිහින් නවතින්නෙ එල්ලුම් ගහේ තොණ්ඩුවෙ නෙවෙයි, පිස්සන් කොටුවෙ." අධිකරණ වෛද්‍ය නිලධාරියා පැවසීය.

ඉන් පසු ඔහු මෘත ශරීරාගාරයට ඔවුන්ව කැඳවාගෙන ගියේය.

"මට නම් දැන් ඕක බලල ඇතිවෙලා. මගේ ඔළුවත් කැරකෙනවා ඒ ගැන මතක් වෙද්දි. මම එළියෙන් ඉන්නම්, රොජර් ගිහින් බලලා එන්න." හෙල්ගසන් පැවසුවේය. එහෙයින් රොජර්, ඉයන් සමග මෘත ශරීරාගාරයට ඇතුළු වූයේය. එහි සිටි සුළු සේවකයකු පොලිස් නිලධාරීන් දෙදෙනා අදාළ ස්ථානයට කැඳවාගෙන ගියේය.

අවසානයේ ඔවුන්ට දක්නට ලැබුණේ හද කම්පා කරවනසුලු දසුනකි. එය දැක රොජර්ගේ හිස බමන්නට වුවද දැඩි ආයාසයකින් යුතුව ඔහු සිත ශක්තිමත් කර ගත්තේය. තරුණියගේ සියුමැලි දෑත්

දෙපා සහ හිස මුවහත් ආයුධයකින් කපා ඉවත් කර තිබිණි. අමනුෂ්‍යයකුට මිස මෙලොව වසනා කිසිදු මිනිසෙකුට මෙවන් අපරාධයක් සිදු කළ නොහැකි බව පැහැදිලිය. සිය මිතුරු නිලධාරී ඉයන් කෑස් ද මුසපත් වී ඒ දෙස බලා සිටිනු රොජර් දුටුවේය. මිනිත්තු කිහිපයකට පසු ඔවුන් දෙදෙනා ඉන් පිට විය.

"රොජර්, මොකද හිතෙන්නෙ මේ ගැන?" හෙල්ගසන් විමසුවේ මෘත ශරීරාගාරයෙන් පිටවී එන අතරතුරයි.

"මට නම් හිතාගන්න බෑ. මේ මිනීමරුවා මොන වගේ මානසික තත්ත්වයක ඉන්න කෙනෙක් ද කියලා" රොජර් පැවසීය. ඉන් අනතුරුව ඔවුහු මැකල්ටන් පොලිස් මූලස්ථානය වෙත පැමිණියහ.

"සාජන් ඩව්ලි, මොකද මේ මිනිස්සු දෙන්නෙක් කුඩුවෙ?" හෙල්ගසන් විමසීය. ඔහුට තමා එහි නොමැති කාලය අතරතුර අත්අඩංගුවට ගෙන තිබූ තැනැත්තන් පිළිබඳ තොරතුරු දැන ගැනීමට අවශ්‍ය විය. හෙල්ගසන්ට සිය රාජකාරි ඉටුකර ගැනීමට ඉඩහළ රොජර් සහ ඉයන් පසෙක තබා තිබූ අසුන් වල ඉඳගත්හ.

හැඩි දැඩි පෞරුෂයක් සහිත හෙල්ගසන්ගේ මුහුණ දුටු සැණින් සිරකරුවන්ගේ මුහුණු භීතියෙන් මුසපත් වනු රොජර් දුටුවේය. සැබැවින්ම මෙවන් දෘඪ පාලනයක් සහිත පොලිස් බලසීමාවක් තුළ එවන් ඛේදවාචකයක් සිදුවීම පුදුමයට කරුණකි.

"රොජර්, මට ආරංචි වුණු හැටියට හෙල්ගසන් අවිවාහකයි. ඒ නිසා අපිට හෙල්ගසන්ගෙ බංගලාවෙම නවතින්න පුළුවන්."

"ඔව්, ඒක හොඳයි... හෙට උදෙන්ම අපි ඔය මිනිය තිබුණයි කියන තැන පරීක්ෂා කරලා බලන්න ඕනෙ." රොජර් පැවසීය.

පැයක පමණ කාලයක් ගත වූ පසු හෙල්ගසන් නැවත රොජර් හමුවට පැමිණියේය.





"රොජර්, මම රොජර්ලට මේ ළඟම හෝටලේක කාමර දෙකක් වෙන් කළා. තවත් රෑ වෙන්න කලින් අපි එහෙ යමු. මම කෑමත් සූදානම් කරන්න කියලා පණිවුඩයක් යැව්වා."

"ඒක හොඳයි... අපි හෙට උදෙන්ම අර එල්ම් කැලෑව පැත්තෙ යමු හෙල්ගසන්..." රොජර් පැවසීය. හෙල්ගසන් විසින් රොජර්හා සහ ඉයන්ට පොලිස් මූලස්ථානයට සැතපුම් කාලක පමණ දුරින් පිහිටි 'කන්ට්‍රිවැලිව්' සුපිරි හෝටලයෙම් කාමර යුගලක් වෙන්කර තිබිණි.

"හෙල්ගසන්, අර මුල් සිද්ධිය වුණ වෙලාවෙ දෙන්නෙක්ව අත්අඩංගුවට ගත්තා කියලා කිව්වා නේද?" ඉයන් විමසුවේ ආහාර ගන්නා අතරයි.

"ඔව්, ඒත් වැඩක් වුණේ නෑ." හෙල්ගසන් පැවසීය.

"මට ඒ අයගෙ විස්තර ටිකක් කියන්න හෙල්ගසන්." රොජර් විමසුවේ උද්‍යෝගයෙනි.

"එකෙක් මැකල්ටන් වල නම ගිය අපරාධකාරයෙක්. සමහර විට රොජර් මිනිහගෙ නම අහලත් ඇති... මිනිහ තමයි විලියම් බෲස්ටර්, ක්ෂේත්‍රයෙ මිනිහව හඳුන්වන්නෙ ඩී. බී. ඩී. සී කියලා. මිනිහට විරුද්ධව චෝදනා දහඅටක් තියෙනවා. අටක් සොරකම්, හයක් මංකොල්ලකෑම්, තුනක් බැංකු මංකොල්ලකෑම්, එකක් මිනීමැරුම්. මම මුලින් හිතුවෙ මේක ඩී. බී. ඩී. සී. ගේ වැඩක් කියලයි. ඒත් මිනිහා මේ සිද්ධිය වෙන වෙලාවෙ ඉඳල තියෙන්නෙ මැකල්ටන් වලට හැතැප්ම විස්සක් ඈතින්.

දෙවැනි සැකකාරයා තමයි මේ පැත්තෙ කම්මල්කාරයා, මයිකල්. මිනිහා එදා හවස ගෝනි වගයක් උස්සන් පාරේ එහා මෙහා කිහිපසැරයක් ගිය බවට සාක්ෂි තියෙනවා. ඒත් මම ප්‍රශ්න කරද්දි

මිනිහා මත්තු කළා. තමන් ඒ ගෝනිවල ගෙනාවෙ පරණ යකඩ තහඩු තොගයක් බව." හෙල්ගසන් පැවසීය.

රොජර් පෙර මිනී මැරුමට සැක පිට අත්අඩංගුවට ගනු ලැබූ එම සැකකරුවන් දෙදෙනාගේ ලිපින හෙල්ගසන්ගෙන් අසා දැනගත්තේය. පරීක්ෂණය ඇරඹිය යුත්තේ කොතැනින් දැයි යන්න රොජර් තීරණය කළ බව ඉයන් වටහා ගත්තේය. රාත්‍රී ආහාරයෙන් පසු හෙල්ගසන් තානායමෙන් පිටව ගියේය.

අගක් මුලක් සොයාගත නොහැකි මෙම ගැටලුව විසඳිය යුත්තේ කෙසේ දැයි කල්පනා කරමින් මිනිත්තු කිහිපයක් නිහඬව සිටි රොජර් හුන් තැනින් නැගී සිටියේය.

"රොජර්, මොනවද කල්පනා කළේ?"

"මේ මිනීමැරුම් වල අරමුණ මොකක්ද කියලා."

"පළිගැනීමක්" ඉයන් පැවසීය.

"ඔව්. මටත් හිතුණෙ බොහෝ දුරට මේ මිනී මැරුම් සිද්ධ කළේ පළිගැනීමක් විදියට කියලයි. විශේෂයෙන් අපි මෙතනදි අපේ අවධානය යොමු කරන්න ඕනෙ මෙන්න මේ දෙවැනි සිද්ධියට."

"ඇයි දෙවැනි සිද්ධිය. මුල් මිනී මැරුම අපිට අමතක කරන්න විදියක් නෑ."

"නෑ මම එහෙම නෙවෙයි කිව්වෙ. මම කියන්නෙ මේ ගැන යමක් ගැඹුරට හොයලා බලන්න පුළුවන් වෙන්නෙ, එහෙමත් නැත්නම් හොයලා බලන්න තවම අවස්ථාව තියෙන්නෙ, ඊයෙ සිද්ධ වුණ මිනී මැරුමට අපේ වැඩි අවධානයක් යොමු කළොත් විතරයි."

"ඔව්, ඒක ඇත්ත." ඉයන් රොජර් හා එකඟ විය.





"ඉයන් අහලා තියෙනවද විද්‍යාවෙ පරීක්ෂණ ගැන කතා කරද්දි 'පාලක පරීක්ෂණය' කියන වචනෙ පාවිච්චි වෙනවා?"

"ඔව්."

"මට හිතෙන්නෙ අර මුල් සිදුවීමත් මිනී මරුව සිද්ධ කළ අත්ත ඒ වගේ පාලක පරීක්ෂණයක්. එහෙමත් නැත්නම් පෙර අත්හදා බැලීමක් කියන්න පුළුවන්. මම හිතපු විදිය හරි නම් හෙට උදේ වෙන්න කලින් අපිට අලුත් ආරංචි මොනවා හරි අහන්න ලැබෙයි.

kathapothak.blogspot.com

# තත්ත්වය නරක අතට හැරෙන ලකුණු

රොජර්ගේ අනාවැකිය සැබෑවක් බවට පත්වීමට වැඩි කාලයක් ගත නොවිණි. පසු දින අළුයම හතරට පමණ මැකල්ටන් පොලිස් ස්ථානය භාරයේ රොජර් නමට විදුලි පණිවුඩයක් ලැබිණි.

"රොජර් මහත්තයා!" යමෙකු ඉතා තදින් දොරට පහර දෙන හඬ ඇසිණි. සැබැවින්ම රොජර් එවැන්නක් අපේක්ෂාවෙන් සිටියේය. මැකල්ටන්හි සැරයන්වරයෙක් කුටියේ දොරකඩ සිටියේය.

> රොජර්,
>
> පෙද්‍රා, එනම් මළසිරුර හමුවූ දින උදෑසන නිවසින් පිටව් ගිය තම දියණිය මේ වන තුරුත් පෙරළා නිවස වෙත නොපැමිණි බව රෙඩිං හි 243/3 දරණ නිවසේ පදිංචි ජිම් පාකර් මහතා පවසයි. අධිකරණ වෛද්‍ය නිලධාරීවරයාගේ වාර්තාවේ සඳහන් ශරීර ලක්ෂණයන් ද පාකර් මහතාගේ දියණියට මනාව ගැළපෙන බව තහවුරු වේ. රෙඩිං, මැකල්ටන් පෙදෙසට සමීප බැවින් අද දින මධ්‍යාහ්නය එළැඹීමට ප්‍රථම ඔහු ඔබ හමුවට පැමිණෙනු ඇත. ඇතැම් විට මෘත ශරීරය හඳුනා ගැනීමට ඔහුට හැකිවනු ඇත.
>
> ලන්ඩනය



විදුලි පණිවුඩය කියවා නිම කළ රොජර් ඉයන්ගේ කුටිය දෙසට හැරිණි. ඒ වන විට ඔහු අවදි වී සිටියේය. විදුලි පණිවුඩය දුටු ඉයන් රොජර් දෙස බැලුවේ විශ්මයෙන් පුළුල් වූ දෙනෙතිනි.

සැබැවින්ම ඝාතනයට ලක්ව ඇත්තේ පාකර් නැමැත්තාගේ දියණිය ද? නොඑසේ නම් ඝාතනයට ලක් වූයේ වෙනත් තැනැත්තියක්ද? යන්න රොජර්ට වටහා ගත නොහැකි විය. කෙසේ වෙතත් රෙඩිං හි පාකර් නම් තැනැත්තා පැමිණි පසු එය නිරාකරණය කරගත හැකි වනු ඇත. යළි සිය කුටියට පිවිසි රොජර් යහනේ වැතිරී මෙම මිනී මැරුම් හා සම්බන්ධ සිදුවීම් මාලාව පිළිබඳ තමාට අසන්නට දකින්නට ලැබුණු කරුණු මනසින් විශ්ලේෂණය කර බැලුවේය. අගක් මුලක් නොමැති හුදු ස්වායත්ත සිදුවීම් මාලාවක් ලෙස පෙනුණ ද ඒවා එකිනෙක යා කළ හැකි ශක්තිමත් හුයක් කෙදිනක හෝ තමාට හමුවනු ඇතැයි ඔහුට සිතිණි.

kathapothak.blogspot.com

kathapothak.blogspot.com

# පාකර්ගේ කතාන්දරය

පෙරවරු දහය පමණ වන විට හිරු හොඳින් පායා දෙරණ ආලෝකමත් වී තිබිණි.

"මහත්තයා, අන්න මහත්තයව මුණගැහෙන්න කවුද මහත්තයෙක් ඇවිල්ලා පොලිසියෙ මහත්තයෙකුත් එක්ක." තානායමේ සේවකයකු පැවසුවේ ඔවුන් උදෑසන ආහාරය ගෙන අවසන් වනවාත් සමඟයි.

"කවුද දන්නෑ, සමහර විට පාකර් වෙන්න ඉඩ තියෙනවා."

"ඔව්, ඒත් අපි එනකල් මිනිහව පොලිසියෙ නතර කරගෙන ඉන්නෙ නැතුව මේ හදිස්සියෙම මෙහාට එව්වෙ මොකද දන්නෑ?" රොජර් පැවසීය.

ඔවුන් අමුත්තන්ගේ කාමරය වෙත ඇතුළුවන විට පොලිස් සැරයන්වරයෙක් සහ පනස් වැනි වියෙහි පමණ පසුවූ වැදගත් පෙනුමක් තිබූ තැනැත්තෙක් එහි රැඳී සිටිනු දක්නට ලැබිණි.

"රොජර් මහත්තයා... මේ මහත්තයට රොජර් මහත්තයව මුණගැහෙන්න ඕනෙලු." සැරයන්වරයා පැවසීය. ඉන් පසු රොජර්ගේ පූර්ණ අවධානය අමුත්තා වෙත යොමු විය. අතිශය කැළඹීමට පත් ලකුණු ඔහුගේ මුහුණේ රැඳී තිබිණි.

"මේ පාකර් මහත්තයද?" රොජර් විමසීය.



"ඔව්, ඊයෙ පත්තරේ පළවෙලා තිබුණ දැන්වීම දැකලා මම හුඟක් කලබල වුණා මහත්තයා. මගේ දුව පෙරේද ඉඳල ආගිය අතක් නෑ. අර පත්තරේ පළවෙච්ච විස්තරේ තිබුණ ශරීර ලක්ෂණ හැම එකක්ම මගේ දුවට තිබුණා. මම කොහොම විශ්වාස කරන්නද මහත්තයා මගේ දුවට මෙහෙම දෙයක් සිද්ධ වෙයි කියලා... මට එයාව බලන්න ඕනෙ..." පාකර් කුඩා දරුවකු මෙන් හඬා වැළපීමට වූයෙන් ඔහුගේ විලාපය අවසන් වන තුරු බොහෝ වේලාවක් බලා සිටීමට රොජර්ට සිදු විය.

"පාකර් මහත්තයා, තවම මෘත ශරීරාගාරය පැත්තෙ ගියෙ නැද්ද?" ඉයන් විමසීය.

"නෑ. මට ලන්ඩනයෙන් දනුම් දුන්නා වහාම මැකල්වන් පොලීසියට යන්න කියලා." පාකර් පැවසීය.

"රොජර් මහත්තයා, අපේ හෙල්ගසන් මහත්තයා ඒ වෙලාවෙ බංගලාවෙ ඉඳලා පොලිසියට ඇවිත් තිබුණෙ නෑ. ඉතින් ඒ නිසයි මම රොජර් මහත්තයා ළඟට එක්කරන් ආවේ." සැරයන්වරයා පැවසීය.

"පාකර් මහත්තයා හිත කලබල කරගන්න එපා. අපි යමු මෘත ශරීරාගාරයට. කිසි දෙයක් තවම හරි හැටි ඔප්පුවෙලා නැහෙ. ඒ නිසා බලාපොරොත්තු අත්හැර ගන්න එපා." රොජර් පැවසුවේ පාකර්ගේ සිතට සහනයක් ගෙන දීමට සිතාය.

මෘත ශරීරාගාරය පිහිටියේ තානායමට සැතපුම් භාගයක් පමණ දුරිනි. කුලී රියක නැඟී ඔවුහු එහි ළඟා වූහ. අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා හමු වූ රොජර් ඉන් පසු පාකර් මහතා මෘත ශරීරාගාරයට කැඳවාගෙන ගියේය. මළ සිරුර දුටු පාකර් කපා හෙළූ ගසක් මෙන් ඇද වැටුණේය. ඔහුට එම පිළිකුල් සහගත දසුන ඉවසා දරාගත නොහැකි වන්නට ඇත. එහෙයින් ඔහුව ඔසවා මෘත ශරීරාගාරයෙන් ඉවතට ගෙන යෑමට සිදු විය. ඔහු යළි පියවි සිහිය ලැබුවේ මිනිත්තු කිහිපයකට පසුවයි. තමා වටා රැස්වී

සිටි රොජර්, ඉයන් ඇතුළු නිලධාරීන් දෙස මඳ වේලාවක් බලා සිටි ඔහු දෑතින් මුහුණ වසා ගත්තේය.

පාකර් මහත්තයා, මේ ප්‍රශ්නෙ අහන එකෙන් මහත්තයාගෙ හිත රිදුණොත් මට සමාවෙන්න... මහත්තයගෙ දුව කැමිලාගෙයි, මේ මළ සිරුරෙයි සමානකමක් තියෙනවද?" රොජර් විමසීය. මුහුණෙන් දෑත ඉවත් නොකළ ඔහු සිය හිස ඉහළ පහළ සැලුවේය.

"ඒ කියන්නෙ පාකර් මහත්තයාට හිතෙන්නෙත් මේ කැමිලමයි කියලද?"

"ඔව්... මේ... කැමිලම... තමයි" පාකර් ගොත ගැසුවේය.

"හිස, අත පය මේ කිසිදෙයක් නැතුව පාකර් කොහොමද කියන්නෙ මේ තමන්ගෙ දුවමයි කියලා" අධිකරණ වෛද්‍ය නිලධාරියා හරස් ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය.

"අර දකුණු උරහිසේ තියෙන උපන් ලප දෙකෙන්... ඒක මම කොහොම ඉවසන්නද මහත්තයා..." ඔහු නැවත කුඩා දරුවකු මෙන් හඬා වැළපීමට වූයෙන් කතාබහ එතැනින් නිමා කිරීමට සිදුවිය. එහෙත් මේ සම්බන්ධයෙන් ඔහුගෙන් කටඋත්තරයක් ගැනීමේ අවශ්‍යතාව රොජර්ට තිබිණි. එය තවත් ප්‍රමාදවීම පිළිබඳ ඔහුගේ සිතේ කැමැත්තක් නොතිබිණි.

"පාකර් මහත්තයාට මේ සම්බන්ධයෙන් කාව හරි සැකද?" රොජර් විමසුවේ කුලී රියක නැගී මෘත ශරීරාගාරයේ සිට පොලිස් මූලස්ථානය වෙත පැමිණෙන අතරයි.

"ඔව්, මහත්තයා මම ඒ හැම දෙයක් ගැනම කියන්නම්. ඒත් මහත්තයා මට පොරොන්දු වෙනවද මිනීමරුවව එල්ලුම්ගස් යවනවා කියලා?" ඔහු පැවසුවේ බැගෑපත් ලෙසයි.

"ඔව්, ඒක අපේ වගකීමක්!" ඉයන් පැවසීය.

ජ ජ ජ



kathapothak.blogspot.com

## මිනීමරුවාගේ මීළඟ ඉලක්කය

පාකර් ඇතුළු පිරිස රැගත් කුලී රිය පොලිස් මූලස්ථානය වෙත ළඟා වන විට පෙරවරු අටට ආසන්න වී තිබිණි. එහෙත් ඉතා අවාසනාවන්ත ලෙස පාකර්ගේ තත්ත්වය නරක අතට හැරිණි. නගරයෙන් පිටත යෙදී තිබූ වැඩ රාජකාරි කිහිපයක් හේතුවෙන්, තමා පොලිස් මූලස්ථානය වෙත ළඟා වන විට පෙරවරු එකොළහ පමණ වේ යැයි හෙල්ගසන් ද දුරකථන ඇමතුමකින් දන්වා තිබිණි.

කුලී රියෙන් බසින ලද මොහොතේ පටන් පාකර් උන්මත්තකයකු මෙන් යම් යම් දෑ තමාටම මුමුණ ගන්නට විය. එමෙන්ම හිටි හැටියේ සිය දෙඩවිල්ල නැවැත්වූ ඔහු සැමගේ හදවත් කම්පා කරමින් හඬා වැළපෙන්නට වූයේය. මෙය තවදුරටත් බලා සිටිය නොහැකි වූයෙන් ඔහුව රෝහල් ගත කිරීම සුදුසු යැයි තීරණය කළේය. අවසානයේ එම කුලී රියෙන්ම සැරයන්වරයකු සමඟ ඔහුව රෝහල වෙත පිටත් කර හරින ලදී.

"හෙල්ගසන් නැති එකෙන් වෙන්නෙ, පරීක්ෂණය තවත් පැය කිහිපයකින් හරි ප්‍රමාද වෙන එක විතරයි." ඉයන් පැවසුවේ සිගිවිකල් වූ පාකර් රැගත් කුලී රිය ඈත නොපෙනී යන විටයි.

"හෙල්ගසන් නෑ කියලා අපි ප්‍රමාද වෙන්න ඕනෙ නෑ." රොජර් පැවසුවේ තීරණාත්මක ලෙසයි.

"පාකර් උන්මත්තකයෙක් වුණොත් අපේ පරීක්ෂණ ඉදිරියට ගෙනියන එක එච්චර ලේසි වෙන එකක් නෑ." ඉයන් පැවසීය.

"මමත් මේ කල්පනා කළේ ඒ ගැන තමයි. අපිට දන්වල එවල තිබුණු විදියට පාකර්ගෙ පවුලෙ හිටියෙ පාකරුයි මැරුණු කැමිලයි විතරයි. පාකර්ගෙ සිහි විකල් වුණොත් ඒක මහ අවාසනාවන්ත දෙයක්." රොජර් පැවසීය.

දෙපැයක් ගත විණි. වේගයෙන් පැමිණි කුලී අස් රියක් පොලිස් මූලස්ථානයේ දොරටුව ඉදිරිපස නතර විය. ඉන් ඉවතට බැස ගත් තැනැත්තාගේ මුහුණේ භීතියට හා කම්පනයට පත් ලකුණු රැඳී තිබිණි. සැබවින්ම ඔහු රෝහලේ සිට පැමිණි පණිවුඩකරුවකු විය.

"මහත්තයා, දැන් විකකට කලින් ඉස්පිරිතාලෙට ගෙනාපු මහත්තයව මරල දාලා. මට ඉක්මනට පොලිසියට පණිවුඩේ දෙන්න කියලා කිව්වා." ඔහු පැවසුවේ හති දමමිනි.

"මොනවා! පාකර්ව මරල දාලා?" ඉයන්ගේ දෙනෙත විශ්මයෙන් පුළුල් විණි. මෙම පණිවුඩය අසා රොජර් ද විස්මයට පත් වූයේය.

"කොහොමද ඒක සිද්ධවෙලා තියෙන්නෙ?"

"මමත් වැඩි විස්තරයක් දන්නෑ, මහත්තයා. වෙඩි තැබීමක් කියල විතරයි මම දන්නෙ." ඔහු පැවසීය.

"යමු, අපි එනවා ඔහේත් එක්ක." රොජර් පැවසුවේය. ඉයන් සහ තවත් සැරයන්වරයකු රොජර් හා එක් වූහ. ඔවුන් රෝහල වෙත ළඟා වන විට විශාල පිරිසක් එහි රැස්වී සිටිනු පෙනිණි. පාකර් මහතා ඝාතනයට ලක්ව තිබුණේ ඔහු රඳවා සිටි වාට්ටුවේ යහන මතදීමය. වාට්ටුවේ දොරටුව අසල තිබූ යහන මත වූ පාකර්ගේ





සිරුර සුදු පැහැ රෙදි කඩකින් වසා තිබිණි. පොලිස් නිලධාරීන් එහි පැමිණි පසු අවට රැස්වී සිටි පිරිස විසිර ගියහ.

ඝාතනයට රිවෝල්වරයක් යොදාගෙන තිබූ බව වටහා ගැනීම අපහසු නොවීය. පාකර් මහතාගේ නළලෙහි සහ හිස් මුදුනෙහි රිවෝල්වර් උණ්ඩ හේතුවෙන් ඇති වූ තුවාල දක්නට ලැබිණි.

"මේ මහ දවාලෙ මෙහෙම දෙයක් සිද්ධ වෙද්දි කවුරුවත් දැක්කෙ නැද්ද?" ඉයන් විමසුවේ වාට්ටුව භාරව සිටි වෛද්‍යවරියගෙනි.

"මේක සිද්ධවෙන වෙලාවෙ මම වාට්ටුවෙ හිටියෙ නෑ. මේක සාමාන්‍යයෙන් ලෙඩ්ඩු බලන්න මිනිස්සු එන වෙලාවක් නෙවෙයිනෙ මහත්තයා... අන්න ඒකයි විශේෂත්වය. සාමාන්‍යයෙන් ලෙඩ්ඩු බලන්න අවසර තියෙන්නෙ දවල් දොළහත් එකත් අතර විතරයි." වෛද්‍යවරිය පැවසුවාය.

"මිනී මැරුමම සිද්ධ වුණේ කීයටද?"

"මට මතක විදියට ඒ වෙනකොට වෙලාව දවල් එකහමාරයි." හෙදියක් පැවසුවාය.

"ඒ කියන්නෙ මිනීමරුවා පැය භාගයක් තිස්සෙ ඉස්පිරිතාලෙ ඇතුළෙ හැංගිලා ඉඳලා තියෙනවා."

"ඔව්. මට හිතෙන්නෙ වෙන්න පුළුවන් එකම දේ ඒක තමයි මහත්තයා. මොකද දවල් එකෙන් පස්සෙ පිටස්තර කිසිකෙනෙක්ට ඉස්පිරිතාලෙට ඇතුළු වෙන්න දෙන්නෑ. අවසර දුන්නොත් ඒ වෛද්‍යවරයෙක්, හෙදියක් වගේ ඉස්පිරිතාලෙ කාර්ය මණ්ඩලයෙ කෙනෙක්ට විතරයි. එහෙමත් නැත්නම් විශේෂ අවසරයක් තියෙන පොලිස් නිලධාරියෙකුට හරි රජයේ නිලධාරියෙකුට හරි විතරයි අවසර තියෙන්නේ." හෙදිය පැවසුවාය.

"ඒ කියන්නෙ මේ සිද්ධිය වෙන වෙලාවෙ ලෙඩ්ඩුන්ට අමතරව වාට්ටුවෙ වෙන කිසි කෙනෙක් හිටියෙ නෑ කියලද?" රොජර් විමසීය.

"ඔව්. හිටියෙ මමයි වික්ටර් කියන සුළු සේවකයයි විතරයි." හෙදිය පිළිතුරු දුන්නාය.

"මේ අපරාධෙ සිද්ධවෙනවා කවුරුහරි දැක්කද?"

"මහත්තයා, මම දැක්කා!" රෝහලේ සුළු සේවකයකු ඉදිරියට පැමිණියේය.

ජ ජ ජ

kathapothak.blogspot.com



# සුළු සේවකයාගේ සාක්ෂිය

"කියන්න. ඒ වෙලාවෙ මෙතන මොකක්ද සිද්ධ වුණේ?"

"මහත්තයා, මේ කියන වෙලාවෙ ලෙඩ්ඩුන්ට අමතරව වාට්ටුවෙ හිටියෙ ෆ්ලෝරා නෝනයි මමයි විතරයි. ෆ්ලෝරා නෝනා හිටියෙ අන්න අර මේසෙ ළඟ තියෙන පුටුවෙ වාඩිවෙලා. මම හිටියෙ වාට්ටුව අතුගාමින්... ඒත් මේ වෙලාවේ මම හිටියෙ මේ පැත්තට පිටුපාලා. එකපාරට වෙඩි හඬක් ඇහිලා මම තිගැස්සුනා. මට ඒ පැත්තට හැරෙන්න නෙවෙයි ඇහි පිල්ලම් ගහන්නවත් වෙලාවක් ලැබුණෙ නෑ. තවත් වෙඩිල්ලක් පත්තුවුණා. මම ඒ පැත්තට හැරෙද්දි හැඩි දැඩි මිනිහෙක් පාකර් මහත්තයගෙ ඇඳ ළඟ හිටගෙන ඉන්නවා පෙනුනා. මම එක අඩියයි ඉස්සරහට තිබ්බෙ. මිනීමරුවා මගේ පැත්තට හැරුණා. ඒ විතරක් නෙවෙයි. අර රිවෝල්වරය මගේ පැත්තට ඉලක්ක කරා. මූණෙ කළුපාට රෙදි කඩක් බැඳලා තිබුණ නිසා මට ඌව හඳුනගන්න බැරි වුණා. ඒ වෙලාවෙ මම හිතුවෙ ඌ මටත් වෙඩි තියයි කියලයි." වික්ටර් නම් වූ එම සුළු සේවකයා පැවසීය.

"ඒ කියන්නෙ ආයෙත් දැක්කට ඒ මිනීමරුවව හඳුනගන්න බෑ?" රොජර් හරස් ප්‍රශ්නයක් නැඟීය.

"ඔව්, මට හඳුනගන්න බෑ මහත්තයා. ඒත් මට මිනීමරුවගෙ ශරීර ලක්ෂණ හොඳට මතකයි. අඩි හයකට වැඩිය උසයි. ඒ වගේම

උසට ගැලපෙන විදියෙ මහතක් තිබුණා. කොණ්ඩෙ අළු පාටට හුරුයි. ශක්තිමත් මිනිහෙක්." ඔහු පැවසීය.

"ඇඳුම් පැළඳුම් මොන වගේද?"

"කලිසමයි, කමිසයයි, පිට කබායයි කළු පාටයි. ඒ කියන්නෙ මුළු ඇඳුමම කළු පාටයි."

"හොඳයි, ඊට පස්සෙ මොකක්ද සිද්ධ වුණේ?" රොජර් විමසීය.

"ඇත්තමයි, ඒ වෙලාවෙ මගේ ඇගේ ලේ වතුර වුණා මහත්තයා. මම අත් දෙකෙන් මගේ මූණ වහගත්තා. මම හිතුවෙ ඌ මට වෙඩි තිබ්බා කියලයි. මම ඇස් ඇරියෙ තත්පර දහයකට විතර පස්සෙ. එතකොට මිනිමරුවා වාට්ටුවෙන් සම්පූර්ණයෙන්ම අතුරුදන්වෙලා ඉවරයි. මම ගිහින් බැලුවා පාකර් මහත්තයා වෙනුවෙන් මොනවද කරන්න ඉතිරිවෙලා තියෙන්නෙ කියලා. ඒත් වැඩක් වුණේ නෑ. ඒ වෙනකොටත් පාකර් මහත්තයාගෙ හුස්ම ටික ගිහින්." එසේ පවසා ඔහු නිහඬ විය.

"ෆ්ලෝරා නෝනා..." රොජර් මීළඟට හැරුණේ තරුණ හෙදිය වෙතයි." මේ සිද්ධිය ගැන මොකක්ද කියන්න තියෙන්නෙ?"

"වික්ටර් දැක්ක දේම තමයි මමත් දැක්කෙ මහත්තයා. මහත්තයට පේනවනෙ මිනීමැරුම සිද්ධ වුණ තැනට මගේ මේසෙ ළඟ ඉඳල අඩි දෙසීයක් විතර දුරයි. ඇත්තටම මම ඒ වෙලාවෙ හිටියෙ වෙන කල්පනාවක. මිනීමරුවා වාට්ටුවට ඇතුළු වුණ බවක් මම දැක්කෙ නෑ. එහෙනම් තත්ත්වය මීට වඩා වෙනස් වෙනවා. මේ වාට්ටුවෙ ඉන්නෙ සැත්කම් වලින් සුවය ලබමින් ඉන්න ලෙඩ්ඩු. බොහෝ දුරට ඒ වගේ ලෙඩ්ඩු ඉන්නෙ නිදාගෙන. ඒ නිසා ඒ කාටවත් මේ මිනීමැරුම ගැන අවබෝධයක් නෑ. වාට්ටුවට ඇතුළු වෙන තැනම තියෙන ඇඳන් දෙක හිස්වෙලා තිබුණ නිසා වැඩි





පහසුවටයි පාකර් මහත්තයව මේ වාට්ටුවෙ නතර කළේ. මේක හොඳට සැලසුම් කරලා සිදු කරපු මරණයක්!" ඈය පැවසුවාය.

"ඔව්, ඒ ගැන කිසි සැකයක් නෑ. මේක සූක්ෂ්ම විධියට සැලසුම් කරල කරපු වැඩක්." රොජර් පැවසීය. ඉන් අනතුරුව රෝහලේ කාර්ය මණ්ඩලයේ තවත් කිහිපදෙනෙකුගෙන් ප්‍රශ්න කළ රොජර් අවසාන වරට එහි කැඳවූයේ රෝහලේ ප්‍රධාන ගේට්ටුව භාරව සිටි ආරක්ෂක නිලධාරියාය.

"මේ මිනීමරුවගෙ හැඩහුරුකම් තියෙන කවුරුහරි ගේට්ටුවෙන් ඇතුළු වුණ බව තමුන්ට මතකද?" රොජර් විමසීය. මිනිත්තුවක පමණ කාලයක් කල්පනාවේ නිමග්නව සිටි ආරක්ෂක නිලධාරියා සිය හඬ අවදි කළේය.

"ඔය කියන විධියෙ කිහිපදෙනෙක්ම අද දවල් දොළහත් එකත් අතර ගේට්ටුවෙන් ඇතුළු වුණා මහත්තයා. ඒත් ගේට්ටුව හරහා එහාට මෙහාට යන සිය ගණනක් සෙනඟ අතරෙ ඒ අයගෙ මූණු මට මතක හිටියෙ නෑ මහත්තයා." ඔහු පැවසීය.

"හොඳයි, දවල් එකට පස්සෙ මේ ගේට්ටුවෙන් පිටවෙලා ගියේ කවුද කියලා හොඳට මතක් කරලා බලන්න. විශේෂයෙන් කළු පාට ඇඳුම් ඇඳගත්ත, මේ වගේ දවැන්ත පෙනුමක් තියෙන මනුස්සයෙක්ව මග ඇරෙන්න විධියක් නෑ." රොජර් පැවසීය.

මද වේලාවක් කල්පනාවේ නිමග්නව සිටි ඔහු හිස දෙපසට සැලුවේ එවැන්නෙක් පිටවී යනු තමා නොදුටු බව පවසන්නාක් මෙනි.

"තමුන් කියන්නෙ මේ වගේ පෙනුමක් තියෙන කිසි කෙනෙක් දවල් එකෙන් පස්සෙ ප්‍රධාන ගේට්ටුවෙන් පිටවෙලා ගියේ නෑ කියලද?"

"ඔව්, ඒක මට විශ්වාසයි මහත්තයා. දවල් එකෙන් පස්සෙ කළු කබා කමිස හැඳගත්ත කිසි කෙනෙක් ගේට්ටුවෙන් එළියට ගියේ නෑ."

"හොඳයි, ඒකත් එහෙමද?... ඔව් සමහර විට එහෙම දෙයක් වෙන්නත් බැරි නෑ." රොජර් පැවසුවේ ඉයන් දෙස බලමිනි.

"ඒ කිව්වෙ, මොන වගේ දෙයක්ද?" ඉයන් විමසීය.

"නෑ, මේක මගේ හිතේ ඇතිවුණු සැකයක් විතරයි.... සමහර විට මිනීමරුවා ගේට්ටුවෙන් පිට වුණේ වෙනත් ඇඳුමකින්."

"ඒ කියන්නෙ මිනීමරුවා මිනීමැරුම සිද්ධ කළාට පස්සෙ ඇඳුම් මාරුකර ගත්තා කියන එකද?"

"ඔව්. මට හිතෙන්නෙ මිනීමරුවා ගේට්ටුවෙන් ඇතුළු වුණ ඇඳුමෙන්ම තමයි පිටවෙලා ගියේ. ඒත් මිනීමැරුම සිද්ධ කළේ කළු පාට ඇඳුමක් ඇඳන්." රොජර් පැවසීය. ඉයන් සිය දෙවුර හැකිළුවේ තමාට එය වටහා ගැනීමට අපහසු බව පවසන්නාක් මෙනි.

ජ ජ ජ



kathapothak.blogspot.com

## සෝදිසි කිරීමක්

ඉන් අනතුරුව වාට්ටුවෙන් පිටත භූමිය ඉතා සූක්ෂ්ම ලෙස පරීක්ෂා කිරීමට ඔවුහු තීරණය කළහ. ප්‍රථමයෙන් වාට්ටුවේ දොරටුවේ සිට උද්‍යාන පථය දක්වා විහිදී තිබූ පැසේජය ඔවුන්ගේ පරීක්ෂාවට ලක් විය. එහෙත් සැකකටයුතු යමක් සොයා ගැනීමට නොහැකි විය. ඉන් පසු රොජර්ගේ අවදානයට ලක් වූයේ එම පැසේජයට යාර කිහිපයක් දුරින් පිහිටි පොදු වැසිකිළියයි. සැමගේ දෙනෙත් විශ්මයෙන් පුළුල් කරමින් එහි අඳුරු මුල්ලක තිබී කළු පැහැ කබායක් සහ කලිසමක් සොයාගත හැකි විය.

"බොහොම පැහැදිලියි මෙතන මොකක්ද සිද්ධ වුණේ කියලා." ඉයන් පැවසීය.

"ඔව් මිනීමරුවා ඇඳුම් මාරු කළේ මෙතනදි." රොජර් පැවසීය.

කළු පැහැ කලිසම සහ පිට කබාය හමුවීමත් සමගම මිනීමරුවා නීතියේ රැහැණට හසු කර ගැනීම පිළිබඳ සැමගේ හදවත් තුළ බලාපොරොත්තු ඇති විය. කලිසම සහ කබාය සොයා ගැනුන ද රොජර්ගේ පරීක්ෂාව එතැකින් නිමා නොවීය. ලත්තැරුමක් දල්වාගත් ඔහු අඳුරු අහුමුළු සියල්ලක්ම පරීක්ෂාවට ලක් කළේය. එහෙත් කබායට සහ කලිසමට අමතරව වෙනත් කිසිවක් සොයාගත නොහැකි විය.

"ඉයන්, මේ කලිසමෙනුයි කබායෙනුයි නම් මිනීමරුව ගැන කිසිම හෝඩුවාවක් හොයා ගන්න විධියක් නෑ." රොජර් පැවසුවේ වෛද්‍යවරියගේ කුටිය තුළදී එය පරීක්ෂා කර බැලීමෙන් අනතුරුවයි. එය ඇසෙත්ම ඉයන්ගේ මුවින් අසතුටට පත් හඬක් නික්මිනි.

"මෙවා මිනීමරුවා කාලයක් තිස්සෙ පාවිච්චි කරපුව නෙවෙයි. මේ මිනීමැරුම කරන්නම හිතාගෙන තමයි මේ ඇඳුම් මිලදී ගන්න ඇත්තෙ. බොහෝ දුරට ඒ අද උදේ. එහෙමත් නැත්නම් ඊයෙ දවස ඇතුළත.බලන්න... මේ ඇඳුම්වල අලුත් සුවඳ තවම රැඳිලා තියෙනවා. කොහොම වුණත් මේ පැත්තෙ ඇඳුම් සාප්පු වලට ගිහින් ටිකක් සෝදිසි කරලා බලන්න වෙයි. මේ ඇඳුම් මිලදී ගත්තෙ කවුද කියන එක ගැන,සැකයක් නෑ.. මට විශ්වාසයි... මිනීමරුවා එතනදිත් තමන්ව හඳුන ගන්න බැරිවෙන විධියෙ මොකක්හරි ප්‍රයෝගයක් කරන්න ඇති. මේ සැරේ අපිට හැප්පෙන්න වෙලා තියෙන්නෙ අංක එකේ කෛරාටිකයෙක් එක්ක. දිගින් දිගටම ඒක ඔප්පු වෙනවා.

ඡ ඡ ඡ

kathapothak.blogspot.com

# නැවත පොලිස් මූලස්ථානය වෙත

ඔවුන් නැවත මැකල්ටන් පොලිස් මූලස්ථානය වෙත ළඟා වන විට හෙල්ගසන් පැමිණ සිටියේය. "රොජර්, මේ මිනීමරුවා නම් මහ පුදුමාකාර යක්ෂයෙක්. ඌට විරුද්ධව සාක්ෂි දෙන්න හිටියෙ එකම එක මිනිහයි. ඌ ඒ මිනිහවත් මැරුවා. ඒකෙන් හිතාගන්න පුළුවන්නෙ මිනීමරුවා මොනතරම් සූක්ෂ්ම විධියට වැඩ කරන කෙනෙක් ද කියලා."

"ඔව්, දෙනෝදාහක් මිනිස්සු ගැවසෙන ඉස්පිරිතාලෙදී, මහ දවල් මිනිහෙක්ට වෙඩි තියලා, කාටවත් නොදැනෙන්න එතනින් පැනගන්න එක ලේසි පහසු වැඩක් නෙවෙයි." රොජර් පැවසීය. රෝහලේ වැසිකිලියේ තිබී සොයාගත් කළු පැහැ කලිසම සහ කබාය මේසය මත තැබූ රොජර් හෙල්ගසන්ගේ අවධානය ඒ වෙත යොමු කළේය.

හෙල්ගසන් එය පරීක්ෂා කර බැලුව ද රොජර් සොයාගත් කරුණුවලට වැඩිමනක් යමක් සොයා ගැනීමට ඔහුට ද අපහසු විය.

"මේකෙන් නම් මොනවත්ම හොයා ගන්න බෑ රොජර්" හෙල්ගසන් පැවසීය.

"ඔව්, ඒත් අපි ටිකක් උත්සාහ කරලා බලමු." රොජර් පැවසුවේ [illegible] හෙල්ගසන් අස්වසමිනි.

"පාකර්ගෙ මරණෙ ගැන ඥාතීන්ට දැනුම් දෙන්න ඉයන්. මම හිතන්නෙ පාකර්ගෙ පවුලෙ වෙන කවුරුවත් නෑ. ඒ නිසා අනිත් ඥාතීන් ගැන හොයලා බලලා ඒ අයට පාකර්ගෙයි කැමිලගෙයි මරණ ගැන දැනුම් දෙන්න." සැරයන්වරයකු කැඳවූ හෙල්ගසන් ඔහුට විධානය කළේය.

"හෙල්ගසන්, අර කලිසමයි කබායයි ගැන තව ටිකක් සෝදිසි කරලා බැලුවොත් හොඳයි." රොජර් පැවසීය.

"ඔව් රොජර්ටයි, මටයි, ඉයන්ටයි ඒ වැඩේ කරන්න පුළුවන්. දැන් හවස් වෙලා වැඩී. අපි හෙට උදෙන්ම වැඩ පටන්ගමු." හෙල්ගසන් පැවසුවේ බිත්ති ඔරලෝසුව දෙස බලමිනි. වේලාව පස්වරු හතරට ආසන්න වී තිබිණි. එහෙයින් රොජර්, හෙල්ගසන්ගේ යෝජනාවට එකඟ විය.

හිරු බැස ගොස් ක්‍රමයෙන් අවට පරිසරය අඳුරු වන්නට වූයේය. පොලිස් මූලස්ථානයෙන් පිටවූ රොජර් තානායම වෙත පියමන් කළේය. ඒ මොහොතේ අන් කවරදාකවත් සිදු නොවූ ආකාරයට ඔහුගේ සිත බෙහෙවින් සලිත වී තිබිණි. මෙම මිනීමරුවා කිසි දිනක තමාගේ ග්‍රහණයට හසුකර ගත නොහැකි වේදෝ යන සැකය ක්‍රමයෙන් ඔහුගේ සිතට දැනෙන්නට විය. තානායමට පැමිණි ඔහු ගමන් ගත්තේ සිය කුටිය තුළටයි. ඝන අඳුරේ වෙළී තිබූ කුටියේ හුදකලා වූ පසු මෙම අමානුෂික මිනීමරුවා පිළිබඳ අපූර්ව සිතිවිලි සමුදායක් රොජර්ගේ මනසට නැඟිණි. විකෘති වූ මනසක් ඇති මෙම මිනීමරුවා අයෝමය ශක්තියකින් යුත් දේහයක් සහ සූක්ෂ්ම ඥානයකින් යුත් මොළයක් සහිත තැනැත්තෙක් බව දැන් තහවුරු වී ඇත. එමෙන්ම ආරෝග්‍ය ශාලාව තුළදී පාකර් මහතාව මරා දැමීමෙන් ඔහු ඒ බව ලොවට තව තවත් පහදා දී ඇත. පාකර්ගේ මරණය සිදුකිරීමේ අරමුණ කුමක් දැයි වටහා ගැනීම අපහසු නැත. නියත වශයෙන්ම පාකර් මිනීමරුවා පිළිබඳ දැන සිටින්නට ඇත. නොඑසේ නම් තමා පිළිබඳ පාකර් දැන සිටින්නේ



යැයි මිනීමරුවා සැක සිතන්නට ඇත. තම අනන්‍යතාව තව දුරටත් ලොවට සඟවා තබා ගැනීමේ අරමුණින් මිනීමරුවා විසින් පාකර්ගේ ඝාතනය සිදු කරන්නට ඇත.

"ඉයන්, මගේ හිතට හරි නෑ... අපිට පාකර්ගෙ ජීවිතේ බේරගන්න බැරි වුණා. මට විශ්වාසයි, මිනීමරුව ගැන පාකර් දැනන් හිටියා. ඒත් ඒක අපිට කියන්න මිනීමරුවා ඉඩ තිබ්බෙ නෑ. ඉයන්, අන්න ඒ නිසා අද රෑම කළ යුතු වැඩක් තියෙනවා."

"මොකක් ගැන ද රොජර් කියන්නෙ?"

"අපි දැන් යන්න ඕනෙ පාකර්ගෙ ගෙදර."

"දැන්... දැන් වෙලාව නවයටත් ළඟයිනෙ!" ඉයන් පැවසීය.

"කරන්න දෙයක් නෑ. අද රෑ නිදිමරණ එක අපතෙ යන එකක් නෑ." රොජර් පැවසීය.

"කැමැත්තක්. අර කළු කමිසයයි කලිසමයි ගැන සෝදිසි කරන්නැද්ද?"

"ඒක කරගන්න පුළුවන් ඉයන්. අපි නොහිටියත් හෙල්ගසන් ඒ වැඩේ හරියටම කරයි!" රොජර් පැවසුවේය.

"ඒ වුණාට රොජර්, ඒ කලිසමයි කමිසයයි ගැන සෝදිසි කරන එක අපි දෙන්නම කළොත් නේද හොඳ?" ඉයන් පැවසීය.

"ඔව්, අනිවාර්යයෙන්ම ඒක අපිම කරන එක තමයි හොඳ. ඒත් මට හිතෙනවා පාකර්ගෙ ගෙයි සෝදිසි කරන එක ඊට වඩා වැදගත් කියලා. ඉයන්ට එහෙම හිතෙන් නැද්ද?" රොජර් විමසීය. ඉයන් සිය දෙවුර හැකිළුවේ තමාට එය වටහා ගැනීමට අපහසු බව පවසන්නාක් මෙනි.

* * *

kathapothak.blogspot.com

# පාකර්ගේ නිවස

කුලී කරත්තයක් සොයාගත් ඔවුහු රෙඩිං හි පාකර් මහතාගේ නිවස බලා ගමන් ඇරඹිය. ඊට ප්‍රථමයෙන් මදකට පොලිස් මූලස්ථානය වෙත ගමන් කිරීමට රොජර්ට අවශ්‍ය විය.

"ඉයන් අපි හෙල්ගසන්ව මුණගැහිලා මේ ගැන කියල යමු. පාකර්ගෙ ඥාතීන්ට මරණ ගැන දැනුම් දුන්නද දන්නෑ නේද?" රොජර් විමසීය.

"මම හිතන්නෙ, ඒ ගැන ඥාතීන්ට දැනුම් දෙන්න ඇති." ඉයන් පැවසීය.

ඔවුන් පොලිස් මූලස්ථානය වෙත ළඟා වන විට හෙල්ගසන් එහි නොසිටියේය.

"හෙල්ගසන් මහත්තයා කොහෙද ගියේ?" රොජර් විමසුවේ මැකල්වත්හි උප පොලිස් පරීක්ෂකගෙනි.

"බංගලාවට ගිහින් එන්න කියලා ගියා. දැන් මිනිත්තු විස්සක් තිහක් විතර වෙනවා පිටත්වෙලා. තව විකකින් එයි." ඔහු පිළිතුරු දුන්නේය.

"මේ ළඟද බංගලාව තියෙන්නෙ?" රොජර් විමසීය.

"ඔව්, වැඩි ඈතක නෙවෙයි. වැඩිම වුණොත් මෙතන ඉඳලා හැතැප්ම එකහමාරක් ඇති."





"කමක් නෑ. හෙල්ගසන්ට කියන්න අපි රෙඩිං වල පාකර් මහත්තයගෙ ගෙදර ගියා කියලා." රොජර් පැවසුවේ කරත්තයට ගොඩ වෙමිනි.

ප්‍රධාන වීථිය ඔස්සේ සැතපුම් අටක පමණ දුරක් ඉදිරියට ගමන් කළ ඔවුහු ඉන් අනතුරුව තවත් අතුරු පාරකට පිවිසී සැතපුම් දෙකක පමණ දුරක් ගමන් කළහ. පාකර්ගේ නිවස වෙත ළඟාවීමට තවත් ගුරු පාරවල් කිහිපයක් ඔස්සේ ද ගමන් කිරීමට සිදු විය.

අවසානයේ ගුරු පාරකට මුහුණලා පිහිටි තරමක් විශාල නිවසක් ඉදිරිපිට රථය නතර කෙරිණි. නිවස පහන් දල්වා ආලෝකමත් කර තිබූ අතර මැදි වියේ පසුවූ තැනැත්තෙකු දොරටුව අභියස සිටිනු දැකගත හැකි විය.

එමෙන්ම රෝද දෙකේ තවත් කුඩා අශ්වරියක් වත්තෙහි නවතා තිබෙනු දක්නට ලැබිණි.

රථයෙන් බැසගත් රොජර් නිවස දෙසට පිය මැන්නේය. ඉයන් ද ඔහුගේ පසු පස ගමන් කළේය. සිවිල් ඇඳුමෙන් සැරසී සිටි බැවින් ඔවුන් ස්කොට්ලන්ඩ්යාඩ්හි පොලිස් නිලධාරීන් යැයි දොර අභියස සිටි තැනැත්තා නොසිතන්නට ඇත.

"මේ මහත්වරු කවුද?" ඔහු විමසුවේ රොජර් සහ ඉයන් ඔහු වෙත සමීප වූ පසුවයි. රොජර් සිය අනන්‍යතාව හෙළි කළේය. ඉන් පසු ඔහුගේ තේජාන්විත බව තුරල් වී බොහෝ යටහත් පහත් බවක් ආරූඪ විය.

"මහත්තයා, මට හඳුනාගන්න බැරි වුණා. මම පාකර්ගෙ ඥාති සහෝදරයෙක්. මගෙ නම ටෝනි පාකර්. පණිවුඩේ ලැබුණු ගමන් මම මෙහේට ආවා. දැන් විකකට කලින්නුත් කවුදෝ මහත්තයෙක් ඇවිත් ගෙයි සෝදිසි කළා." ඔහු පැවසීය. එය ඇසෙන්ම රොජර්ගේ දෙනෙත විශ්මයෙන් පුළුල් විණි.

"මොනවා! මොන මහත්තයද?" රොජර් විමසුවේ වික්ෂිප්තවයි.

"නමක් නං කිව්වෙ නෑ මහත්තයා. ස්කොට්ලන්ඩ්යාඩ් එකෙන් කියල තමයි කිව්වෙ." ඔහු පැවසීය. රොජර්ගේ මුවින් නොසතුටට පත් හඬක් නික්මිණි.

"ටෝනි මහත්මයට මතකද මිනිහ මොන වගේ කෙනෙක් ද කියලා?" රොජර් විමසීය.

"ඔව්. අඩි හයක් විතර උසයි, ඒ වගේම උසට හරියන මහතකුත් තිබුණා. මිලෙන් අධික අලංකාර දුඹුරු පාට ඇඳුම් කට්ටලයකින් සැරසිලයි හිටියෙ. ඒ වුණාට මූහුණෙ තිබුණේ මරුමුස් පෙනුමක් කොණ්ඩෙ බොහෝ දුරට සුදුපාට වෙලා තිබුණෙ. මූහුණ පුරා වැවුණු තැනින් තැන සුදු පැහැ ගැන්වුණු රැවුලක් තිබුණා. කොටින්ම කියනව නම් දැක්කම භය හිතෙන විදියෙ පෙනුමක් තියෙන කෙනෙක්." ඔහු පැවසීය. ඉයන් රොජර් දෙස බලා සිය හිස දෙපසට සැලුවේය. කිසිත් නොපැවසූ රොජර් නිවසට ඇතුළු වූවේය.

"බොහොම කණගාටුයි ටෝනි මහත්මයා, ඒ වගේම අපි හරි අවාසනාවන්තයි. මට හිතෙන විදියට කලින් ඇවිත් තියෙන්නෙ මිනීමරුවා!!"

"මොනවා! මිනීමරුවා?"

"ඔව්. අනිවාර්යයෙන්ම ඒ ඌ තමයි. මිනිහා මොනවද අරන් ගියේ?"

"අනේ මන්ද මහත්තයා. ආපු වෙලාවෙ ඉඳලා කැමිලගෙ කාමරේ හැම අස්සක් මුල්ලක්ම ඇවිස්සුවා. ඊට පස්සෙ ගෙයින් පිටවුණේ ලොකු රෙදි පොට්ටනියක් කරපින්නගෙන. මම ප්‍රශ්න කරන්න ගියේ නෑ මහත්තයා. ස්කොට්ලන්ඩ්යාඩ් එකෙන් කියපු නිසා මම පැත්තකට වෙලා හිටියා. ඒත් පිටත් වෙද්දි මට කිව්වා, මේ



පරීක්ෂණයට අදාළ ලියකියවිලි වගයක් තමාට හොයාගන්න පුළුවන් වුණා. ඒ නිසා ඒවා තමන්ගෙ භාරයට ගන්නවා කියලා."

"පිටත් වුණේ මොකකින්ද?"

"ආවෙත් රෝද දෙකේ විශාල කරත්තෙකින්. පිටත් වුණෙත් ඒකෙන්මයි."

"හොඳට මතක් කරලා බලන්න. කරත්තෙ තව කවුරුහරි හිටියද?"

"නෑ මහත්තයා, කරත්තෙ පැදගෙන ආවෙත් ඒ මනුස්සයමයි. ආවෙ තනියම."

"හොඳයි, අපි කාමරේ සෝදිසි කරලා බලමු." රොජර් පැවසුවේ ඉයන් දෙසට හැරෙමිනි.

"රොජර්, මේ සැරේ නම් අපිට ගනුදෙනු කරන්න වෙලා තියෙන්නෙ පුදුමාකාර කෛරාටිකයෙක් එක්ක."

"ඔව්, මිනිහා අපිට හිතාගන්න බැරි තරම් ඉක්මනින් ක්‍රියාත්මක වෙනවා. ඒ වගේම මිනිහා ඉවෙන් වගේ දන්නවා, තමන්ට විරුද්ධව යොදාගන්න පුළුවන් සාක්ෂි මොනවද කියලා. අන්න ඒක අපිට ලොකු අවාසියක්. මට මීට කලින් මේ තරම් සූක්ෂ්ම විදියට වැඩ කරපු මිනීමරුවෙක් මුණගැහිලා නෑ."

"මට කියන්න තියෙන්නෙත් ඒ ටිකම තමයි." ඉයන් පැවසීය.

ಜ ಜ ಜ

kathapothak.blogspot.com

kathapothak.blogspot.com

# අතුරුදන් වූ සාක්ෂි

ඉන් අනතුරුව රොජර් සහ ඉයන් කැමිලාගේ කුටිය සියුම් ලෙස පරීක්ෂාවට ලක් කළ ද මිනීමැරුමට සුළු වශයෙන් හෝ සම්බන්ධ කළ හැකි ආකාරයේ කිසිදු සාක්ෂියක් සොයාගත නොහැකි විය. මිනීමරුවා ඉතා සියුම් ලෙස කැමිලා සහ තමා අතර පැවති සම්බන්ධතාවය තහවුරු කළ හැකි සියලුම ආකාරයේ දේවල් රැගෙන ගොස් ඇති බව පැහැදිලිවම පෙනිණි. ඒ අතරින් මිනීමරුවාගේ වැඩි අවධානය යොමු වී තිබුණේ කැමිලාගේ පෞද්ගලික අල්මාරිය වෙතයි. ඔහු විසින් එහි තිබූ බොහෝ දෑ රැගෙන ගොස් ඇති බව රොජර් වටහා ගත්තේය.

"ඉයන්, වෙස් වලාගන්න පාවිච්චි කරපු සුදු පැහැ ගැන්වුණ බොරු කොණ්ඩෙයි රැවුලයි ගැන අමතක කළොත් අපිට මිනීමරුවා ගැන පැහැදිලි චිත්‍රයක් මවා ගන්න පුළුවන්."

"ඔව්."

"අඩි හයක් හෝ ඊට වඩා ටිකක් උස, උසට ගැළපෙන මහතක් තියෙන, දක්කම බය හිතෙන විදියෙ යක්ෂයෙක්."

"කොටියෙක් වගේ ශක්තිමත්, නරියෙක් වගේ කෛරාටික සිරිසතෙක්" ඉයන් රොජර්ගේ කතාව ඌනපූර්ණය කළේය.

කැමිලාගේ කුටියෙන් ඉවතට පැමිණි රොජර් මීළඟට පාකර් මහතාගේ කුටිය පරීක්ෂා කළේය. එහි වූයේ පාකර්ගේ පෞද්ගලික





පරිහරණය සඳහා යොදාගත් ඇඳ, ලියන මේසය, පුටුව සහ අල්මාරිය පමණි. රොජර් ඉතා සියුම් ලෙස ඒ සියල්ල පරීක්ෂා කළ ද මෙම ඛේදජනක සිදුවීම හා බැඳුණු කිසිවක් සොයාගත නොහැකි විය.

අවසාන වශයෙන් ඔවුන්ගේ පරීක්ෂාවට ලක් වූයේ පාකර් නිවසේ විසිත්ත කාමරයයි. එහි විසිතුරු අල්මාරිය මත තබා තිබූ නිල් වීදුරුවලින් තනන ලද සිගිවටනයක් වෙත රොජර්ගේ අවධානය යොමු විය. කුරුලු ජෝඩුවක් ආදරෙන් වෙළී ගසක අත්තක් මත වසා සිටින අයුරින් කැටයම් කර තිබූ එම සිහිවටනය දෙස රොජර් මිනිත්තු කිහිපයක් බලා සිටියේය.

'වී. එච්. ගෙන් ආදරණීය කැමිලට' එහි සටහන්ව තිබිණි.

"ඉයන්ට මේ ගැන මොනවද හිතෙන්නෙ?"

"වී. එච් ගෙන් ආදරණීය කැමිලට? කවුද මේ වී. එච්? අන්න ඒක හොයා ගන්න පුළුවන් නම් අනික් හැම ප්‍රශ්නයක්ම විසඳගන්න පුළුවන්" ඉයන් පැවසීය.

මඳ වේලාවක් කල්පනාවේ නිමග්නව සිටි රොජර් සැනසුම් සුසුමක් හෙළුවේය. රොජර් යම් තීරණයකට එළැඹි බව ඉයන් වටහා ගත්තේය.

"ඉයන්, අර කතාවක් තියෙන්නෙ, හැම අඳුරු වලාවකම රිදී රේඛාවක් තියෙනවා කියලා. අන්න ඒ වගේ තමයි කලබලේට මෙක මිනීමරුවගෙ අතින් මගහැරුණා. මට හිතෙන්නෙ මේ ලස්සන කුරුලු ජෝඩුව අපිට හැම දෙයක්ම පැහැදිලි කරලා දෙයි." රොජර් පැවසුයේ එම සිහිවටනය ඉතා ආරක්ෂාකාරී ලෙස රෙදි කඩකින් ඔතමිනි.

ඡ ඡ ඡ

kathapothak.blogspot.com

# මිනීමරුවා පසුපස

ටෝනි පාකර්ට සමු දුන් ඔවුහු නැවත මැකල්ටන් බලා ගමන් ඇරඹූහ.

"බොහොම පැහැදිලියි. කැමිලාගෙ පෙම්වතා එහෙමත් නැත්නම් කාලෙකට කලින් හිටපු පෙම්වතා තමයි මිනීමරුවා." රොජර් පැවසුවේ ගමන් ගන්නා අතරතුරයි.

"ඔව්, මටත් එහෙම හිතෙනවා."

"සමහරවිට මේ මරණයට හේතුව ඒ ප්‍රේම සම්බන්ධෙම වෙන්න ඉඩ තියෙනවා."

"රොජර්, එතකොට අර මීට සති දෙකකට කලින් සිද්ධ වුණ මිනීමැරුම පැහැදිලි කරන්නෙ කොහොමද?

"ඉතින්, මම එදත් කිව්වෙ, ඒක අත්හදා බැලීමක් වෙන්න ඉඩ තියෙනවා කියලා. ඒත් ඒ ගැන සියයට සීයක් විශ්වාසෙ තියන්න බෑ. මට හිතෙන්නෙ, අපිට කැමිලාගෙ මිනීමරුවා කොටුකර ගන්න පුළුවන් වුණොත් අනිත් මිනීමැරුම ගැන හෙළි කර ගන්න එක එතරම් අමාරු වෙන එකක් නෑ."

"කොහොම වුණත් මිනීමරුවා කොටු කර ගන්න එක එච්චර ලේසි වෙන්නෑ... අපිට බැරි ද කැමිලාගෙ පෞද්ගලික ජීවිතේ ගැන තව ටිකක් හොයලා බලන්න. විශේෂයෙන් අපිට පුළුවන් එයා



ආශ්‍රය කළ අනිත් ගැහැනු ළමයින්ගෙන් අහල බලන්න, කැමිලාගෙ පෙම්වතා ගැන විස්තර."

"ඔව්, ඒකත් හොඳ අදහසක් තමයි. ඒත් ඒක ඒ අයගෙ ආරක්ෂාවට හොඳ නෑ. දැක්කනෙ කැමිලාගෙ තාත්තා, පාකර්ට වෙච්ච දේ. මිනීමරුවා තමන්ට විරුද්ධව කට අරින්න කාටවත් ඉඩ දෙන එකක් නෑ. මිනීහට තියෙනවා පුදුමාකාර ඉවක්. කොහොමටත් අපි කැමිලාගෙ යාළුවන්ගෙන් විස්තර අහන්න ඉඩ තියෙනවා කියලා දැනටමත් මිනීමරුවට හිතිලා ඇති. කැමිලා ඒ වගේ සමීපව ඇසුරු කරපු මිතුරු මිතුරියන් හිටියා නම්, ඒ අයගෙ ජීවිත තියෙන්නෙ බොහොම අවදානම් සහගත තත්ත්වයක." රොජර් පැවසීය.

"ඒ අයගෙ ආරක්ෂාවට මොනවත්ම කරන්න විධියක් නැද්ද රොජර්?"

"පුළුවන්, ඒත් ඊට කලින් අපි හොයා ගන්න ඕනෙ කැමිලාව ළඟින් ආශ්‍රය කරපු තවත් ගැහැනු ළමයි හිටිය ද? හිටිය නම් ඒ අය කවුද? කියලා." රොජර් පැවසීය.

"ටෝනි පාකර්ගෙන් අහල බැලුවොත්?"

"වැඩක් වෙන්නෑ, ටෝනි පාකර් ඥාතියෙක් වුණාට කැමිලාගෙ පෞද්ගලික තොරතුරු දැනගෙන හිටියා කියලා හිතන්න අමාරුයි."

❦ ❦ ❦

kathapothak.blogspot.com

# ගවේෂණාත්මක රාත්‍රියක්

"ඉයන්ට හිතෙන් නැද්ද කවුරු හරි මේ ප්‍රශ්නෙට සම්බන්ධ ඇත්ත තොරතුරු අපෙන් හංගන්න හදනවා කියලා?" රොජර් විමසුවේ රැදින රාත්‍රියේ ආහාර ගන්නා අතරතුරයි. භෝජනාගාරයේ සිටියේ රොජර් සහ ඉයන් පමණි.

"ඇයි, රොජර්ට එහෙම හිතෙනවද?"

"ඔව්, ඒ නිසා තමයි අපිට මේ වෙන තුරුත් මිනීමරුවව හඳුන ගන්න බැරි වුණේ."

"රොජර්, හිතන්නෙ කවුරු මේ අපරාධ සම්බන්ධ කරුණු විකෘති කරන්න හදනවා කියලද?" ඉයන් විමසීය. ඊට පිළිතුරු ලෙස රොජර් සිය හිස දෙපසට සැලුවේය.

"ඒක හෙළිකර ගන්න එක ලේසි නෑ ඉයන්. ඒත් මේ මිනීමැරුම්වලට සම්බන්ධ කරුණු යට ගහන්න උත්සාහ කරන මිනිහා කවුද කියලා දැනගත්තොත් මිනීමරුව කවුද කියන එකත් ඉබේටම ඔප්පු වෙනවා... මොකද... කිසි සැකයක් නෑ... ඒ දෙන්නම එක්කෙනෙක් මිස දෙන්නෙක් නොවෙයි." රොජර් පැවසුවේ දිගු නිහැඬියාවකට පසුවයි. සැබවින්ම මේ වන විට මෙම පරීක්ෂණයට බාධා ගෙන දෙන ලෙස හැසිරෙන්නේ කවුරුන් ද යන්න පිළිබඳව රොජර්ගේ සිතේ යම් යම් සැක සංකා පහළවෙමින් තිබිණි. එහෙත්





එය ප්‍රත්‍යක්ෂ වන තුරු ඉයන්ට හෝ ඒ පිළිබඳ පැවසිය යුතු නැතැයි ඔහු කල්පනා කළේය. කල්පනාවේ නිමග්නව සිටි රොජර් දෙස මඳ වේලාවක් බලා සිටි ඉයන් උන් තැනින් නැගී සිටියේය.

"ඉයන්, කම්මැලි හිතුණද?" රොජර් විමසීය.

"නෑ, මේ ගැන කල්පනා කරලම මගේ ඔළුව විකක් රිදෙන්න ගත්තා." ඔහු පිළිතුරු දුන්නේය.

"මේ බිත්ති හතරට කොටුවෙලා හිටියම ඔළුවෙ කැක්කුම් ඇති වෙන එක අහන්න ඕනෙයැ. වෙනසකටත් එක්ක අපි යමු පොඩි රවුමක්. ඒ යන ගමන් අපිට පොලිසියට ගිහින් හෙල්ගසන්වත් මුණගැහිලා යන්න පුළුවන් වෙයි." රොජර් පැවසුවේ කබාය ඇඟ දවටා ගනිමිනි. තානායමේ කාමරය තුළ රැඳී සිටිනවාට වඩා එය කොතරම් අගනේ දැයි ඉයන්ට වැටහිණි.

ඔවුහු තානායමෙන් පිට වන විට වේලාව පස්වරු අටට ආසන්නව පැවතිණි. වලාකුළෙන් තොර කාල වර්ණ අහස් කුස පුරා විහිදී තිබූ තාරකාවන් වෙනදාටත් වඩා පැහැදිලිව දර්ශනය විය.

"මිනීමරුවා තමන්ට විරුද්ධව සාක්ෂි දෙන්න එක කටක්වත් ඉතුරු කරන් නෑ. විශේෂයෙන් පාකර් මහත්මයාගෙ මරණෙන් පස්සෙ, තවත් සාක්ෂිකාරයො හිටිය නම් ඒ අයගෙත් කටවල් වැහෙන්න ඇති. කවුද කැමති නිරපරාධෙ වෙඩි පාරක් කන්න." රොජර් පැවසුවේ ඉයන්ගේ අවධානය යළි ඒ වෙත යොමු කරවමිනි.

"රොජර්, වෙඩි පාරක් ගැන කියද්දියි මට කල්පනා වුණේ. පාකර්ගෙ මරණය සිද්ධ කරන්න පාවිච්චි කරපු රිවොල්වරය ගැන. ඒ ගැන මොනවද කියන්න තියෙන්නෙ?" ඉයන් විමසීය.

"පශ්චාත් මරණ පරීක්ෂණෙන් පස්සෙ ඒ ගැන අපිට හරියටම දැනගන්න පුළුවන් වෙයි. පාවිච්චි කළ මුනිස්සම් වර්ගය හඳුන

ගන්නට පස්සෙ රිවෝල්වරය මොන වගේ එකක් ද කියන එක ගැන අදහසක් ගන්න පුළුවන්." ඔවුහු පොලිස් මූලස්ථානය වෙත ළඟා වන විට පොලිස් පරීක්ෂක හෙල්ගසන් එහි විය.

"රොජර්, මේක තවත් බලං ඉන්න හොඳ වැඩක් නෙවෙයි. පාකර්ගෙ මරණෙ නිසා මිනිස්සු හොඳටම කලබල වෙලා. මහ දවල් දෙනෝදනක් ගැවසෙන තැනකට ඇවිත් අමු අමුවෙ මිනීමරලා දොරුදනක් වෙන්න පුළුවන් තත්ත්වයක් නම් රටේ තියෙන්නෙ මිනිස්සුන්ගෙ ආරක්ෂාව ගැන මොකට කතා කරනවද?" හෙල්ගසන් පැවසීය.

"ඇත්තම කියනවා නම් අපි තවමත් අසාර්ථකයි හෙල්ගසන්. මිනීමරුවා පුදුම විදියට තමන්ට විරුද්ධව පාවිච්චි කරන්න පුළුවන් හැම සාක්ෂියක්ම විනාශ කරලා. මම හිතන් නෑ මේ සැරේ නම් අපිට මිනීමරුවව අල්ල ගන්න පුළුවන් වෙයි කියලා." රොජර් පැවසුවේය. සිය මිතුරා අශුභවාදීව කතා කිරීම පිළිබඳ ඉයන්ගේ සිතේ කණගාටුවක් ඇති විය. රොජර් මෙතරම් අශුභවාදී ලෙස කතා කරනු ඔහු මින් පෙර දැක නොතිබිණි.

මොහොතක් කල්පනාවේ නිමග්නව සිටි හෙල්ගසන් හිස ඉහළ පහළ සැලුවේ රොජර්ගේ අදහස අනුමත කරන්නාක් මෙනි. එහෙත් මිනීමරුවා හඳුනාගත නොහැකි වුවහොත්, විශේෂයෙන් එය හෙල්ගසන්ගේ කීර්ති නාමයට මෙන්ම මැකල්ටන්හි ජන ජීවිතයට ද විශාල තර්ජනයක් වනු ඇතැයි ඉයන්ට වැටහිණි.



kathapothak.blogspot.com

# හෙල්ගසන් සමඟ අදහස් හුවමාරුවක්

"හෙල්ගසන්, පාකර්ගෙ මරණෙ සම්බන්ධයෙන් තවම හෙල්ගසන්ට මොනවත්ම හෙළි කරගන්න බැරි වුණාද? විශේෂයෙන් අර මිනීමරුවා මිනීමැරුම සිද්ධ කරන අවස්ථාවෙ ඇඳගෙන හිටපු කළු පාට කලිසමයි කමිසයයි ගැන හොයලා බැලුවෙ නැද්ද?"

"මම දෙන්නෙක්ව පිටත් කළා ඒ වැඩේට. හෙට දවල් වෙනකොට ඒ ගැන හරියටම දැනගන්න ලැබෙයි."

"මැකල්ටන්වල විතර ද සෝදිසි කෙරෙන්නෙ?" රොජර් විමසීය.

"ඔව් දැනට මැකල්ටන් නගර සීමාවෙ තියෙන හැම ඇඳුම් සාප්පුවක්ම සෝදිසි කරන්න කියලා මම දැනුම් දුන්නා." හෙල්ගසන් පැවසීය.

"හැබැයි හෙල්ගසන්, මිනීමරුවා අපි හිතන තරම් මෝඩ නෑ. මිනිහා මිනීමැරුම සූක්ෂමව සැලසුම් කරපු විදිය බැලුවහම අපිට හිතන්න අමාරුයි, අර කළු පාට ඇඳුම් කට්ටලය මැකල්ටන් නගරයෙන් මිලදී ගත්තා කියලා. මට හිතෙන්නෙ අපි මේ විස්තරේ පත්තරේක පළ කළොත් හොඳ ප්‍රතිචාරයක් ලැබෙයි. විශේෂයෙන් 'අර විදියෙ කළු ඇඳුම් කට්ටලයක් මිලදී ගත් කෙනෙක් ගැන ආරංචියක් දෙන කෙනෙකුට පවුම් දහයක තෑග්ගක්' කියලා කිව්වොත් අපිට මේක හොයා ගන්න එක අමාරු වෙන එකක් නෑ."

"වැඩක් වෙන් නෑ රොජර්, මේ දහස් ගණනක් මිනිස්සු ගැවසෙන කඩ සාප්පුවල සේවකයන්ට ඔය ගැන මතක තියෙයි කියලා හිතන්න බොරුයි." හෙල්ගසන් පැවසීය.

"ඒ වුණත් පත්තරේ ඒ වගේ දැන්වීමක් පළ කරන එකෙන් අපිට අමුතුවෙන් පාඩුවක් වෙන්නෑ නේ. ඒ වගේම බැරිවෙලා හරි ඝාතකයා ගැන හෝඩුවාවක් ලැබෙන්නත් ඉඩ තියෙනවා. ඒ නිසා මට හිතෙන්නෙ පත්තරේ දැන්වීමක් දාන එක හොඳයි කියලයි." රොජර් පැවසීය.

"අනේ මන්දා. මට නම් හිතෙන්නෙ අපි ඒකට කාලෙ නාස්ති කරන එක බොරු වැඩක් කියලයි." හෙල්ගසන් පැවසුවේය.

"ඒක නෙවෙයි හෙල්ගසන්. අපි දෙන්නා මේ එළියට බැස්සෙ වෙනසකටත් එක්ක මේ පැත්තෙ ටිකක් ඇවිදින්න යන්න කියලා හිතාගෙන. මම කල්පනා කළේ හෙල්ගසන්ගෙ බංගලාව පැත්තෙ පොඩි රවුමක් යන්නයි. හෙල්ගසන්ට පුළුවන් ද දැන් අපිත් එක්ක යන්න එන්න?" රොජර් විමසීය.

"හූ... මමත් කැමතී රොජර්ලා ඒ පැත්තෙ එනව නම්. ඒත් මම දැන් ගියොත් මේ මේසෙ උඩ ගොඩගැහිලා තියෙන වැඩ සේරම අවුල් වෙනවා. අද උදෙත් මට පිට යන්න වුණ නිසා මම බැලුවේ මේ නඩු පොත්වල වැඩ ටික දැන්වත් ඉවරයක් කරලා දාන්නයි."

"ආ... ඒකට ප්‍රශ්නයක් නෑ හෙල්ගසන්, මම නිකමට ඇහුවේ. අපි කොහොමහරි හෙට හවස යමුකෝ." රොජර් පැවසීය.

"එහෙනම් අපි යමු ද රොජර්?" මෙතෙක් වේලා පසෙකට වී නිහඬව සියල්ල අසා සිටි ඉයන් පැවසුවේය.

"යමු" රොජර් පැවසීය.

kathapothak.blogspot.com

# රාත්‍රී සවාරිය

පොලිස් මූලස්ථානයෙන් පිටවූ ඔවුහු ඝන අඳුරේ වෙලී තිබූ මාවත ඔස්සේ ඉදිරියට ඇවිද යන්නට වූහ. පොලිස් මූලස්ථානයෙන් පිට වී මිනිත්තු කිහිපයක් ගත වන තුරුත් රොජර්, ඉයන් හා කිසිත් නොපැවසීය. සිය මිත්‍රයා යම් වැදගත් කරුණක් වෙත සිත යොමුකර ඇති බව ඉයන් වටහා ගත්තේය.

"ඉයන්, මේ පාර කෙළවර වෙන්නෙ කොතනින් කියලද හිතන්නෙ?" රොජර් විමසුවේ ප්‍රධාන වීථියට සම්බන්ධව තිබූ තවත් පටු මාවතක් පෙන්වමිනි. ඉයන් සිය හිස දෙපසට සැලුවේ තමාට එය වටහා ගැනීමට අපහසු බව පවසන්නාක් මෙනි.

"හෙල්ගසන්ගෙ බංගලාවට යන්නෙ මේ පාරෙන්." රොජර් පැවසීය.

"රොජර් කොහොමද ඒ බව හරියටම දැනගත්තෙ?" ඉයන් විමසීය.

"මම අද හවස ගම්මු දෙතුන් දෙනෙකුගෙන් ඒ ගැන අහලා දැනගත්තා."

"ඒත් හෙල්ගසන් නැතිව ඒ පැත්තෙ ගිහින් වැඩක් නැහැනේ." ඉයන් පැවසීය.

"ඔව්, ඒක ඇත්ත තමයි. ඒත්... අපි නිකමට ඒ පැත්තට යමු. මේ පාරේ හැතැප්ම එකහමාරක් විතර ඉස්සරහට යද්දී පාර දෙකට

මෙදෙනවා. ඒ තුන්මං හන්දියෙ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙ අලංකාර පිළිමයක් දක ගන්න පුළුවන් වෙයි. අන්න ඒ හන්දියෙන් දකුණු පැත්තට විහිදුණු පාරේ හැතැප්ම කාලක් විතර ගියහම තමයි හෙල්ගසන්ගෙ බංගලාව තියෙන්නෙ." රොජර් ඉයන් හට මෙන් මග විස්තර කළේය. ඉන් අනතුරුව ඔවුහු ප්‍රධාන මාර්ගයෙන් එම අතුරු මාර්ගයට ඇතුළු වී ඉදිරියට ගමන් කරන්නට වූහ. මේ වන විට වේලාව රාත්‍රී දහයට ආසන්නව පැවතිණි.

"ඉයන්, අර නිල් වීදුරු වලින් හදපු කුරුළු ජෝඩුව ගැන ඉයන්ට මොනවත්ම හිතෙන් නැද්ද?"

"ඒක කැමිලට ලැබෙන්න ඇත්තෙ පෙම්වතාගෙන්. බොහෝ දුරට ඒ මිනීමරුවා වෙන්න ඉඩ තියෙනවා. මට හිතෙන්නෙ මිනීමරුවා කැමිලව ආශ්‍රය කළේ තමන්ගෙ ඇත්ත නමින් නෙවෙයි ඒ නිසා ඩී. එච්. ගෙන් ආදරණීය කැමිලට කියන එකේ ඒ හැඩි වැදගත්කමක් නෑ කියලයි මට හිතෙන්නෙ."

"ඉයන්ට හිතෙන්නෙ එහෙමද? ඒත් මට හිතෙන්නෙ මිනීමරුවා තමන්ගෙ ඇත්ත නමින්ම තමයි කැමිලව ආශ්‍රය කළේ කියලයි. ඒ නිසා තමයි කැමිලාගෙ කාමරේ කණපිට පෙරළලා මිනීමරුවා තමන්ගෙ අනන්‍යතාවය හෙළිවෙන විධියෙ හැම දෙයක්ම අරං ගියේ. ඒ විතරක් නෙවෙයි. පාකර්ව අමු අමුවෙ මරලා දැම්මෙත් ඒ හේතුව නිසාම තමයි. ඒක බොහොම පැහැදිලි කරුණක්." රොජර් පැවසීය. මේ වන විට ඔවුහු එම මාවත ඔස්සේ සැතපුම් තුන්කාලක පමණ දුරක් ඉදිරියට ගමන් කර තිබුණහ. ඉදිරියට ගමන් ගන්නා අතරතුර ප්‍රදේශ වාසීන් කිහිපදෙනකු ඔවුන්ට දකගත හැකි වූ නමුත් එහි ජනගහනය අවම මට්ටමක පැවති බව පැහැදිලිවම පෙනිණි. මේ අතර ඈතින් අශ්ව කරත්තයක 'ක්ලොප්... ක්ලොප්' හඬ ඇසෙන්නට විය. එම හඬ නැගුණේ ඔවුන් පසු කර ආ දෙසිනි. එනම් පසුපසිනි.



තත්පර කිහිපයක් ගත වන විට රෝද දෙකේ කුඩා අශ්ව රියක පැති ලාම්පුවල ආලෝකය රොජර්ගේ නෙත ගැටිණි. ක්‍රමයෙන් ඔවුන් වෙත සමීප වූ අශ්ව රියේ වේගය බොහෝ සෙයින් හීන විය. අවසානයෙ එය ඔවුන් ඉදිරියේ නැවතිණි.

"රොජර් මම පුදුම වුණා මෙතනදි රොජර්ලව දකලා." රථයෙන් ඉවතට යොමු වූයේ හෙල්ගසන්ගේ තේජාන්විත මුහුණයි. ඔහු අසුගේ රේන්ස් පටි තදින් ග්‍රහණය කරගෙන සිටියේය.

"ආ... හෙල්ගසන්. අපි කම්මැලිකමටත් එක්ක මේ පැත්තට ඇවිදන් ආවා. මට ආරංචි වුණා මේ පාරේ ජේසුතුමාගේ ලස්සන ප්‍රතිමාවකුත් තියෙනවා කියලා."

"ඔව් ඔව්. තව ටික දුරක් තියෙනවා එතැනට එන්න නගින්න. මට හදිස්සියෙ බංගලාවට යන්න වුණා. මම ඊයෙ කලබලේට නඩුවලට සම්බන්ධ ලියවිලි වගයක් අමතක කරලා ඇවිල්ලා... නගින්න..." හෙල්ගසන් පැවසීය. රථයේ වෙනත් කිසිවකුත් නොසිටියෙන් රොජර් සහ ඉයන් ඊට ගොඩවී පසුපස අසුනේ ඉඳගත්හ.

"මේ ප්‍රශ්නෙ නිසා මගේ සිහි කල්පනාවත් දැන් හොඳටම අඩුවෙලා රොජර්... අර පාකර්ගෙ මරණෙ නිසා අපේ පරීක්ෂණය ඉදිරියට ගෙනියන එක අපි හිතන තරම් ලේසි නෑ..."

"ඔව්... ඒ විතරක් නෙවෙයි. හෙල්ගසන්ට ආරංචි වෙන්න ඇතිනෙ... මිනීමරුවා පොලිස් නිලධාරියෙක් වගේ වෙස් වලාගෙන පාකර්ගෙ ගෙට ඇතුළුවෙලා කැමිලගෙ පෞද්ගලික බඩුබාහිරාදිය අරන් ගිහින් තියෙන බව..."

"ඔව්... මේ සැරේ නම් අපිට මේ මිනීමරුවව කොටුකර ගන්න ලැබෙන් නැති පාටයි රොජර්... උඹට මහ පුදුමාකාර

ඉවත් තියෙනවා... තමන්ව කොටු කරගන්න පුළුවන් කොහොමද කියන එක ගැන. අන්න ඒක අපිට ලොකු පාඩුවක්." හෙල්ගසන් පැවසීය.

"ඒ වුණාට අපිටත් අවස්ථාවක් ලැබෙයි කවදහරි. දැන් මිනීමරුවා ඉන්නෙ තමන් ගැන අධි තක්සේරුවකින්. ස්කොට්ලන්ඩ්යාඩ් එකටවත් තමාව තවම හඳුන ගන්න බැරිවුණා කියන මානසික තත්ත්වය නිසා ඌ සමහර විට ආයෙත් නිදහසේ සමාජයේ හැසිරෙන්න ගනී. අනික අමතක කරන්නෙපා හෙල්ගසන්, තවම අපි සම්පූර්ණයෙන්ම අසාර්ථක නෑ. දැනටම ත් මිනීමරුවා අතින් අතපසුවීම් තුන හතරක්ම සිද්ධවෙලා තියෙනවා. අපි හරියට මොළේ කල්පනා කළොත්, ඒ දත්ත දෙක තුනත් ඇති මිනීමරුවගෙ බෙල්ලට තොණ්ඩුව දාන්න."

"මට නම් මිනීමරුවව හඳුනගන්න පුළුවන් වෙන විධියෙ කිසිම දෙයක් හොයා ගන්න බැරිවුණා රොජර්. මට හිතාගන්න බෑ රොජර් කොහොමද මේ දේ කරන්නෙ කියලා."

"ඒ හැම දෙයක්ම මගේ හිතේ ඇතිවුණ උපකල්පන විතරයි හෙල්ගසන්. අඩුම තරමෙ මේ මගේ මිත්‍රයා ඉයන්ටවත් මම තවම ඒ ගැන කියලා නෑ. අපි බලමු ඉදිරියට." රොජර් පැවසීය.

මේ වන විට ඔවුහු තුන්මං සන්ධියට පැමිණ සිටියහ. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අලංකාර ප්‍රතිමාවක් එහි විය. එය පසුකරමින් දකුණු දෙසට විහිදී තිබූ මාවතට රථය මෙහෙය වූ හෙල්ගසන් එම ප්‍රතිමාවේ මූලාරම්භය පිළිබඳ කරුණු පවසන්නට විය.

"...මිය ප්‍රතිමාව හදන්න මුල් වුණේ මැකල්වන් පල්ලියෙ ප්‍රධාන පූජකතුමා. මොකද... මේ තුන්මං හන්දියෙ මීට අවුරුදු හැටකට හැත්තෑවකට විතර කලින් මිනිහෙක්ව පිහියකින් ඇනලා මරලා දාලා තියෙනවා. පස්සේ ඒ මිනිහගෙ අවතාරේ මේ තුන්මං හන්දියෙ



සැරිසරනව කියලා මිනිස්සු අතර කටකතාවක් පැතිරිලා ගිහින් තියෙනවා... ඒ විතරක් නෙවෙයි. මහ රෑ මේ තුන්මං හන්දිය පහුකරන් ගිය මිනිස්සු කිහිපදෙනෙක්ම අර අවතාරේට හයවෙලා තියෙනවලු. මම නං ඕවා විශ්වාස කරන් නෑ. ඉතින් කොහොම හරි පූජකතුමාට හිතුණලු මෙතන ජේසුතුමාගේ පිළිමයක් හදවන්න. දැන්නම් අර වගේ අමනුෂ්‍ය හයක් මිනිස්සුන්ගෙ හිත්වල නෑ..." හෙල්ගසන් පැවසීය.

තවත් මිනිත්තු කිහිපයක් ගත වන විට ඔවුහු හෙල්ගසන්ගේ නිල නිවස වෙත සමීප වූහ. දිගු පුළුල් බරාඳයේ රථය නතර කළ හෙල්ගසන් ඉන් බැස ගොස් නිවසේ දොරටුව විවෘත කළේය. මුළුමනින්ම අඳුරේ වෙලී තිබූ එම දෙමහල් ප්‍රාසාදයේ දවැන්ත බිත්ති දියසෙවෙල් බැඳී ජරාජීර්ණය වී පැවති බව අඩ සඳේ මන්දාලෝකයෙන් වුව ද දැකගත හැකි විය. එමෙන්ම බංගලාවට අයත් උද්‍යානය ද වල් බිහිවී තිබිණි.

kathapothak.blogspot.com

kathapothak.blogspot.com

# හෙල්ගසන්ගෙන් කරුණු පැහැදිලි කිරීමක්

හෙල්ගසන් නිවසට ඇතුළු වන විට රොජර් සහ ඉයන් අද් රියෙන් බැස ගත්තේ, හෙල්ගසන් සමග නිවසට ඇතුළු වන අදහසිනි. එහෙත් ඔවුන්ට ඒට ඉඩක් නොලැබිණි. හෙල්ගසන් තැවත දොරටුවෙන් පිට වූයේ ලිපි ලේඛන සිහිපයක් අතැතිවයි.

"රොජර්, අපි ප්‍රමාද නොවී පිටත් වෙමු නේද? මම හෙට ර තැම් ලෑස්ති කරනවා බංගලාවෙ." හෙල්ගසන් පැවසුවේ දොර්දුවලමිනි. එය ඇසෙත්ම ඉයන්ගේ මුවින් නොසතුටුවස් හඩක් නික්මිනි. එහෙත් ඔහු යමක් පැවසීමට පෙර රොජර් දොඩමළ වූයේය.

"ඒක හොඳයි හෙල්ගසන්. කොහොමත් මේ කලබලේ අපිට නිවිහැනසිල්ලෙ මේ ගැන කතා කරන්නත් බැහෙ." රොජර් පැවසීය

"යමු, මම රොජර්ලව ගිහින් ඇරලවන්නම්." හෙල්ගසන් පැවසුවේ අපුරේ ජේන්ස් පටි සකසමිනි.

"නෑ, කමක් නෑ හෙල්ගසන්. අපි පයින් එන්නම්."

"නෑ... නෑ... මේ තරම් දුරක් පයින් යන්න ඕනෙ නෑ, මම ගිහින් ඇරලවන්නම්." හෙල්ගසන් පැවසීය.

අවසානයේ රොජර් හෙල්ගසන්ගේ රියට ගොඩවූයේ කැමැත්තෙන් වුවද ඉයන්වද ඊට ගොඩ වීමට සිදු විය.



"හෙල්ගසන්, මිනීමරුවා පාවිච්චි කරපු කළු පාට කලිසමයි තබායයි ගැන වගේම මරණය සිද්ධ කරන්න පාවිච්චි කරපු ආයුධෙ ගැනත් හොයලා බලන්න ඕනෙ." රොජර් පැවසුවේ ඉදිරියට ගමන් ගන්නා අතරයි.

"ඔව්... මම මරණ පරීක්ෂණ වාර්තාව කියවලා බැලුවා. ඒකෙ සඳහන් වෙන රිවෝල්වර් වර්ගය ගැනත් මම ටිකක් හොයලා බැලුවා. ඒත් ඉතින් කොහෙත් කියලා ඒ වගේ රිවෝල්වරයක් හොයා ගන්නද? අනික මිනීමරුවා ඒ රිවෝල්වරය කාටත් පෙනෙන ලේසියෙන් හොයා ගන්න පුළුවන් තැනකට විසිකරලා යන්නැතෙ. දනටම ඌ ඒක විනාශ කරලා ඇති, නැත්නම් කාටවත් හොයා ගන්න බැරි තැනක හංගලා ඇති." හෙල්ගසන් කරුණු පැහැදිලි කිරීමට වූයේය.

"ඒ වුණාට හෙල්ගසන්, ඕය හංගලා තියෙන ආයුධ වුණත් එළියට ඇදලා ගන්න පුළුවන් ක්‍රම තියෙනවා. ඒකට අවශ්‍ය වෙන්නෙ බුද්ධියයි, ඉවසීමයි විතරයි." රොජර් පැවසීය.

"මට නම් ඒ ගැන වැඩි අවබෝධයක් නෑ රොජර්." හෙල්ගසන් පැවසීය.

"ඒ ගැන ඒ හැටි කල්පනා කරන්න ඕනෙ නෑ, හෙල්ගසන්. තව ටික දවසකින් මිනීමරුවා වගේම ආයුධෙත් නිකම්ම එළියට එයි." රොජර් පැවසීය. මිනිත්තු පහළොවක පමණ කාලයක් ගත වන විට ඔවුහු පොලිස් මූලස්ථානය වෙත සමීප වී සිටියහ. ඒ වන විට එහි රැඳී සිටියේ රාත්‍රී සේවයේ නියුතු නිලධාරීන් දෙදෙනකු පමණි. කිරීමට වෙනත් කිසිදු කාර්යයක් නොවූයෙන් රොජර් සහ ඉයන් නැවත තානායම වෙත ගමන් කිරීමට සිතා පොලිස් මූලස්ථානයෙන් පිටත් වූහ. පෙරළා තානායම වෙත පැමිණෙන අතරතුර පොලිස් මූලස්ථානයට මදක් ඔබ්බෙන් පිහිටා තිබූ කුලී රථගාල වෙත ගමන් කළ රොජර් කුලී රියක් අසල සිටි තැනැත්තකු පසෙකට

නැංවාගෙන ගියේය. ඉන්පසු යමක් පැහැදිලි කළ රොජර් කාසි කිහිපයක් ද ඔහු අත තැබීය. එහෙත් එම කුලී රථ රියදුරා සමඟ රොජර් කුමක් පැවසුවේ දැයි ඉයන්ට වටහා ගත නොහැකි විය.

× × × × ×

"රොජර්, අද ගමන මහ තේරුමක් නැති එකක් වුණා නේද?" ඉයන් පැවසුවේ නානායමට පැමිණි පසුවයි.

"නෑ එහෙමම කියන්නත් බෑ. අපේ මහන්සිය අපතේ ගියා කියලා මම හිතන් නෑ." රොජර් පැවසීය. එහෙත් ඉයන් සිය දෙවුර හැකිළුවේ තමාට කිසිත් වටහා ගත නොහැකි බව පවසන්නාක් මෙනි.

"ඒක නෙවෙයි ඉයන්, මට නම් අද රෑ නින්දක් ගැන හිතන්නවත් ලැබෙන එකක් නෑ... මට තව පොඩි ගමනක් යන්න තියෙනවා." රොජර් පැවසුවේය.

"දැන් රෑ දොළහටත් ළඟයිනෙ. මේ මහ රෑ අහවල් එකක් කරන්න ද රොජර් හදන්නෙ?"

"කරන්න දෙයක් නෑ ඉයන්. ඒ දේ කරන්නම වෙනවා." රොජර් පැවසීය.

"එහෙනම් ඉතින් අපි ප්‍රමාද නොවී දැන්ම පිටත් වෙමු."

"නෑ ඒ ගමන යා යුත්තෙ මම තනියෙන්. ඒ විතරක් නෙවෙයි ඉයන්ටත් අද රෑ ලොකු රාජකාරියක් තියෙනවා... හැබැයි ඉයන් ඒක කළ යුත්තේ මේතන ඉඳන්. ඒ කිව්වෙ මේ නානායමේ ඉඳන්."

"මම මොනවද කරන්න ඕනෙ?"

"මෙන්න මෙච්චරයි... තව ටිකකින් මම මෙහෙන් පිටත් වෙනවා. හැබැයි මම පිටත් වෙන්නෙ මගේ කාමරේ දොර අගුළු දාලා යතුරත් අරන්. ඉයන් කළ යුත්තේ මෙච්චරයි... පුරුදු විදියට ඉයන්ගේ



කාමරේට වෙලා, දොර අගුළු දාගෙන ඉන්න එක." රොජර් පැවසීය. එය සවන් වැකෙත්ම ඉයන්ගේ මුහුණට සිනහවක් නැගිණි.

"ඉතින් රාජකාරියක් හැටියට ඒකෙ ඇති වැදගත්කම මොකක්ද?"

"ඉන්න, තවම මගේ කතාව ඉවර නෑ. අනික මේක විහිළුවක් කියලා හිතන්න එපා ඉයන්. මම හිතන විදිය හරි නම්, හෙට එළිවෙන්න කලින් අපිව හොයාගෙන අමුත්තෙක් එයි. සමහර විට අපි දන්න හඳුනන කෙනෙක් වෙන්නත් ඉඩ තියෙනවා. මතක තියාගන්න කවුරු වුණත්, ඒ එන කෙනා එන්නෙ අපි අද රෑ මේ නානායමේ ඉන්නව ද කියලා බලාගෙන යන්න. විශේෂයෙන් ඒ අමුත්තා මාව හොයයි. සමහර විට මාත් එක්ක ටිකක් කතා කරන්න ඕනෙ කියලා කරදර කරයි. ඉයන් එනකෙනා මොනතරම් හිතවත් කෙනෙක් වුණත් මොනම හේතුවක් නිසාවත් මම මෙහේ නෑ කියලා මිනිහට හඟවන්න එපා. ඒක තමයි වැදගත්ම දේ. ඒ වගේම මිනිහා මාව මුණ ගැහෙන්න ඕනෙ කියලා කරදර කළොත් ඉයන් කියන්න මට හොඳටම නින්ද ගිහින්, දොර ඇතුළෙන් අගුළු දාලා කියලා. මාව මුණගැහෙන්න ඕනෙම නම් හෙට උදේ හතට විතර එන්න කියන්න."

"හොඳයි මම ඒ විදියට කරන්නම්... ඒත් මට හිතාගන්න බැරි මේ මහ රෑ රොජර් කොහෙද යන්න හදන්නෙ කියන එකයි?"

"මම ගිහින් ඇවිල්ලා ඒ හැම දෙයක්ම ඉයන්ට පැහැදිලි කරලා දෙන්නම්... මතකයිනෙ මම කියපු දේ... කවුරු ආවත්, දෙවියන් වහන්සෙ වුණත් කමක් නෑ මම මෙහේ නැති බව කියන්න එපා." රොජර් පැවසුවේ බැරෑරුම් ස්වරූපයක් මුහුණට නගා ගනිමිනි. ඉන් පසු ඔහු සිය කාමරයේ දොරගුළු දමා එහි යතුර සිය කබා සාක්කුවේ දමා ගත්තේය.

kathapothak.blogspot.com

# සූක්ෂ්ම උපායක්

ඉයන්සෙන් සමුගත් රොජර් තානායමෙන් පිටවී ළඟා වූයේ කුලී රථ ගාල වෙතයි. එහි අඳුරු මුල්ලක නවතා තිබූ රෝද දෙකේ කුඩා අස් රිය ඔහුට හඳුනාගත හැකි විය. රථ ගාලේ තිබුණේ එම රථය පමණි.

"මහත්තයා, මම මෙතන!" රොජර්ගේ සවන් වැකිණි. රථගාල අසල පිහිටා තිබූ දවැන්ත එල්ම් ගස පාමුල වාඩිවී සිටියේ රථයේ රියැදුරාය. ඔහු වයස අවුරුදු දහඅටක විස්සක පමණ තරුණයා විය.

"බොහොම හොඳයි, මාර්ටින් මම කියපු විදියට වැඩේ කළා." රොජර් පැවසුවේ තවත් කාසි කිහිපයක් ඔහු අත තබමිනි.

රොජර් රථයට ගොඩවූ පසු මාර්ටින් නම් වූ තරුණ රියැදුරා සිය රථය රථගාලෙන් ඉවතට ගත්තේ විගසිනි. ඉන්පසු ප්‍රධාන වීථිය මඟ හැර වෙනත් අතුරු මාර්ග ඔස්සේ ඔහු සිය අසු මෙහෙයවන්නට වූයේය. ගත දවවෙන්නා වූ සීත සුළං රැළි හේතුවෙන් රොජර්ගේ සියොළඟ කිළිපොලා යන්නට විය. එහෙත් එය අමතක කර දැමූ ඔහු අසුනට බරවී තම ඉදිරි සැලැස්ම පිළිබඳ කල්පනා කළේය. මිනිත්තු විස්සක පමණ කාලයක් ගත වන විට ඔවුහු ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පිළිමය පිහිටා තිබූ තුන්මං සන්ධිය වෙත ළඟා වූහ.



"මාර්ටින්, එහෙනම් බොහොම ස්තූතියි." රොජර් පැවසුවේ තුන්මං සන්ධිය අසලදී රියෙන් බසිමිනි.

"එහෙනම් මම ගිහින් එන්නම් මහත්තයා." රියැදුරා පැවසුවේ අසු හරවා ගනිමිනි.

"මතකයිනෙ! මම කියපු දේ. ප්‍රධාන පාර මගහැරලා ආපු පාරෙන්ම ආපහු යන්න, කවුරුහරි කරත්තෙ නවත්වලා ඇහුවොත් මොකක්හරි බොරුවක් කියන්න. මෙහෙම ගමනක් ආපු බවක් කියන්න එපා."

"ඒ ගැන සැකයක් තියාගන්න එපා මහත්තයා. ආයෙත් මේ වගේ උදව්වක් අවශ්‍ය වුණොත් කියන්න. සුබ රාත්‍රියක්" යැයි පැවසූ ඔහු අසුගේ රෙන්ස් පටි ලිහිල් කළේය. කරත්තය අතුරු මාවතකට පිවිසී නොපෙනී යන තුරු මද වේලාවක් බලා සිටි රොජර් ඉදිරියට ගමන් කිරීමට වූයේය.

kathapothak.blogspot.com

# මහ රෑ පැමිණි අමුත්තා

රොජර් පිටව ගිය පසු ඉයන් සිය කුටියට පිවිසී ඇතුළතින් අගුළු ලා ගත්තේය. තම මිත්‍රයා මෙම අඳුරු රාත්‍රියේ කුමක් සඳහා පිටව ගියේ දැයි ඔහු කල්පනා කරන්නට විය. එහෙත් ඔහුට කිසිවක් සිතාගත නොහැකි විය. රොජර් ඉයන් තව පුලපුලා පැවසුවේ මෙම අඳුරු රාත්‍රියේ කිසියම් තැනැත්තකු තමා සොයා පැමිණෙන බව නොවේද? ඉයන් ඒ පිළිබඳව දිගින් දිගටම කල්පනා කළේය. රුමේනියන් දෙදෙනකු අමු අමුවේ ඝාතනයට ලක් කළ මිනීමරුවා පිළිබඳ රොජර්ට [illegible] ඇති බව ඉයන්ට ප්‍රත්‍යක්ෂ විය. නොඑසේ නම් ඔහු කිසිවිටෙක මෙවන් [illegible] ආකාරයට ක්‍රියා නොකරනු ඇතැයි ඉයන්ට සිතිණි.

[illegible] විට ද ඉයන් [illegible] [illegible] විය. [illegible] විය.

"ඉයන්! ඉයන්!" [illegible] ඇසිණි. ඉයන් යහනෙන් බිමට සිය [illegible]



පැජෙප්පයේ බිත්තියේ එල්ලා තිබූ ගෑස් පහනේ මන්දාලෝකය වැටී දොරටුව ඉදිරිපස භූමි භාගය මදක් ආලෝකමත් වී තිබිණි. එහෙයින් පැමිණ සිටි තැනැත්තාගේ හැඩරුව ඉයන්ගේ දෙනෙතේ මැනවින් සටහන් විණි. එහෙත් තමා මේ දකින්නේ තම ජීවිතයේ අවසන් දසුන බව ඒ මොහොතේ ඉයන්ට සිහිසේත්ම නොසිතෙන්නට ඇත!

ජ ජ ජ

kathapothak.blogspot.com

# බේදජනක සිදුවීමක්

පසු දිනට පහන් විය. "කන්ට්‍රි වැලිව්" තානායමේ ගේට්ටුව අභියස විශාල පිරිසක් රැස්ව සිටිනු ඇත තියාම රොජර් දුටුවේය. කුමක් හෝ කලබලයක් එහි සිදුවී ඇති බව ඔහුට ඉවෙන් මෙන් දැනිණි. තමා රාත්‍රියේ කළ මෙහෙයුම සාර්ථක වීම හේතුවෙන් රොජර්ගේ සිතේ ඇතිවී තිබූ සාප්තිමත්භාවය ඒ මොහොතේ ඔහුට අසන්නට ලැබුණු පණිවිඩයෙන් මුළුමනින්ම වියැකී ගියේය. සිය හදවත පිහියකින් පළුදු කළාක් බඳු හැඟීමක් ඔහුට දැනිණි.

"රොජර් මහත්තයා, ඊයෙ රෑ කොහෙද ගියේ? ඒක මහත්තයගෙ වාසනාවට සිය ගමනක් කියලා හිතා ගන්න. කියන්නත් කණගාටුයි. ඊයේ රෑ ඉයන් මහත්මයව කාමරේ ඇතුළෙදී වෙඩි තියලා මරලා ඇලා!!" එසේ පැවසුවේ මැකල්ටන් පොලිසියේ සැරයන්වරයෙකි.

හිස බමන්නාක් මෙන් දැනුණෙන් රොජර් සිය දැතින් මුහුණ වසා ගත්තේය. මිනීමරුවා තම මිතුරු ඉයන්ව ඝාතනය කරනු ඇතැයි රොජර් කිසිසේත් නොසිතීය. තමා පිළිබඳ ඉව වැටී ඇති බව දැනගත් මිනීමරුවා පොලිස් නිලධාරීන් පවා ඝාතනය කිරීමට තරම් පුවණ්ඩ වී ඇත. පැය කිහිපයක් ගත වන තුරු රොජර් කිසිවකුත් සමඟ එක් වදනක් හෝ කතා නොකළේය.

"රොජර්, මිනීමරුවා මුලින්ම ඇතුළුවෙලා තියෙන්නෙ රොජර්ගෙ කාමරේට." හදිසි මරණ පරීක්ෂණය පැවැත්වූ අධිකරණ නිලධාරියා පැවසුවේ සියුම් ලෙස බිඳ දමන ලද රොජර්ගේ කුටියේ දොරගුළ පෙන්වමිනි.



ඊට පස්සෙ තමයි ඉයන්ව ඉලක්ක කරලා තියෙන්නෙ. හැබැයි ඉයන්ගෙ කාමරේ දොරගුළු නම් කඩලා නෑ. මට හිතෙන්නෙ ඉයන් දොර ඇරලා තියෙනවා. වෙඩි හඬ මුලින්ම ඇහිලා තියෙන්නෙ පහළ තට්ටුවේ මුළුතැන්ගෙයි හිටපු සේවකයින්ට." ඔහු තවදුරටත් කරුණු පැහැදිලි කළේය.

"මිනීමරුවා ගැන කිසිම හෝඩුවාවක් තවම හොයා ගන්න බැරි වුණා." එසේ පවසමින් රොජර් වෙත සමීප වූයේ මැකල්ටන්හි ප්‍රධාන පොලිස් පරීක්ෂක, හෙල්ගසන්ය.

"දැනටම මරණ හතරයි... හෙල්ගසන්, මම මගේ මැරිච්ච තාත්තගෙ ඇටකටුවල නාමෙන් දිවුරලා කියන්නම්... මේ තිරිසන් මිනීමරුවට පස්වෙනියෙක්ව නම් බිලිගන්න මම ඉඩ දෙන්නෑ." රොජර් එසේ පැවසූයේ ඉයන්ගේ කුටියේ කලාලය මත විසිර තිබූ රත් පැහැ ලේ පැල්ලම් දෙස බලමිනි.

මෙම අඳුරු රාත්‍රියේ මිනීමරුවා තමා සොයා පැමිණෙන බව දැන දැනත් සිය මිතුරු ඉයන් එම අන්තරාදායක පරිසරයේ තනිකර දමා යෑම පිළිබඳ රොජර්ගේ සිතේ බලවත් කණගාටුවක් ඇති විය. මෙම ම්ලේච්ඡ මිනීමරුවාට තිසි දඬුවම් ලබා නොදුනහොත් සිය ආත්මයට කිසි දිනක සහනයක් නොලැබෙන බව රොජර්ට දැනිණි. එහෙයින් මිනීමරුවා නීතියේ රැහැණට කොටුකරගෙන මිස මැකල්ටන්වලින් පිට නොවන බව ඔහු තරයේ අදිටන් කර ගත්තේය.

ඵ ඵ ඵ

kathapothak.blogspot.com

# මුරකරුවාගේ සාක්ෂිය

එදින උදෑසන පුවත්පත්වල තරුණ රහස් පරීක්ෂකයාගේ මරණය පිළිබඳ දීර්ඝ විස්තර සටහන්ව තිබිණි. සිය මිතුරාගේ මරණය හේතුවෙන් රොජර්ගේ සිතේ ඇති වූ කම්පනය එදින සවස් වන තුරුම පැවතිණි. ඉයන්ගේ ඝාතනය සිදු කිරීමට යොදාගෙන ඇත්තේ දෙදිනකට පෙර ආරෝග්‍ය ශාලාව තුළදී පාකර්ව ඝාතනය කිරීමට යොදාගෙන තිබූ රිවෝල්වරයම යැයි පරීක්ෂණ වලින් අනතුරුව හෙළි විය. එහෙත් මිනීමරුවා අති සූක්ෂ්ම ලෙස කටයුතු කර ඇති බැවින් ෆෙල්ගසන් ඇතුළු පිරිසට මෙවර ද ඔහුව හඳුනාගත හැකි ආකාරයේ එකදු සාක්ෂියක් හෝ සොයාගත නොහැකි විය. රොජර් අපරාධය සිදු වූ ස්ථානය පරීක්ෂා කළේ ඉන් අනතුරුවයි. අන් කවරදාකවත් සිදු නොවූ ආකාරයට තම මානසික තත්ත්වය ඉතා පහළ අඩියකට පෙරළී ඇති බව ඔහුටම වැටහිණි.

× × × × ×

"නෑ මහත්තයා. ඒ මුරට හිටියෙ මම තමයි... ඒත් ඒ දොළහෙන් පස්සෙ මේ ගේට්ටුවෙන් නම් කිසිකෙනෙක් නානායමට ඇතුළු වුණේ නෑ" එදින රාත්‍රියේ නානායමේ ගේට්ටුව අසල මුරට සිටි ආරක්ෂක නිලධාරියා පැවසුවේ, රොජර් ඇසූ ප්‍රශ්නයක ට පිළිතුරු වශයෙනි.





"හැබැයි ඒකෙන් ඔප්පු වෙන්නෑ, ඒ කවුරුවත් නානායමට ඇතුළු වුණේ නෑ කියලා. එහෙම නේද?" රොජර් විමසීය.

"ඔව්, මහත්තයා."

"මේ ප්‍රධාන ගේට්ටුව හැර තවත් ගේට්ටු තියෙනවද?"

"ඔව්, මේ නානායමේ වත්ත බටහිර පැත්තෙන් මායිම් වෙන්නෙ ශාන්ත ජෝන් හරස් පාරට. ඒ පැත්තෙත් ගේට්ටුවක් තියෙනවා. ඒත් ඒක පාවිච්චියට ගැනෙන් නෑ මහත්තයා." ඔහු පැවසීය.

"හොඳයි, ඔහේ දැන් ටිකකට කලින් කිව්වනෙ, ඒ දොළහෙන් පස්සෙ කවුරුවත්ම මේ ප්‍රධාන ගේට්ටුවෙන් ඇතුළු වුණේ නෑ කියලා. ඒ වගේම මතක් කරලා බලන්න ඒ දොළහෙන් පස්සෙ, විශේෂයෙන් පාන්දර එකත් දෙකත් අතර කවුද ගේට්ටුවෙන් එළියට ගියේ කියලා." රොජර් විමසීය. මුරකරුවා මඳ වේලාවක් කල්පනාවේ නිමග්නව සිටියේය.

"ඒ වෙලාව ඇතුළත ගේට්ටුවෙන් පිටතට ගියේ දෙන්නයි.හැබැයි ඒ වෙඩි හඬ ඇහෙන්න කලින්."

"තමුන්ට මතකද කවුද ඒ දෙන්නා කියලා."

"ඔව්, මහත්තයා. ඉන් එක්කෙනෙක් නානායමේ කළමනාකාර වැන්ඩගර්ට් මහත්තයා. අනිත් එක්කෙනා සුළු සේවකයෙක්. වැන්ඩගර්ට් මහත්තයා පිටවුණේ ඒ දොළහයි තිහට විතර. සුළු සේවක ආතර් පිටවෙද්දි වෙලාව එක පහුවෙලා තියෙන්න ඇති මට මතක තියෙන විදියට... ඔව්, මහත්තයා... ආතර් පිටත් වුණ වෙලාවෙ විශේෂත්වයක් නෑ. මොකද ඊයෙ ආතර්ට යෙදිලා තිබුණෙ හවස වැඩ මුරය. හවස් වරුව වැඩ කරපු දවසට ආතර් නානායමෙන් පිටවෙන්නෙ ඒ දොළහට එකට විතර තමයි." ආරක්ෂක නිලධාරියා පැවසීය. නානායමේ කළමනාකරු වැන්ඩගර්ට්

මහතා මෙන්ම පුර සේවක ආතර් ද පිටව ගොස් තිබුණේ මිනීමැරුම සිදුවීමට පෙරයි. එහෙයින් ඔවුන් කිසිවෙක් මීට සම්බන්ධ නොමැති බව රොජර්ට ප්‍රත්‍යක්ෂ විය.

"හොඳයි, වෙඩි හඬ ඇහුණට පස්සෙ තමුන් මොකද කළේ?" රොජර් විමසීය.

"ඇත්තටම එක ළඟම වෙඩි හඬවල් දෙකක් ඇහුණා මහත්තයා. මීට කලින් කවදාවත් මේ හෝටලේ මේ වගේ දෙයක් සිද්ධ වෙලා නෑ. මට හිතුණා වෙඩි හඬ ඇහුණේ උඩ තට්ටුවෙන් වෙන්න ඇති කියලා. ඒ වෙලාවෙ මම තානායමේ ප්‍රධාන දොරෙන් ඇතුළුවෙලා පඩිපෙළ නැගලා උඩ තට්ටුවට ගියා. ඒ වෙන කොට හුඟ දෙනෙක් හඬ ඇහුණු පැත්තට දිවයමින් හිටියා. මම එතනට යද්දි පහළොස් දෙනෙක් විතර සිද්ධිය වුණු තැනට එකතු වෙලා හිටියා. ඔව් මහත්තයා... ඒ අතර සේවකයො වගේම හෝටලේ නවාතැන් අරන් හිටපු අයත් හිටියා..."


ඉන් පසු රොජර් ප්‍රශ්න කළේ මිනීමැරුම සිදුවූ ස්ථානයට ප්‍රථමයෙන් පැමිණි තැනැත්තාගෙනි. ඔහු පැට්‍රික් ටේලර් නම් වූ මැදිවියේ පසුවූ තැනැත්තෙක් විය. ඔහු ඉයන්ගේ කුටියට යාබදව පිහිටි කුටියේ නවාතැන් ගෙන සිටි තැනැත්තා බව රොජර් දැන සිටියේය.

* * *

kathapothak.blogspot.com



## තානායමේ දළ සැලැස්ම



# පැට්රික් වේලර්ගේ කටඋත්තරය

"මට සාමානයෙන් තදින් නින්ද යන්නෑ මහත්තයා.... මට ඇහැරුණේ මුල් වෙඩි හඬට. ඒත් එක්කම තවත් වෙඩි හඬක් ඇහුණා. ඇත්තම කියනවා නම් ඒ වෙලාවෙ මගේ ඇගේ ලේ වතුර වුණා. මොනවත්ම හිතාගන්න බැරිව තත්පර දහයක් පහළොවක් විතර මම ගල්ගැහිලා බලන් ඉන්න ඇති. ඊට පස්සෙ මම කොහොමහරි ඇඳෙන් නැගිටලා ඇවිත් දොර ඇරියා. ඒ වෙනකොට වේලාව පාන්දර දෙකත් පහුවෙලා තිබුණා වගේ මම යාන්තමින් දැක්කා. බිත්තිවල රඳවලා තිබුණු ලන්තෑරුම් වල එළියෙන් පැසේජය ආලෝකමත් වෙලා තිබුණා. මම දැක්කා, මගේ කාමරේට අල්ලපු කාමරේ දොර ඇරලා දාලා තියෙන බව. ඒ වගේම ඒ පැත්තෙන් තද වෙඩි බෙහෙත් ගඳක් ආවා. මහ භයානක දෙයක් සිද්ධවෙලා තියෙන බව මට ඉවෙන් වගේ දැනුණා. මම කාමරේට ඇතුළු වුණේ හිතේ භයෙන්. ඒ වෙලාවෙ තමයි මට දකින්න ලැබුණෙ කාමරය මැද වැටිලා හිටපු ඉයන් මහත්තයව. ඒත් ඒ වෙනකොටත් එයා ජීවතුන් අතර හිටියෙ නෑ. වෙඩි වැදිලා තිබුණෙ ළපැත්තටයි." ඔහු පැවසීය.

"වේලර් මහත්තයා, කාමරෙන් එළියට එද්දි කවුරුවත්ම එතන හොයන්න හිටියෙ නැද්ද? මම ඊතෙක් දෙයක් කළේ මිනීමරුවව් දක්කද කියන එකයි"



"නෑ. මහත්තයා කවුරුවත්ම හිටියෙ නෑ. මම එතනට ඇවිත් තත්පර කිහිපයක් ගතවෙද්දි තානායමේ සේවකයෝ දෙන්නෙක් එතැනට දුවගෙන ආවා. කොහොමත් මිනිත්තු දෙක තුනක් ගතවෙද්දි විසිහිස් දෙනෙක් එතනට එකතු වුණා." වේලර් පැවසීය.

රොජර් මඳ වේලාවක් කල්පනාවේ නිමග්නව සිටියේය. මේ වන විට හෙල්ගසන් ඇතුළු මැකල්ටන්ගි පොලිස් නිලධාරීන් පිරිස ද තානායමට අයත් වත්ත පරීක්ෂා කරමින් සිටියහ.

"වේලර් මහත්තයා, හොඳට මතක් කරලා බලන්න මහත්තයට පස්සෙ සේවකයෝ ද එතනට මුලින්ම ආවෙ? නැත්නම් වෙන කවුරුහරි ආවද?"

"නෑ මට හොඳට මතකයි සේවකයෝ දෙන්නෙක් ආපු බව" ඔහු පැවසීය.

❦ ❦ ❦

kathapothak.blogspot.com

kathapothak.blogspot.com

# කරුණු විශ්ලේෂණයක්

වේලර් මහතාගේ සහ තානායමේ සේවකයන්ගේ කට උත්තර පොතක සටහන් කරගත් රොජර්, සිය මිතුරාගේ ඝාතනය පිළිබඳ මනෝ විශ්ලේෂණයක් කිරීමට වූයේය. ඉයන්ගේ ඝාතනය සිදුවූ වේලාව පිළිබඳ සැකයක් නැත. ඒ නියත වශයෙන්ම අලුයම දෙකට පමණය. ඝාතකයාගේ රිවෝල්වරයෙන් නිකුත් වූ උණ්ඩ පුහලම් ඉයන්ගේ හිසට එල්ලවී ඇති අතර මිනීමැරුම සිදුවන අවස්ථාවේ ඝාතකයා සහ ඉයන් අතර පරතරය අඩියකට හෝ දෙකකට වැඩි නොවූ බව මළ සිරුරේ වෙඩි බෙහෙත් සලකුණු සටහන්ව තිබූ ආකාරයෙන් පැහැදිලි විය.

ඝාතනය සිදු කළ සැණින් මිනීමරුවා පලාගොස් ඇති බව සනාථ වන්නේ, යාබද කුටියේ සිටි වේලර් මහතා වෙඩි හඬ නිකුත් වී තත්පර ගණනාවක් ඇතුළත එහි පැමිණෙන විටත් මිනීමරුවා පිළිබඳ කිසිදු සලකුණක් ඉතිරිව නොතිබූ බැවිනි. ඉන් පසු රොජර්ගේ මනස යොමු වූයේ මිනීමරුවා එසැණින් පලා ගියේ නම් ඒ කොතැනකින් ද යන්න සෙවීම සඳහායි. ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටි, තානායමේ ප්‍රධාන ගේට්ටුවේ මුරකරු දීර්ඝ කාලයක් මුළුල්ලේ සේවයේ නියුතුව සිටින විශ්වාසවන්ත පුද්ගලයකු වූ බැවින් මෙහිදී ඔහු පවසන්නා වූ කරුණු පිළිබඳ විශ්වාසය තැබිය හැකි බව රොජර්ට වැටහිණි. එහෙත් ඔහු පැවසුවේ වෙඩි හඬ ඇසීමට ප්‍රථම පැය සහිත කිසිවකු ඉන් පිටතට නොගිය



තුවයි. එහෙත් වෙඩි හඬ ඇසීමෙන් පසු [illegible] ද [illegible] ද්‍රවශීය බැවින් ඇතැම් විට මිනීමරුවාට [illegible] ප්‍රධාන දොරටුවෙන් වුවද පිටව යාමට අවකාශය තිබිණි. එහෙත් ඒ වන විට වෙඩි හඬින් කලබලයට පත්වී සිටියවුන් [illegible] ශාලේ පැසේජ් මස්සේ සිද්ධිය වූ ස්ථානයට දිව එමින් සිටි බැවින් මිනීමරුවාට ඉදිරිපස ප්‍රධාන දොරටුව දෙසට [illegible] අවස්ථාවක් ලැබුණේ යැයි සිතිය නොහැක. එමෙන්ම තානායම තුළ පැවති කිසිවකු ලැගුම් ගෙන නොසිටි කුටි සියල්ල අගුළුලා තිබූ බැවින් මිනීමරුවා එවැනි හිස් කුටියක් තුළ සැඟවී සිටියා යැයි සිතීමට ද ඉඩක් නොමැත. එසේ නම් මිනීමරුවා පැන ගියේ කොතනකින්ද?

තමා මෙම මිනීමැරුම සිදු කළේ නම් පැන යන්නේ කොතැනකින් දැයි රොජර් කල්පනා කරන්නට වූයේය. එසේ නම් තමා තෝරා ගන්නේ එකම එක ස්ථානයක් නොවේ දැයි ඔහුට වැටහිණි. එනම් පසුපස අන්තයේ පිහිටි පියගැට පෙළයි. එහෙත් තානායමේ පාලකයා පැවසුවේ පියගැට පෙළ පාමුල පිහිටි දොරටුව සාමාන්‍යයෙන් අගුළුලා තබන බවයි. පසුපස අන්තයෙන් සාමාන්‍යයෙන් කිසිවකුට තානායමට ඇතුළුවීමට හෝ තානායමෙන් පිට වීමට අවශ්‍යතාවක් නොතිබීම ඊට හේතුවයි. ඒ හේතුව නිසාම ශාන්ත ජෝන් හරස් පාරට විවෘත වන ගේට්ටුව ද සාමාන්‍යයෙන් අගුළුලා තිබිණි. ඒවා විවෘත වූයේ අති විශේෂිත අවස්ථාවන පමණි.

රොජර් සිය දෙවැනි මෙහෙයුම දියත් කළේ මෙවන් මානසික පසුබිමක් යටතේය. ප්‍රථමයෙන් ඔහුගේ පරීක්ෂණවලට ලක් වූයේ පසුපස අන්තයේ, එනම් තමා ලැගුම් ගෙන සිටි කුටියට යාබදව පිහිටි පියගැට පෙළ පාමුල පිහිටි දොරටුවයි.

* * *

kathapothak.blogspot.com

# නැවතත් මිනීමරුවා පසුපස

පියගැට පෙළ පාමුල පිහිටි දොරටුව මෑතකදී විවෘත කර නොමැති බව එය දුටු සැණින් රොජර් වටහා ගත්තේය. ඉන් අනතුරුව ඔහුගේ අවධානය යොමු වූයේ පියගැට පෙළ මධ්‍යයේ වූ තැම්මේ පිහිටි ජනේලය වෙතය. එහි ආරක්ෂක දැලක් සවිකර නොතිබූ අතර යමෙකුට ඉතා පහසුවෙන් ජනෙල් පඩිය මතට ගොඩවීමේ හැකියාව ඇති බවද පෙනිණි. මේ මොහොතේ එහි එක් ජනෙල් පියනක් ඇතුළතින් අගුළුලා තිබූ අතර අනෙක් පියන අඩවල්ව තිබිණි. එමෙන්ම සැමගේම අවධානය අඩවන්ව තිබූ ජනෙල් පියන වෙත යොමු වූයේ ජනෙල් පඩිය මත තිබී රොජර් විසින් අපැහැදිලි සා සටහනක් සොයා ගැනීමත් සමඟයි. එය ඉදිරිපස කොටස හතරැස් මාදිලියේ පාවහනකින් ඇති වූ සටහන් විය.

මේ වන විට හෙල්ගසන් ඇතුළු මැකල්ටන්හි සෙසු පොලිස් නිලධාරීන් පිරිස යළි පොලිස් මූලස්ථානය බලා පිටත්ව ගොස් සිටියෙන් කිසිදු බාධාවකින් තොරව රිසි සේ පරීක්ෂණය ඉදිරියට මෙහෙයවීමේ හැකියාව රොජර්ට තිබිණි. ජනෙල් පඩිය පරීක්ෂා කළ රොජර් එහි රැස්ව සිටියවුන් මවිතයට පත් කරමින් හිටිහැටියේ ජනෙල් පඩිය මතට නැග ගත්තේය. ජනෙල් පඩිය පොළව මට්ටමෙන් අඩි දොළහක් පමණ උසින් පිහිටි බව ඔහුට පෙනිණි.



එහෙත් අගල් කිහිපයක ඝනකමින් යුතු තණ බිස්සකින් පොළව ආවරණය වී පැවතියෙන් අවදානමකින් තොරව ඉන් පහළට පැනිය හැකි බව ඔහුට අවබෝධ විය. ජනේලයෙන් පහළට පැමිණීමේ අවශ්‍යතාවයක් රොජර්ට නොතිබිණි. එහෙයින් පියගැටපෙළ මඟ ගොඩනැඟිල්ලෙන් ඉවතට පැමිණි රොජර් යථෝක්ත ජනෙල් කවුළුව පහළ භූමිය පරීක්ෂාවට ලක් කළේය. ඝනව වැවී තිබූ තණනිල්ල හේතුවෙන් කිසිදු ආකාරයක අඩි සලකුණක් එහි සටහන්ව නොතිබිණි. එහෙත් තණබිස්සේ ස්ථාන කිහිපයක් තැලී පොඩිවී ඇති බව ඔහු නිරීක්ෂණය කළේය.

"මහත්තයා, මේ පැත්ත හෙල්ගසන් මහත්තයත් සෝදිසි කළා. ඒත් වැඩක් වුණේ නෑ." රොජර් ඉතා සියුම් ලෙස තණබිස්ස පරීක්ෂාවට ලක් කරනු දුටු, තානායමේ කළමනාකරු පැවසීය. ඒ පිළිබඳ තැකීමක් නොකළ රොජර් ඉන් පසු ගමන් කළේ ඕක් වගාවෙන් ආවරණ වී තිබූ භූමි භාගය වෙතයි. දැවැන්ත ඕක් වෘක්ෂයන් හේතුවෙන් එම පෙදෙසට අඳුරු බවක් ලැබී තිබිණි. තානායමේ පසුපස ද්වාරයේ සිට ඕක් වගාව මැදින් ශාන්ත ජෝන් වීථිය දෙසට විහිදී තිබූ කුඩා අඩි පාර පරීක්ෂා කර බැලීමට රොජර් තවත් හෝරාවකට අධික කාලයක් වැය කළේය. එම අඩි පාර සහ ශාන්ත ජෝන් වීථිය හමුවන ස්ථානයේ පිහිටි ගේට්ටුව ද මෑතකදී විවෘත කර නොමැති බව ගේට්ටු පියන් යුගළ සහ පොළව අතර රැස්ව තිබූ පස් තට්ටුවලින් පැහැදිලි විය. එහෙත් වැසි ජලය සමඟ ගලා ආ රොන් මඩ, වැලි, පස් ආදිය ගේට්ටුව අසල රැස්වී තිබිණි. ඒ මත සපත්තු අඩි සටහන් රාශියක් සටහන්ව තිබෙනු දුටු රොජර් නොසන්සුන් විය.

"මෙතනට කවුද ආවේ?" රොජර් විමසුවේ ඔහු අසල සිටි කළමනාකරුගෙනි.

"ඇයි මහත්තයා, ෆෙල්ගසන් මහත්තයයි තවත් සාජන් කෙනෙකුයි සිද්ධිය වුණාට පස්සෙ මේ පැත්ත සෝදිසි කළානේ. ඔය ඒ දවසෙ අඩි සටහන් වෙන්න ඇති." ඔහු පැවසීය.

"හොඳයි. ඒ අය මේ ගේට්ටුවෙන් පිටත පරීක්ෂා කළාද?"

"නෑ මහත්තයා. මිනීමරුවා මේ පැත්තට ඇවිත් නැති බව විශ්වාසයි කියලා ඒ මහත්තුරු කිව්වා." ඔහු පිළිතුරු දුන්නේය.

"කමක් නෑ මම තව ටිකක් මේ පැත්ත සෝදිසි කරන්නම්.." එසේ පැවසූ රොජර් ගේට්ටුව මතට නැග ඉන් ඉවතට පැන ගත්තේය.

* * *

kathapothak.blogspot.com

# පිය සටහන්

ගේට්ටුවෙන් ඉවතට පැනගත් රොජර් ඒ අසල භූමිය පරීක්ෂා කර බැලීමට වූයේය. ඊට දින කිහිපයකට පෙර ඇදහැළුණු ධාරාණිපාත වර්ෂාවක් හේතුවෙන් ගේට්ටුවෙන් පිටත භූමිය රොන් මඩ සහිත දියලු පසින් වැසී ගොස් තිබිණි. රොජර් සිය පිය සටහන් එහි සටහන් වූ ආකාරය දෙස මද වේලාවක් බලා සිටියේය. ඉන් පසු ඔහුගේ අවධානයට ලක් වූයේ ගේට්ටුවට යාර විස්සක පමණ දුරින් නාතායමේ ප්‍රාකාරයට සමීපව සටහන්ව තිබූ සලකුණු කිහිපයක් වෙතයි. රෝද දෙකේ අස්රියක් දිගු වේලාවක් එහි නවතා තබා ඇති බව රොජර්ට වැටහිණි. අසුගේ කුර ගැටීම හේතුවෙන් භූමිය පළුදු වූ ආකාරය සහ රථයේ රෝද යුගලේ සලකුණු රොන් මඩෙහි සටහන්ව තිබූ ආකාරය රොජර් නිරීක්ෂණය කළේය.

අස්රියේ සිට ගේට්ටුව දෙසට විහිද තිබූ සපත්තු අඩි සටහන් මීළඟට රොජර්ගේ අවධානයට ලක් විය. එමෙන්ම ඉතා සියුම්ව පරීක්ෂා කර බැලීමේදී ගේට්ටුවේ සිට අස්රිය දෙසට විහිදී තිබූ තවත් අඩි සටහන් කිහිපයක් ද ඔහුට හඳුනා ගත හැකි විය. අස්රිය දෙසට විහිද තිබූ අනුයාත අඩි සටහන් දෙකක් අතර පරතරය සාපේක්ෂව ඉතා අධික වූ අතර එම සටහන් පොළොවේ සටහන්ව තිබුණේ ඉතා අපැහැදිලි ලෙසයි. එහි පුදුමයක් නැත. මිනීමරුවා ඝාතනය සිදුකර පලා යෑමේදී ගේට්ටුවෙන් පැන, අධික වේගයෙන් කරත්තය වෙත දිව යන්නට ඇත. එලෙස වේගයෙන් දිවයන විට

පොළොවේ ගැටෙනුයේ සපත්තුවල ඉදිරිපස කොටස් පමණි. එම රොත් මඩ සහිත දියලු පසෙහි සටහන්ව තිබූ සලකුණු පෙර දින රාත්‍රියේ මෙහි සිදු වූයේ කුමක් දැයි යන්න ලොවට පවසන අපූර්ව සාක්ෂියක් නොවේ දැයි රොජර්ට වැටහිණි.

රොජර්ගේ පරීක්ෂාව එතැනින් නොනැවතිණි. මීළඟට ඔහුගේ පරීක්ෂාවට ලක් වූයේ රියෙහි රෝද යුගළෙන් ඇතිවූ සලකුණු වෙතයි. කරත්තය වෙත පිවිමේ දිව ආ තැනැත්තා ක්ෂණිකව අළු ප්‍රධාන වීථිය දෙසට හරවාගෙන ඇති බව පෙනිණි. රථයේ රෝද යුගළ එකතැන කැරකැවීම හේතුවෙන් සෑදුණු වළවල් යුගල සහ ඒ වටා රැස්ව තිබූ කුඩා පස් කට්ටි ඒ බව කියා පෑවේය. කෙසේ වෙතත් අස්ථිර මාර්ගයේ ඝන බදාම තට්ටුව වෙත පිවිසි ස්ථානයෙන් පසු කිසිදු සලකුණක් සටහන්ව නොතිබිණි.

අසුගේ කුරවලට සවි කරන ලද ලාඩම් වල ලාංඡන කිහිපයක් දුව ඉටි ආධාරයෙන් සකසා ගැනීමට රොජර් සමත් විය. එමෙන්ම රථයේ රෝද දෙක අතර නිවැරැදි පරතරය ද ඔහු මැන බැලුවේය. පරීක්ෂණය අවසන් වූයේ ඉන් අනතුරුවයි.

ස ස ස

kathapothak.blogspot.com

# තත්ත්වය තවත් සංකීර්ණ වන ලකුණු

ඉයන්ගේ මළ සිරුර මෘත ශරීරාගාරය වෙත රැගෙන ගොස් තිබුණ ද කවදුරටත් එම ස්ථානයේ ලැගුම් ගැනීමට රොජර්ගේ සිතේ කිසිදු කැමැත්තක් නොතිබිණි. එහෙයින් ශාන්ත ජෝජ් වීථිය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔහු පොලිස් මූලස්ථානය බලා පිටත් වූයේය. ඔහු එහි ළඟා වන විට හෙල්ගසන් සිය තිල අසුනට වී කල්පනාවක නිමග්නව සිටියේය.

"හෙල්ගසන්!" රොජර් ඔහු ඇමතීය.

"ආ... රොජර්! මම මේ කල්පනා කළේ මේ ප්‍රශ්නෙන් මම කොහොමද ගොඩ එන්නෙ කියලා. මට තවම විශ්වාස කරන්න බෑ, ඉයන් මැරුණයි කියන එක." හෙල්ගසන් පැවසීය.

සිය මිතුරාගේ වියෝවෙන් සිතේ හටගෙන තිබූ කම්පනය හේතුවෙන් ඒ මොහොතේ රොජර්ගේ මුවින් එක වදනක් හෝ පිට නොවිණි.

"රොජර්, දැන් මොනවද කරන්න බලාපොරොත්තු වෙන්නෙ. මට නම් මේ ගැන මොනවත්ම හිතෙන්නෑ. මිනීමැරුවා ප්‍රසිද්ධියේම ස්කොට්ලන්ඩ්යාඩ් එකට අභියෝග කළා. රොජර් දක්ෂ ද රඳ පත්තර?" එසේ පැවසූ හෙල්ගසන් පුවත්පත් කිහිපයක් රොජර් වෙත දිගු කළේය.

**මැකල්ටන්හි මිනීමරුවා ස්කොට්ලන්ඩ්යාඩ්හි තරුණ පොලිස් නිලධාරියකු ඝාතනය කරයි**

ඊයේ දින අලුයම දෙකට පමණ මැකල්ටන්හි තානායමේ දෙවැනි මහලේදී මෙම ඝාතනය සිදුවී ඇත. මිනීමරුවා අති සූක්ෂම ලෙස මුරකරුවන්ගේ අවධානයට ලක් නොවී තානායමේ ප්‍රධාන ගේට්ටුවෙන් ඇතුළු වී ඇති බව හෙළි වී ඇත. මෙලෙස ඝාතනයට ලක් වී ඇත්තේ දක්ෂ තරුණ නිලධාරියකු වන ඉයන් කාක් මහතායි. කෙසේ වෙතත් මැකල්ටන්හි ඝාතන සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන පොලිස් නිලධාරීන්ගේ ජීවිත වලට ද මෙම මිනීමරුවා ප්‍රබල තර්ජනයක් වී අවසන් බව විශ්වාස කටයුතු ආරංචි මාර්ග වලින් දැනගැනීමට ලැබී ඇත. රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට පොලීසියට ශක්තිය බලය නොමැති නම්, සාමාන්‍ය ජනතාවගේ ආරක්ෂාව පිළිබඳ කවුරුන් නම් වගකියනු ඇත්ද...?

මෙලෙස පුවත්පත් සිහිපයකම ලිපි සිහිපයක් පළවී තිබිණි. ඒ දැක රොජර්ගේ මනස තව තවත් ව්‍යාකූල විය. තමා මින් පෙර සිසිදු දිනක මෙතරම් අසාධුතාවයකට පත් වී නොමැති බව ඔහුටම වැටහිණි.

"රොජර්, මොනවද කල්පනා කළේ?" හෙල්ගසන් විමසිය.

"කල්පනා කරන්න දේවල් ද නැත්තෙ හෙල්ගසන්!" රොජර් පැවසුවේ නොසතුටු සිනිනි.

පුවත්පත්වල පළ වී තිබුණේ මිනීමරුවා තානායමේ ප්‍රධාන ගේට්ටුවෙන් ඇතුළු වී ඇති බවයි. එවැන්නක් වගකීමකින් තොරව





පුවත්පත්වල පළ කිරීමට අවසර දුන්නේ කවුරුන් දැයි දන්න දැනගැනීමට රොජර්ට අවශ්‍ය විය. එහෙත් දැඩි ආයාසයකින් රොජර් සිය සිත පාලනය කර ගත්තේය. එමෙන්ම උදෑසන පළවූ පුවත්පත් සිය පෙම්වතිය වූ ප්‍රින්කාගේ නෙත ගැටිණි නම් ඇය මහත් සෙයින් කලබල වන බව රොජර් අත්දැකීමෙන්ම දැන සිටියේය. එහෙයින් විදුලි පණිවුඩයකින් හෝ ප්‍රින්කා දැනුවත් කළ යුතු යැයි ඔහුට සිතිණි.

තවත් මිනිත්තු කිහිපයක් කල්පනාවේ නිමග්නව සිටි රොජර් උන් තැනින් නැගී සිටියේ අවසන් තීරණයකට එළඹෙමිනි.

"රොජර් දැන් මොකක්ද කරන්න බලාපොරොත්තු වෙන්නෙ?" හෙල්ගසන් විමසුවේය.

"මම අද ලන්ඩන් යනවා."

"මොනවා! ඇයි ඒ?" හෙල්ගසන්ගේ දෑස විශ්මයෙන් පුළුල් වනු රොජර් දුටුවේය.

"ඉයන්ගෙ මරණෙ නිසා මගේ ඔළුව හොඳටම අවුල් වුණා. මට හිතාගන්න බෑ මේකෙන් කොහොම ගොඩ එන්න ද කියලා. මේ මිනීමරුවා නම් කවදාවත්ම අපිට අල්ල ගන්න ලැබෙන එකක් නෑ. මම කොයි තරම් සෝදිසි කළත් මිනීමරුවා ගැන එක හෝඩුවාවක්වත් මට හොයාගන්න බැරි වුණා. අඩුම තරමේ මිනීමරුවා හෝටලේට ඇතුළු වුණේ කොහෙන්ද පිටවුණේ කොහෙන්ද කියලවත් මට හොයා ගන්න බැරි වුණා" රොජර් පැවසුවේ සිය නළල සුරතින් පිස දමමිනි.

"ඇයි රොජර්! මට හිතෙන්නෙ නම් මිනීමරුවා හෝටලේට ඇතුළුවෙලා තියෙන්නෙ ප්‍රධාන ගේට්ටුවෙන්. අර නාකි මුරකාරයා තමන්ගෙ රාජකාරිය හරියට කළා කියලා හිතන්න අමාරුයි. මිනීමරු

නින්ද යනකල් ඉඳලා මිනීමරුවා එන්නට ඇතුළු වෙන්න ඇති." හෙල්ගසන් පැවසිය.

"මම ආපහු අනිද්දට එනවා. ඉයන්ගෙ අවසන් කටයුතු ගැන බලන්නත් ඕනෙනෙ." රොජර් පැවසුවේ පොලිස් මූලස්ථානයෙන් පිටවන විටයි.

kathapothak.blogspot.com

# රොජර්ට විදුලි පණිවුඩයක්

රොජර් පොලිස් මූලස්ථානයෙන් පිට වන විට වේලාව පස්වරු තුනට ආසන්නව පැවතිණි. එහෙත් සවස පහට පමණ පොලිස් මූලස්ථානය භාරයේ රොජර් නමට විදුලි පණිවුඩයක් ලැබිණි.

"හෙල්ගසන් මහත්තයා. මෙන්න මේක රොජර් මහත්තයාගෙ නමට ඇවිත් තියෙන්නෙ." සැරයන්වරයෙක් විදුලි පණිවුඩය හෙල්ගසන් අත තබමින් පැවසිය. හෙල්ගසන් එය කියවා බැලීය.

> *රොජර්,*
>
> *මම අද උදේ පත්තර කියෙව්වා. මගේ හිතට හරි නෑ. ඒ නිසා මේ දැන්ම මම මැකල්ටන් එන්න පිටත් වෙනවා. රෑ නවයට මැකල්ටන් දුම්රිය පළ ළඟට එන්න.*
>
> *ලින්ඩා*

විදුලි පණිවුඩය රොජර්ගේ පෙම්වතියගෙන් බව හෙල්ගසන් වටහා ගත්තේය. ඉයන්ගේ මරණය පිළිබඳ පුවත්පත්වල පළවූ ලිපි දැක, ඇය බෙහෙවින් කලබල වී ඇති බව ඔහුට වැටහිණි. ඇත්තෙන්ම රොජර් මරණයෙන් ගැලවුණේ ඔහුගේ පූර්ව වාසනාවකට මෙනි. නොඑසේ නම් නියත වශයෙන්ම මිනීමරුවාගේ වෙඩි උණ්ඩයට ප්‍රථමයෙන් ගොදුරු වන්නේ රොජර්ය.

රොජර් ලන්ඩනය බලා පිටත්ව ගොස් ඇති බැවින් ඔහුට මෙම පණිවුඩය ලබා දීමට හැකියාවක් නොමැති බව හෙල්ගසන්ට

වැටහිණ. එමෙන්ම මේ වන විට ප්‍රින්කා ද ලන්ඩනයෙන් පිට වී ඇත. ඇයව පිළිගැනීමට රාත්‍රී නවයට දුම්රිය පොළ වෙත කිසිවකු ගමන් නොකළ හොත් ඇය මැකල්ටන්හි මංමුලා වනු ඇතැයි හෙල්ගසන්ට සිතිණි. එහෙයින් රාත්‍රී නවයට දුම්රිය පොළ වෙත ගමන් කළ යුතු යැයි හෙල්ගසන් තීරණය කළේය.

කාලය ක්‍රමයෙන් ගෙවී ගොස් රාත්‍රිය උදාවිය. රාත්‍රී අටයි තිහට පමණ පොලිස් මූලස්ථානයෙන් පිට වූ හෙල්ගසන් කුලී රියක නැගී සිය බංගලාව බලා පිටත් විය. මුදල් ගෙවා කුලී රිය පිටත් කළ පසු ඔහු පාප්පුව ගමන් කළේ සිය ඉස්තාලය වෙතයි. එහි සිටි අසු රැගෙනවිත් සිය රෝද දෙකේ කුඩා රථයට බැඳගත් හෙල්ගසන්, නොපමාව දුම්රිය පොළ බලා පිටත් විය. ප්‍රමාදයකින් තොරව එහි ළඟා වීමට ඔහුට හැකි විය. ඒ වන විට වේලාව රාත්‍රී නවයට බොහෝ ආසන්නව පැවතිණි. තවත් මිනිත්තු දහයක පමණ කාලයක් ගතවන්නට දුම්රියක් එහි ළඟා විය. හෙල්ගසන් දුම්රිය පොළේ ප්‍රධාන දොරටුව අභියස හිඳ දුම්රියෙන් බැස පැමිණෙන මඟීන් දෙස බලා සිටියේය. නිල ඇඳුමෙන් සැරසී සිටි මෙම දුවැන්ත පොලිස් නිලධාරියා නිරායාසයෙන්ම සැමගේ අවධානයට ලක් විය. මින් පෙර කිසි දිනෙක ප්‍රින්කා දැක නොතිබූ බැවින්, ඇයව හඳුනාගත නොහැකි වේ දැයි යන සැකය ඔහු තුළ විය. එහෙත් එම දුම්රියෙන් බැස ගත්තේ සීමිත පිරිසක් පමණි. එහෙයින් ඔහුට ඇය හඳුනාගත හැකි විය.

"මේ ළමයාගෙ නම ප්‍රින්කද?" හෙල්ගසන් විමසුවේ කුඩා ගමන් මල්ලක් ද රැගෙන, අවට සිටියවුන්ගේ මුහුණු දෙස ඉතා සුපරීක්ෂාකාරීව බලමින් දුම්රිය පොළෙන් ඉවතට පැමිණි ශෝභාසම්පන්න තරුණියකගෙනි.

"ඔව්, මම ප්‍රින්කා තමයි. මේ මහත්තයා කවුද?" ඇය පිළිතුරු දුන්නාය.

* * *

kathapothak.blogspot.com

# හෙල්ගසන්ගේ බංගලාව

හෙල්ගසන් විසූ බංගලාවේ විසිත්ත කාමරයේ තිබූ දැවැන්ත බිත්ති ඔරලෝසුවේ රාත්‍රී නවය පසු වී මිනිත්තු තිහක් ගත වී ඇති බව පවසන්නා වූ සංඥාව නාද වන විට දුම්රිය පොළේ සිට පැමිණි අස්රිය එහි බරාදය අසල නතර කෙරිණි. සැබැවින්ම එය හෙල්ගසන්ගේ අස්රිය විය. ඉන් බැසගත් හෙල්ගසන් බංගලාවේ දොරටුව විවර කළේය. ප්‍රින්කාද රියෙන් බැස ගත්තාය.

"හෙල්ගසන් මහත්තයා, රොජර් අද එන එකක් නැද්ද?" ප්‍රින්කා විමසුවේ ඔහුගේ පසුපසින් එම අඳුරු ගෘහය වෙත ඇතුළු වෙමිනි.

"මම හිතන්නෙ අද එන එකක් නෑ. ඒ ගැන කලබල වෙන්න එපා. ප්‍රින්කට පුළුවන් රොජර් එනකල් මෙහෙට වෙලා ඉන්න." හෙල්ගසන් පැවසුවේ විසිත්ත කාමරයේ ලන්තෑරුම් දල්වාලමිනි. එහෙත් මේ වන විට ද ඇය හෙල්ගසන්ගේ නිල නිවසේ පැවති දොම්නස් සහගත ස්වභාවය හේතුවෙන් තැතිගෙන සිටියාය.

ඉන් පසු හෙල්ගසන් සිය කුටියට යාබද කුටිය ඇයට සකස් කර දී, විසිත්ත කාමරයේ ගිනි උඳුන ද දල්වූවේය. ගෘහය තුළ පැවති සීතල ඉන් මඳක් තුරල් විය.

තම කුටිය සකස් කර ගත් ප්‍රින්කා යහනේ වැතිරුණේ ඩැනියෙල් ජොහ්නි දැන් කොහැනක සිටිනවා දැයි කල්පනා කරමිනි. මේ වන විට වේලාව රාත්‍රී එකොළහට ආසන්නව පැවතිණි. විසිත්ත කාමරයේ

ගිනි උඳුන අසලට වී එතෙක් වේලා බුත්ව් තොලගාමින් සිටි හෙල්ගසන් උන් තැනින් නැගී සිටියේය. ඉන් පසු සිය කුටිය වෙත පිවිසි ඔහු යහනේ වැතිරීමට සැරසුණේ කෙටි නින්දක් ලබන අටියෙනි. එහෙත් යහන මත වූ යමක් දුටු ඔහු තැති ගත්තේය. සැබැවින්ම එය නිල් වීදුරු වලින් නිමැවූ සිහිවටනයක් විය. කුරුලු පේනුවක් ආදරයෙන් වෙළී ගසක අත්තක් මත වසා සිටින අයුරු නිල් වීදුරුවෙන් කැටයම් කර තිබිණි. එපමණක් ද නොවේ එහි පහළ අන්තයේ ඩී. එච්. ගෙන් ආදරණීය කැමිලට ලෙස සටහන්ව තිබිණි. ගත වූයේ නිමේෂයකි. තැති ගැනීමේ ලකුණු හෙල්ගසන්ගේ මුහුණෙන් පහව ගිය අතර කෝපයේ ගිනිදැල් ඔහුගේ දෙනෙතින් පිට විය. සිය මුළු සිරුරම ඩහදියෙන් නැහැ වී යන බව ඔහුට දැනිණි. යහන මත වූ සිහිවටනය සුරතට ගත් ඔහු මීළඟ නිමේෂයේ එය වේගයෙන් පොළවේ ගැසුවේය. ඉන් නැගුණු හඬින් යාබද කුටියේ සිටි ප්‍රින්කා ද හිතියට පත් වූවාය. එහෙත් සිය යහනෙන් බිමට බැසීමට ඇය බිය වූවාය.

මීළඟට ඇගේ සවන් වැකුණේ යමෙකු සිය කුටිය දෙසට පැමිණෙන හඬයි. ඒ පොලිස් පරීක්ෂක හෙල්ගසන් මිස අන් කිසිවකු නොවන බව ඇයට වැටහිණි. මොහොතක් ගත විය. ප්‍රින්කාගේ කුටියේ ද්වාරය වේගයෙන් විවර වී දොර පියන ඇතුළත බිත්තියේ හැපිණි. කුටියෙහි ලන්තෑරුමක් දල්වා තිබුණෙන් දොරටුව අසල සිටි තැනැත්තා හඳුනා ගැනීම අපහසු නොවීය. ඔහු හෙල්ගසන්ම විය. එමෙන්ම ඔහු අත වූයේ කිපුණු මුවහතක් සහිත පොරවකි. එම බිහිසුණු ආයුධය දුටු සැණින් ඇයගේ මුළු සිරුරම ප්‍රාණිකට බියක් මෙන් දුවනන්නට විය.

මීළඟ නිමේෂයේදී කෝපයේ ගිනිදැල් විහිදෙන දෙනෙතින් ප්‍රින්කා දෙසට පැමිණි හෙල්ගසන් තවත් පියවරක් ඉදිරියට තැබුවේය. බියෙන් මුසපත් වී සිටි ප්‍රින්කා උදව් ඉල්ලා කෑගැසීමට කොතෙකුත් උත්සාහ කළ ද ඇගේ මුවින් කිසිදු හඬක් පිට නොවීය.



යහන වෙත තව තවත් සමීප වූ හෙල්ගසන් ඉන් පසු එම අසරණ යුවතියගේ ගෙල ඉලක්ක කරමින් එම බිහිසුණු පොරව එසවීය. එහෙත් අඳුරු මුල්ලක සැඟවී තිබූ රිවෝල්වරයක් ක්‍රියාත්මක වූයේ මේ මොහොතේදීය. ඉන් නිකුත් වූ මුනිස්සම හෙල්ගසන්ගේ වම් කලවයට වැදිණි. ඉන් සිය සිරුරේ සමබරතාව රැක ගැනීමට අපොහොසත් වූ ඔහු පසෙකට ඇද වැටුණේය. ඔහු අතින් ගිලිහී ගිය පොරව ද පසෙකට විසි විය.

"ප්‍රින්කා!" මින් පසු ඇය වෙත දිව ආවේ එතෙක් වේලා අඳුරු මුල්ලක සැඟවී සිටි රොජර්ය.

"රොජර්! ඔයා මගේ ජීවිතේ බේරුවා! මේ මොනවද සිද්ධ වෙන්නෙ? මට මේක හීනයක් වගේ." ඇය පැවසුවේ ඔහුව වැළඳ ගනිමිනි.

"මම ඒ හැම දෙයක්ම ඔයාට පැහැදිලි කරලා දෙන්නම් ඊට කලින් මේ භයානක මිනීමරුවව කූඩුවකට දාලා ඉන්න ඕනෙ." රොජර් පැවසුවේ වෙඩි පහරින් බිඳී ගිය සිය වම් පාදය දෑතින් පිරිමදිමින් විලාප නගමින් සිටි හෙල්ගසන් දෙස බලමිනි.

"රොජර්! උඹට මේවට වන්දි ගෙවන්න වෙයි."

"වන්දි ගෙවන්න වුණොත් ඒකටත් මම සූදානම් හෙල්ගසන් මිතක ද මම උඹට පොරොන්දු වුණා, ඉයන් මැරුණු වෙලාවේ? මිනීමරුවට පස් වැනි වතාවටත් කාටවත් අත තියන්න ඉඩ දෙන්නෑ කියලා."

"උඹේ පොරොන්දුව යකාට දාපං රොජර්. මේකට උඹට වන්දි ගෙවන්න වෙනවා වෙනවාමයි!" හෙල්ගසන් රොජර්ට බැන වදින්නට විය.

ණ ණ ණ

kathapothak.blogspot.com

# රොජර්ගෙන් කරුණු පැහැදිලි කිරීමක්

මැකල්ටන් පෙදෙස භීතියෙන් මුසපත් කළ අති බිහිසුණු උන්මත්තක මිනීමරුවා නීතියේ රැහැනට හසු වූයේ එලෙසයි. එහෙත් ඒ සඳහා ඉයන් කෙස් නම් තරුණ පොලිස් නිලධාරියාට ද ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවීම කණගාටුවට කරුණකි.

"රොජර් මහත්තයා මට නම් මේක තවම විශ්වාස කරන්න බෑ." මැකල්ටන් පොලිස් මූලස්ථානයේ එක් සැරයන්වරයෙක් පැවසීය.

"කොච්චර විශ්වාස කරන්න බැරි වුණත් ඇත්ත ඒක තමයි." රොජර් පැවසීය.

"රොජර් මහත්තයා, මිනීමරුවා හෙල්ගසන් කියලා දැනගත්තෙ කොහොමද?" මැකල්ටන්හි නව පොලිස් පරීක්ෂක ලෙස පත් වූ ස්මිත් විමසීය. හෙල්ගසන්ව බන්ධනාගාරගත කිරීම හේතුවෙන් පුරප්පාඩු වූ තනතුරට ඔහුව පත්කර එවන ලද්දේ ලන්ඩනයේ සිටයි.

"ඒක දිග කතාවක් ස්මිත්. උසාවියෙදි මම ඒ හැම දෙයක්ම පැහැදිලි කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මම කෙටියෙන් කියන්නම්. මුලින්ම මගේ හිතේ හෙල්ගසන් ගැන සැකයක් ඇති වුණේ කොහොමද කියලා... මට පැහැදිලිවම පෙනුණ අර මුල් ඇනැටු ජේනගෙ ඝාතනය ගැන කිසිම තොරතුරක් හොයා ගන්න





හෙල්ගසන් ප්‍රමාණවත් උත්සාහයක් දරලා නැති බව. ඒ විතරක් නෙවෙයි, කැමිලා පාකර්ව ඝාතනය වුණු වෙලාවෙත් හෙල්ගසන් හැසිරුණේ ඒ විදියටමයි. අවාසනාවකට වගේ කැමිලාගෙ තාත්තා, පාකර් මහත්මයා ප්‍රසිද්ධියෙ කිව්වා, තමන් මිනීමරුවා කවුද කියන එක ගැන දන්නවා කියලා. හොඳට මතක් කරලා බලන්න, ස්මිත්. හෙල්ගසන් හැම වෙලාවෙම මහලු පාකර්ව මග හැරියා. පාකර් මැකල්ටන් පොලිස් මූලස්ථානයට ආපු වෙලාවෙත් හෙල්ගසන් පේන්න හිටියෙ නෑ. ඒ දෙක අතර තියෙන සම්බන්ධය මොකක්ද කියලා කල්පනා කරද්දි සාමාන්‍ය බුද්ධියක් තියෙන ඕනෙම මනුස්සයෙක්ට තේරෙනවා මෙතන මොකක්ද වෙන්නෙ කියලා. අනිවාර්යයෙන්ම හෙල්ගසන් පාකර්ව හඳුනනවා. ඒ වගේම පාකර් හෙල්ගසන්ව හඳුනනවා. ඒත් හෙල්ගසන් මැකල්ටන් වල ප්‍රධාන පොලිස් පරීක්ෂක කියලා පාකර් දන් නෑ. පාකරුයි හෙල්ගසනුයි හැසිරුණු විධියෙන් ඒ බව තහවුරු වෙනවා. ඉතින් මම කල්පනා කළා, හෙල්ගසනුයි, පාකරුයි මැරුණු කැමිලගෙයි අතර මොන වගේ සම්බන්ධයක් ද තියෙන්නෙ කියලා. සිද්ධ වෙන්න වැඩි සම්භාවිතාවයක් තිබුණෙ එක දෙයයි. ඒ තමයි කැමිලයි හෙල්ගසනුයි අතර ප්‍රේම සම්බන්ධතාවක් තිබීම. කැමිලගෙ තාත්තා මහලු පාකර් තමන්ගෙ අනාගත බෑනා කවුද කියන එක ගැන දැනන් ඉන්න ඇති. ඒත් හෙල්ගසන් ගැන වැඩි තොරතුරක් දැනන් ඉන් නැතුව ඇති. සමහර විට හෙල්ගසන් හිතා මතාම තාත්තවයි දුවයි රැවැට්ටුවා වෙන්නත් පුළුවන්. කොහොමහරි කාලයක් යද්දි කැමිලට තේරුම් යන්න ඇති හෙල්ගසන් ගත කළ සල්ලාල ජීවිතේ ගැන එහෙමත්නැත්නම් දෙන්නා අතරේ වෙනත් ප්‍රශ්නයක් ඇති වුණා වෙන්නත් පුළුවන්. ඉන් පස්සෙ කැමිලා තීරණය කළා හෙල්ගසන් ගෙන් ඈත් වෙන්න..." රොජර් පැවසීය.

"රොජර්, කොහොමද හරියටම ඒ දේවල් එහෙමමයි කියලා කියන්නෙ?" ස්මිත් විමසීය.

"ඔව්, මම ඒක පැහැදිලි කරන්නම්. එදා මගේ හිතේ ඒ වගේ සැකයක් ඇති වුණා විතරයි. ඒත් මම පස්සෙ හොයා ගත්තා ඒ දේවල් ඒ විදියටම තමයි සිද්ධ වුණේ කියලා... ඉතින්, හෙල්ගසන් කොහොමහරි කැමිලාව අමානුෂික විදියට ඝාතනය කළා අර ටට සති දෙකකට කලිනුත් ගැහැනු ළමයෙක්ව ඒ විදියටම මරලා දාලා තිබුණු බව ස්මිත්ට මතකයිනෙ? මට හිතෙන විදියට හෙල්ගසන් ඒක කළේ අත්හදා බැලීමක් විදියට. එහෙමත් නැත්නම් කැමිලාව බය කරන්න. ඒ දෙකෙන් කොයික ද කියන්න නම් මම තවම දන්නෑ. ඒ හැම දෙයක්ම උසාවියෙදි හෙළිවෙයි. අන්තිමට මහලු පාකර් මාව මුණගැහෙන්න ආවා. හෙල්ගසන් දැනගත්තා මේක දුර දිග ගියොත් තමන්ගෙ රහස හෙළිවෙන බව. මිනිහා සූක්ෂ්ම විදියට පාකර්වත් ඝාතනය කළා. එතනින් හැම දෙයක්ම කෙළවරවෙයි කියලයි හෙල්ගසන් හිතුවෙ. ඒ නිසා තමන්ව කැමිලාට සම්බන්ධ කරන්න පුළුවන් විදියෙ හැම දෙයක්ම විනාශ කර දමිය යුතුයි කියලා හෙල්ගසන්ට හිතෙන්න ඇති.

එදා හෙල්ගසන් වෙස්වලාගෙන පාකර්ගෙ ගෙදරට ගිහින් තමන්ගෙයි කැමිලාගෙයි අතර ප්‍රේම සම්බන්ධයක් තිබුණා කියලා ඔප්පු කරන්න පුළුවන් විදියෙ හැම දෙයක්ම අරගත්තා. ඒවා අරන් ආවේ තමන්ගෙ බංගලාවට. හැබැයි එක දෙයක් හෙල්ගසන්ට මග හැරුණා. ඒ තමයි අර නිල් වීදුරුවලින් හදපු කුරුළු ජෝඩුව. ඒකෙ වී. එච්. ගෙන් ආදරණීය කැමිලාට කියලා සටහන් කරල තිබුණා. වී. එච්. කියන්නෙ වෙන්ස් හෙල්ගසන් බව අමුතුවෙන් පැහැදිලි කරලා දෙන්න ඕනෙ නැහැනෙ ස්මිත්. මේ හැම දෙයක්ම ඒකෙන් තවත් තහවුරු වෙනවා.

ඒත් අවාසනාවකට වගේ හෙල්ගසන්ට දැනුණා මම හරි පාරට වැටිලා කියන එක. එදා හෙල්ගසන් මග රෑ අපේ තානායමට ආවේ මාව මරලා දාන්න. අවාසනාවකට වගේ ඉයන්ට තමයි ඒකට ජීවිතෙන් වන්දි ගෙවන්න සිද්ධ වුණේ.





මම අත්දැකීමෙන් දන්නවා මිනීමැරුම් චෝදනාවකට මිනිහෙක්ව වැරදිකාරයා කරන්න ප්‍රබල සාක්ෂි අවශ්‍ය වෙන බව. ඒ නිසා තමයි මම තීරණය කළේ හොර රහසේම හෙල්ගසන්ගෙ බංගලාවට ඇතුළුවෙලා හැම දෙයක්ම සෝදිසි කරන්න.

ලන්ඩන් යනවා කියලා කොහොමහරි හෙල්ගසන්ව රවට්ටන්න මට පුළුවන් වුණා. ඇත්තටම මම ඒ වෙලාවෙ කළේ හෙල්ගසන්ගෙ බංගලාවට ඇතුළු වුණු එක. මම හැම තැනක්ම සියුම්ව පරීක්ෂා කරලා බැලුවා. හෙල්ගසන්ගෙ ඇඳ යට තිබුණා තියුණු මුවහතක් තියෙන පොරවක්. ඒකෙ දුඹුරු පාට පැල්ලම් වගයකුත් තිබුණා. අර අසරණ ගැහැනු ළමයිගෙ අත් පය ඇඟෙන් වෙන් කළේ කොහොමද කියන එක මට තේරුම් ගියා. ඒත් එදා කැමිලාගෙ ගෙදර තිබිලා අරගෙන ආපු සිහිවටන වගේ දේවල් නම් මට ඒ වෙලාවෙ හොයා ගන්න බැරි වුණා.

මම හිතත් හිටියෙ අර නිල් වීදුරුවලින් හදපු කුරුලු ජෝඩුව හෙල්ගසන්ට පෙනෙන්න තියලා මිනිහගෙ ඉරියව් වෙනස් වෙන හැටි නිරීක්ෂණය කරන්න. ඒත් රෑ සිද්ධ වුණේ මම හිතෙකින්වත් හිතපු දෙයක් නෙවෙයි. හෙල්ගසන් එක්ක ප්‍රින්කා ගෙට ඇතුළු වුණා. ඒකෙන් මගේ සැලැස්ම වෙනස් කරන්න සිද්ධ වුණා. ඒ වගේම හැම දෙයක්ම ඉක්මන් වුණා.

"තමන් ආදරය කරපු කෙනෙකුගෙ අතපය කපලා දාන්න පුළුවන් නම්, ඒ වගේ මිනිහෙක්ට මේ ලෝකෙ කරන්න බැරි අපරාධයක් නෑ. ඒ නිසා ප්‍රින්කා ගැන මගේ හිතේ ලොකු බයක් ඇති වුණා. හෙල්ගසන්ට අවශ්‍ය වෙලා තිබුණෙ හොඳින් හෝ නරකින් මාව මැකල්ටන්වලින් පිට කරන්න. එක වතාවක් හෙල්ගසන් උත්සාහ කළා වෙඩි තියලා මාව මරන්න. ඒත් ඒ වතාවෙ මගේ මිත්‍රයා ඉයන්ට තමයි ඒකට ජීවිතෙන් වන්දි ගෙවන්න සිද්ධ වුණේ. ඉතින් එතනින් එහා කතාව පැහැදිලියි නේද ස්මිත්."

"ඔව්, ප්‍රින්කාගෙ ජීවිතේ බේරුණේ රොජර් එදා ඒ බංගලාවෙ හැංගිලා හිටපු නිසා. එහෙම නොවෙන්න මේ කතාව මීට වඩා ගොඩක් වෙනස් වෙන්න ඉඩ තිබුණා නේද රොජර්?"

"අනිවාර්යයෙන්ම. හෙල්ගසන් නොහිතපු විදියට උදාවුණු අවස්ථාවක් මේක. මම ලන්ඩන් ගියා කියලයි හෙල්ගසන් හිතන් හිටියෙ. අහම්බෙන් වගේ මේ අතරෙ ප්‍රින්කාගෙන් විදුලි පණිවුඩයක් එනවා, තමන් ඒ නවයට දුම්රිය පොළට එනවා කියලා. හෙල්ගසන් තමන්ගේ කෛරාටික මොළේ පාවිච්චි කරලා සූක්ෂම විදියට ප්‍රින්කාව මරන්න සැලසුම් කළා. හරියට ම ඒ නවයට හෙල්ගසන් ගියා දුම්රිය පොළට. ගිහින් ප්‍රින්කාව මුණගැහුණා. මම රාජකාරියකට නගරෙන් පිට ගිහින් කියලා, තමන්ගෙ බංගලාවට යන්න ප්‍රින්කාව කැමති කරවා ගත්තා. මම ලන්ඩන් ගියා කියලා කිව්වා නම් ප්‍රින්කා කිසිවිටක හෙල්ගසන්ගෙ බංගලාවට යන්න කැමති වෙන්නෑ. ප්‍රින්කාට ඒ වෙලාවෙ හෙල්ගසන් ගැන පොඩ්ඩක් වත් සැක හිතිලා නෑ. එහෙම සැක හිතන්නත් හේතුවක් නෑ. මොකද හෙල්ගසන් කියන්නෙ මැකල්වින්ඩ්වල ප්‍රධාන පොලිස් පරීක්ෂකයා... කොහොම හරි මේක අපි කාටත් හොඳ පාඩමක්."

ළ ළ ළ



kathapothak.blogspot.com

# මිනීමරුවාගේ පාපොච්චාරණය

දින කිහිපයකට පසුව හෙල්ගසන්ට එරෙහිව ගොනු කරන ලද නඩුකරය අධිකරණය හමුවේ විභාගයට ගැනිණි.

එහෙත් නඩු විභාගයක් පැවැත්වීමට ඉඩ නොතබා හෙල්ගසන් විසින් ඒව නැමැත්තෙන්ම සියල්ල පාපොච්චාරණය කිරීමට වූයේය.

"...මම මහ තිරිසනෙක්... මම තිරිසන් යක්ෂයෙක්. මම දන්නවා මට මගේ හෘදසාක්ෂියෙන් නම් කිසිම දවසක ගැලවීමක් ලැබෙන්නැති බව. ඒ නිසා මම කැමතියි එල්ලුම් ගස් යන්න කලින් ඒ හැම දෙයක්ම පාපොච්චාරණය කරන්න."

ඔහු එලෙස පවසද්දී මුළු අධිකරණ ශාලාවම මීයට පිම්බාක් මෙන් නිහඬ විය.

"මේ හැම දෙයක්ම සිද්ධ වුණේ මගේ වැරැද්ද නිසා..."

හෙල්ගසන් පැවසුවේය. "ඒත් මාව මේ තත්ත්වයට පත් කළ මේ අසාධාරණ සමාජයම තමයි මාව එල්ලුම් ගස් යවන්න හදන්නෙ... මගේ කතාව පටන් ගන්න වෙන්නෙ මගේ පුංචි කාලෙන්. මම අපේ පවුලේ එකම ළමයා. මට අවුරුදු දහයක් වෙද්දි මගේ අම්මා මාව අත්හැරලා වෙන කසාදයක් කර ගත්තා. මගේ තාත්තත් ගලක් වගේ හිතක් තිබුණු හිතේ කිසිම තෙතමනයක් නැති මහ රළු මිනිහෙක්. තාත්තා කිසිම දවසක මට ආදරෙන් [illegible] කතා කරලා නෑ. ඉතින් මට මේ වගේ ඉරණමක් [illegible] මගේ අම්මට මම හැමදාම හිතෙන් ශාප කළා. ඒ විතරක්

නෙවෙයි මම මුර ගෑහැනු සංහතියටම හැමදාම වෛර කරා. මම හැදුණෙ වැඩුණෙ අන්න ඒ වගේ සමාජ වටපිටාවක. ඒත් කොහොම හරි උසස් අධ්‍යාපනයක් ලබලා පොලිස් පරීක්ෂක තනතුර වගේ උසස් රැකියාවක් ලබන්නත් මට පුළුවන් වුණා."

"ඒත් ගෑහැනු ජාතිය ගැන මගේ හිතේ තිබුණු කලකිරීම කවදාවත් නැති වුණේ නෑ. මේ කතා කරන මේ මොහොතෙත් ඒක එහෙමම තමයි. ඒ විතරක් නෙවෙයි, මොකක් හරි අපරාධයක් සම්බන්ධව ගෑහැනු කෙනෙක්ව අත්අඩංගුවට ගන්න වෙලාවට මගේ හිතේ තිබුණු තරහ පිටවෙන තුරු උන්ට පහර දුන්නා. ඒ නිසා හෙල්ගසන් කියන්නෙ මහ සිරිසන් අමනුෂ්‍යයෙක් කියලා මැකල්වන්වල ප්‍රසිද්ධියට පත් වුණා. ඒ ගැන මගේ හිතේ කණගාටුවක් නෑ.

"මෙන්න මේ අතරේදී තමයි මට කැමිලා පාකර්ව මුණගැහුණෙ. කැමිලගෙ සැමියා ඉවමේ මාරිමත් සම්බන්ධව අසල්වාසියෙක් එක්ක ආරවුලක් ඇතිකරගෙන තිබුණා. ඒ සම්බන්ධ පරීක්ෂණයකට මට පාකර්ගෙ ගෙදර යන්න සිද්ධ වුණා. එහෙම ගිය වෙලාවක තමයි මට කැමිලාව මුල් වතාවට දකින්න ලැබුණෙ. ඒත් මගේ හිත ආදරය, දයාව, අනුකම්පාව වගේ දේවල් හඳුනාන්නෑ. ඒ නිසා මුලින් මගේ හිතේ කැමිලා ගැන ආදරයක් ඇති වුණේ නෑ."

"මම කියන්න උත්සාහ කළේ මෙන්න මේකයි. කැමිලයි මායි අතරේ ඒ වගේ ආදර සම්බන්ධයක් ඇති වෙන්න මුල් වුණේ මම නෙවෙයි. ඒක කැමිලගෙ බලවත් ඉල්ලීම මතයි සිද්ධ වුණේ. ආරම්භය කෙසේ වුවත් අන්තිමට අපි දෙන්න අතරේ ලොකු කිට්ටුකමක් ගොඩනැගුණා. ජීවිත කාලයක් පුරා නොලැබුණු ආදරේ කැමිලාගෙන් ලැබෙන බව මට තේරුම් ගියා. ඒත් මම කැමැති වුණේ නෑ අපේ සම්බන්ධෙට ප්‍රසිද්ධ වෙනවට. ඒ නිසා මම කැමිලට කිව්වා මේ ගැන තමන්ගෙ සැමියාටවත් කියන්න එපා කියලා. මම දන්නෙ නැතුවා, කැමිලා මට ආදරේ කළේ අවංකවමයි. ඒත් ඒ සතුට වැඩි කල් තියෙන්න දෛවය ඉඩ දුන්නෙ නෑ. අපි අතරට තුන්වැනියෙක් ආවා. ඒ තමයි ගාසියා කැතරින්. ගාසියා කැමිලගෙ





හොඳම මිතුරියක්. ඒත් මම හිතන්නෑ කැමිලා, ගාසියගෙ ඇත්ත සත්වෙ දන්නෙ හිටිය කියලා.

"ගාසියා කියන්නෙ කාගෙන් හරි කමක් නෑ තමන්ගෙ ආශාවන් ඉෂ්ට කර ගන්න ජාතියෙ මහ පුදුම ගෑහැනියක්. ඒ වගේම ගාසියට සිහිම දානියෙක් නෑ. ඒ නිසා ගාසියා ගත කළේ සෙල්ලක්කාර ජීවිතයක්. එයා කරන්නෙ මොනවද ආශ්‍රය කරන්නෙ කාවද කියලා හොයන්න කෙනෙක් හිටියෙ නෑ."

"එක දවසක් මම කැමිලව මුණගැහෙන්න ගිය වෙලාවක ගාසියත් හිටියා කැමිලා එක්ක. මේ විදියට දවස් දෙක තුනක්ම මට ගාසියවත් මුණගැහුණා.

එක දවසක් රෑ නවයට විතර මගේ බංගලාවට ගාසියා ආවා. ඒ විතරක් නෙවෙයි, ආවෙ තනියම. ඒ වෙන තුරුම මට ගාසියා ගැන ඇත හිතිලා තිබුණෙ නෑ. රෑට සාමාන්‍යයෙන් මත්පැන් ගන්න පුරුද්දක් මට තිබුණා. සාමාන්‍යයෙන් මම පාවිච්චි කරන්නෙ බ්‍රැන්ඩි. ඇර පාර බංගලාවෙ මම ගත කළ තනිකඩ ජීවිතය මට තිත්ත වෙලයි තිබුණෙ. ඒ නිසා ඒ හැම වෙලාවෙම මගේ පිහිටට හිටියෙ බ්‍රැන්ඩි බෝතලේ විතරයි.

එදා ගාසියා මගේ බංගලාවට ආවේ මොන අරමුණකින්ද කියන එක හිතා ගන්න අමාරු නෑ නේ. මමත් ඒ වෙලාවෙ හොඳ සිහි කල්පනාවකින් නෙවෙයි හිටියෙ. ඒ මදිවට ගාසියා අලුත් බ්‍රැන්ඩි බෝතලයක් කඩලා, මට තවත් බ්‍රැන්ඩි වීදුරුවක් දීලා, එයත් බ්‍රැන්ඩි වීදුරු දෙක තුනක් හිස් කළා. ඉන් පස්සෙ ගාසියා උම්තුවෙන් වගේ හැසිරුණු බව මට යන්තමින් මතකයි. එයා බංගලාවෙන් පිටවෙලා ගියේ පලුවදා උදේ පාන්දර. මම හිතුවෙ හැම දෙයක්ම එතනින් අවසාන වෙයි කියලයි. ඒත් ඒක ඒ විදියට සිද්ධ වුණේ නෑ."

"මම කොහොමහරි එදා උදේ පොලිස් මූලස්ථානයට ගියා. ඒත් කලින් දවසෙ රෑ සිද්ධ වුණු දෙයින් මගේ හිත ගොඩක් නොසන්සුන් වුණා."

❦ ❦ ❦

kathapothak.blogspot.com

# ගාසියාගේ අවසානය

දෙවැනි දවසෙ රෑ මට වැඩ රාජකාරි වගයක් යෙදිලා තිබුණා. ඒ නිසා රෑ මට බංගලාවට යන්න ලැබුණෙ නෑ. ඒත් ඊට පහුවෙනි දවසෙ රෑ මම හිටියෙ බංගලාවෙ. මම හිතුවෙ නෑ එදත් ගාසියා මාව හොයාගෙන බංගලාවට එයි කියලා. ඒත් ඒක සිද්ධ වුණා. රෑ දහයට විතර කරත්තයක් ඇවිත් දොරකඩ නතර කළා. ඒක කුලී කරත්තයක්. ගාසියා ගෙට ඇතුළු වුණු ගමන් පුරුදු විදියටම රාක්කෙන් බ්‍රැන්ඩි බෝතලයක් අරන් වීදුරුවකට බ්‍රැන්ඩි වත්කර ගත්තා.

"ගාසියා මොකන්ද මේතෙ තේරුම?" මම කෑගැහුවා.

"තේරුම? නිකන් බබෙක් වෙන්න හදන්න එපා හෙල්ගසන්. පව් අර අසරණ කැමිලා මේවා දන්නවා නම් පපුව පැලිලා මැරෙයි." එහෙම කියලා ඒකී මට තවත් බ්‍රැන්ඩි වීදුරුවක් දික් කළා. මගේ ඇඟේ මාළු තටන්න ගත්තා. ඉන් පස්සෙ ගාසියා පුරුදු විදියට මං ළඟට ඇවිත් මගේ උරහිසට අත තිබ්බා. තරමක් මත්වෙලා හිටියත් ඒ වෙලාවේ මම හොඳ සිහි කල්පනාවෙන් හිටියෙ.

ගාසියා, මගේ අතේ තිබ්බ බ්‍රැන්ඩි වීදුරුව මම පොළොවේ ගැහුවා. ඒ හඬින් භය වුණු ගාසියා ඉක්මනට මගෙන් අඩියක් දෙකක් විතර ඈත් වුණා. ඉන් පස්සෙ ගෙයින් එළියට බැහැලා යන්න ගියා. මගේ මූණ දක්කම ගාසියා හැම දෙයක්ම තේරුම්





ගන්න ඇති. තවදුරටත් මං ළඟ හිටියොත් මහ විනාශයක් සිද්ධ වෙයි කියලා ගාසියාට හිතෙන්න ඇති."

"ඒත් ගාසියා කියන්නෙ පළිගන්න ගියහම හැපින්නක් වගේ පස්සෙන් පන්න පන්න පළිගන්න ජාතියෙ ගෑනියක්. ඒ බව මට තේරුම් ගියේ ඊට පහුවෙනිදා කැමිලව මුණගැහෙන්න ගිය වෙලාවෙ.

"හෙල්ගසන්, තමුසෙ මහ නරුමයෙක්. තමුසෙට ලැජ්ජ නැද්ද ගාසියට අර වගේ අසූතු යෝජනාවක් කරන්න..." මේ විදියට කැමිලා මට නොනවත්වාම මිනිත්තු දහයක් විතර බැණ වැදුණා."

"කැමිලා මාව විශ්වාස කරන්න. මගේ අතේ කිසි වැරැද්දක් නෑ... ගාසියා ඔයා හිතන් ඉන්න විදියෙ අහිංසක කෙනෙක් නෙවෙයි..." මට කියන්න ලැබුණෙ එච්චරයි.

"කරුණාකරලා මගේ ඇස් දෙකට නොපෙනී මෙතනින් පිටවෙලා යන්න හෙල්ගසන්. තමුසෙ වගේ මිනිස්සු මය ඇඳගෙන ඉන්න තිල ඇඳුමටත් ශාපයක්..."

කැමිලා මට ආයෙත් දොස් කිව්වා. ඒ වෙලාවෙ මම මගේ හැඟීම් පාලනය කර ගත්තෙ බොහොම අමාරුවෙන්. මමත් බොහොම තදින් සෝන්හි යන මිනිහෙක්. මට තරහ ගියාම මොනවද කරන්නෙ කියලා මමවත් දන්නෑ. මම එදා මුළු දවසම කල්පනා කළා මට වෙච්ච දේ ගැන. ගාසියා මගේ ජීවිතේ විනාශ කළා. ඒ විතරක් නෙවෙයි කැමිලත් මට අපහාස කළා, කිසිම දෙයක් හොයන්නෙ බලන්නෙ නැතිව. ගැහැනු ජාතිය ගැන මගේ හිතේ තිබුණු පිළිකුල මේ සිද්ධිය නිසා තව තවත් වැඩි වුණා. ඒත් ඊට පහුවෙනිදත් මම ගියා කැමිලව මුණගැහෙන්න. එතකොට තමයි මට ආරංචි වුණේ කැමිලා රෝඩ්ස් වල එයාගෙ නෑදෑ ගෙදරකට ගිහින් බව. ආයෙත් සති දෙක තුනකින් තමයි එන්නෙ කියලා පණිවුඩයක් කියලා ගිහින් තිබුණා.

මේ වගේ දේවල් නිසා මගේ හිතේ ගාසියා ගැන තිබුණු තරහ තව තවත් වැඩි වුණා. මේ සිද්ධිය වෙලා හරියටම දවස් හතරයි ගත වුණේ. එදා රෑත් මම හිටියෙ බංගලාවෙ. රෑ නවයට විතර කරත්තයක් ඇවිත් ගෙයි ඉස්සරහ නතර කළා. කත්පර කිහිපයක් ගතවෙද්දි කරත්තෙ ආපහු පිටවෙලා යන හඬ මට ඇහුණා.

"නෙල්සන්!" මට ඇහුණා කවුරුහරි මට කතා කරන හඬ. ඒ කවුද කියන එක මම කටහඬින්ම හඳුනා ගත්තා. ඒ වෙන කවුරුවත් නෙවෙයි ගාසියා! කැමිලව මං ගැන කේලම් කියලා මගේ අනාගත බලාපොරොත්තු හැම එකක්ම විනාශ කරලා, ඒ හැසිරී ආපහු කිසි භයක් සැකක් නැතිව මං ළඟටම ආවා හොඳ කියලා හිතෙද්දි මට මාව පාලනය කරගන්න බැරිව ගියා. මට මතකයි ආයුධ ගබඩා කරලා තිබුණු කාමරේට ගිහින් මම පොරවක් ගත්ත බව. මම දොර ඇරියෙ ඒ පොරවත් අතේ තියාගෙනමයි. ගාසියා කවදාවත් හිතන් නැතුව ඇති මේ දොර අරින්නෙ තමන්ගෙ මාරයා කියලා. ඉන් පස්සෙ මම හැසිරුණේ මිනිහෙක් වගේ නෙවෙයි. තිරිසනෙක් වගේ. මගේ පොරෝ පාරට ගාසියාගෙ හිස කඳෙන් වෙන් වුණා." නෙල්සන් පැවසීය.

ඉන් පසු ඔහු විස්තර කළේ, ගාසියාගේ මළ සිරුර කිසිවෙකුට හඳුනාගත නොහැකි වන පරිදි දෑත් සහ දෙපා අමානුෂික ලෙස සිරුරෙන් වෙන් කර දැමූ ආකාරයයි. එය සංවේදී මනසක් ඇති කෙනෙකුට අසා සිටිය නොහැකි තරම් අමානුෂික විස්තරයකි. මිය ගොස් සිටින්නේ ගාසියා බැව් කිසිවෙකුට වටහා ගත නොහැකි වන සේ ඇගේ සිරුරෙන් වෙන් කරන ලද දෑත් දෙපා සහ හිස වත්තේ වළක් කපා එහි වළ දමා තිබූ අතර ඉතිරි කොටස ඔහු අලුයම එකට පමණ සිය අශ්වයේ දමාගෙන ගොස් මහ මඟ අයිනේ වූ පාළු ස්ථානයකට දමා ඇත.

"අන්න ඒ විධියටයි මම ඒ දේ සිද්ධ කළේ." ඔහු අවසානයේ පැවසීය.

❊ ❊ ❊



kathapothak.blogspot.com

# කැමිලා පාකර්

'ට පසුවෙනිදා අර පාළු වනරොදේ තිබුණු මළ සිරුර හොයා [illegible] ඒත් වැඩක් නෑ. මිනීමරුවා ළඟටම තමයි මිනිස්සු තමන්ගෙ [illegible] කියාගෙන ආවෙ. මම මොනොහොම අමාරුවෙන් ඒ [illegible] මගේ හැසිරීම පාලනය කරගත්තේ. මළ සිරුර පරීක්ෂා [illegible] වෙලාවෙ මගේ යටි හිත කෑගහල කියන්න ගත්තා, "[illegible] මිනීමරුවෙක්" කියලා. මම මේ ඇත්තමයි කියන්නෙ. එදා [illegible] අද වෙනතුරුත් මට සැනසිල්ලෙ එක තත්පරයක්වත් ඇස් දෙක පියාගෙන නිදාගන්න ලැබුණෙ නෑ. යන්තම් හරි මගේ ඇස් දෙක පියවුණොත් මට පේන්නෙ ගාසියගෙ මූණ. එහෙමත් නැත්නම් කැමිලාගෙ මූණ. ඒ විතරක් නෙවෙයි මට පේනවා ගාසියා තියුණු [illegible] තියන පොරොවකින් මට කොටන්න හදන විධිය. ඒ වගේ වෙලාවට මට යටි ගිරියෙන් කෑගැහෙනවා. ඒ හිතෙ [illegible] නෑ. මම හිතන්නෙ හැම මිනීමරුවෙක්ම මේ විධියට තමන් කළ අපරාධය නිසා දහස් වරක් හිතෙන් මැරි මැරි උපදිනවා ඇති. අපරාධයක් කළොත් නීතියෙන් කෙසේ වෙතත් තමන්ගෙ හෘද සාක්ෂියෙන් නම් කවදාවත් ගැලවුමක් ලැබෙන්නෙ නෑ. ඇත්තමයි, මගේ හෘද සාක්ෂිය මට වධ දෙනවා. 'මම මිනීමරුවෙක් කියලා'

මේ විධියට සති දෙකක් විතර ගත වුණා. මට පුළුවන් වුණා කොහොමහරි ගාසියගෙ මරණෙ ගැන තොරතුරු යට ගහන්න. ඒ

ප්‍රශ්නෙ ඒ විදියට කෙළවරක් වෙන්න හදද්දි තමයි කැමිලා ආපහු මාව හොයාගෙන බංගලාවට ආවේ. හැබැයි ඒ ආවේ සුහද සිතකින් නම් නෙවෙයි. ගාසියා අතුරුදන් වුණ එක ගැන කැමිලට සැක හිතෙන්න ඇති.

"හෙල්ගසන් මට ආරංචි වුණා පත්තරවල පළ වුණා කියලා, අනපය නැති හඳුනා නොගත් මළ සිරුරක් මැකල්ටන්වල කැලෑ රොදක තිබිලා හොයා ගත්ත කියන එක." කැමිලා ගෙට ඇතුළු වුණේ එහෙම කියාගෙන.

ඉන් පස්සෙ කැමිලා මට චෝදනා කළා මම ගාසියව මැරුවා කියලා.

"හෙල්ගසන් මම තමුසෙට යහතින් ඉන්න දෙන්නෑ. තමුසෙට උරුම එල්ලුම්ගහ විතරයි." එහෙම කියලා කැමිලා ගෙයින් පිටවෙන්නයි සූදානම් වුණේ. ඒ වෙනකොට වෙලාව හවස හයත් පහුවෙලා තිබුණ නිසා අඳුරත් වැටිලා තිබුණා. මම කැමිලට ගෙයින් පිටවෙන්න බැරි විධියට පාර හරස් කළා. ඉන් පස්සෙ දොර අගුළු දාලා යතුර අතට ගත්තා.

"කැමිලා කරුණාකරලා මම කියන දේ ටිකක් අහගන්න. මේ දේවල් සිද්ධ වුණේ මගේ වරදකින් නෙවෙයි" මම කොයිතරම් බැගෑපත් වුණත් කැමිලා ඒක එක පැත්තකට මායිම් කළේ නෑ. අන්තිමට මගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගියා. එදා කැමිලා ඒ විධියට නොහැසිරුණා නම් මේ දේවල් මේ විධියට සිද්ධ වෙන් නෑ.

ඒක මතක් වෙද්දිත් මගේ පපුව පැලෙන්න වගේ එනවා. ඒත් මට ඒ දේ කරන්න සිද්ධ වුණා. මේ දේවල් දිගින් දිගටම විස්තර කරන්න මම කැමති නෑ. මගේ පොරෝ පහර වැදුණු වෙලාවෙ කැමිලා වේදනාවෙන් කෑගහපු විධිය මේ දැනුත් මගේ ඔළුව ඇතුළෙ දෝංකාර දෙනවා වගේ ඇහෙනවා. අන්තිමට මම කැමිලටත්





ගාසියාට කළ දේම කළා. අනපය නැති මළ කඳ එදා රෑ මම පාළු එල්ම කැලෑවට ගිහින් දැම්මා.

ඒත් මම නොහිතපු විධියට මේ මිනීමැරුම් ගැන ස්කොට්ලන්ඩ්යාඩ් එකේ අවධානයට යොමුවෙලා ලන්ඩනයෙන් ඇවිත් මේ ගැන හොයන්න ගත්තා. මට තිබුණු ප්‍රධාන අභියෝගය තමයි රොජර්. ඒත් මට බැරි වුණා රොජර්ව නොමග යවන්න. කැමිලගෙ තාත්තා පාකර් තමන්ගෙ දුවගෙ මළ සිරුර හඳුන ගත්තා. අන්න එතනින් තමයි මේ හැම දෙයක්ම ඉක්මන් වුණේ. තමන්ගෙ දුවව නිතර ආශ්‍රය කළේ කවුද කියන එක පාකර් දැනන් හිටියා. ඒත් මම මැකල්ටන් පොලිසියෙ ප්‍රධාන පොලිස් පරීක්ෂක බව පාකර් දැනන් හිටියෙ නෑ. ඊකට හේතු වුණේ කැමිලගෙයි තාත්තගෙයි අතර සමීප සම්බන්ධයක් නොතිබුණු එක. කැමිලා තමන්ගෙ පෞද්ගලික තොරතුරු තාත්තා එක්ක කිව්වෙ නෑ. ඒ නිසා මං ගැන වැඩි විස්තරයක් පාකර් දැනන් හිටියෙ නෑ. ඒත් පාකර් කිහිප වතාවක් මට මුණගැහිලා තිබුණා. ඒ ගැන රොජර්ගෙ කණට ගියා නම් මං ගැන සැක හිතෙන්න ඉඩ තියෙනවා. ඒ නිසා හොඳින් හෝ නරකින් පාකර්ව නිහඬ කළ යුතුයි කියලා මම තීරණය කළා. එදා ඉස්පිරිතාලෙට මම ඇතුළු වුණේ මගේ නිල ඇඳුමෙන්. ඒ නිසා රොජර් මුරකාරයගෙන් ප්‍රශ්න කළ වෙලේ මං ගැන සඳහන් වුණේ නෑ. මම අර වැසිකිළියෙදි මගේ නිල ඇඳුම් ගලවලා කළු පාට කලිසමයි, කමිසයයි ඇඳගෙන වෙස් මාරු කරගත්තා. තමන් ආදරය කරපු කෙනාව මරපු මිනිහෙක්ට වෙනත් මිනිහෙක්ව මරණ එක බොහොම සුළු දෙයක්. පාකර්ට මොකද්ද සිද්ධ වුණේ කියලා කවුරුත් දන්නවානෙ. ඊට පස්සෙ මම හත්පර ගණනක් යද්දි ආයෙත් වැසිකිළියට ඇවිත් කළු කමිසයයි කලිසමයි ගලවලා දාලා කිසි කලබලයක් නැතිව එතනින් පිටවුණා. ඒක සිද්ධ වුණේ අන්න ඒ විධියටයි.

* * *

kathapothak.blogspot.com

# තීන්දුව

ඒ අභියෝගයත් මම කොහොමහරි ජය ගත්තා. ඊත් මට තේරුම් ගියා රොජර්ට මං ගැන සැක හිතිලා තියෙන බව. මම ඒක හොඳින්ම තේරුම් ගත්තේ එදා රොජර්ටයි ඉයානුයි මගේ බංගලාවට යවු කියලා යෝජනා කරපු වෙලාවේ. මම කොහොම හරි ඒක මඟහැරියා. ඉන් පස්සෙ රොජර්ලා එතැනින් පිටවෙලා යන්න ගියා. මට සැක හිතුණා රොජර් බංගලාව පැත්තෙන් යනවද කියලා. ඒ නිසයි මම කරත්තෙත් ආවේ. මම හිතපු දේ හරි. මැදි මට රොජර්ලව මුණගැහුණා. ඊත් රොජර්ට බංගලාවට ඇතුළු වෙන්න ඉඩ දෙන්න බැ. එහෙම වුණොත් මගේ හැම රහසක්ම හෙළිවෙයි කියලා මට බය හිතුණා. ඉතින් මම ලියකියවිලි වගයක් අරන් යන්න ආපු බව කියලා ඉක්මනට රොජර්ලව එතැනින් පිටත් කළා. ඊත් මම දැනන් හිටියා රොජර් මේක මෙතනින් අතහරින් නැති බව. ඒකයි එදා තීරණය කළේ හොඳින් හෝ නරකින් රොජර්වත් මේ පරිසරයෙන් ඉවත් කළ යුතුයි කියලා. ඊත් රොජර්ගෙ වාසනාවට එදා රෑ රොජර් හෝටලේ කාමරේ හිටියෙ නෑ. ඒ හිටිය නම් මගේ අතින් ඉයන් මැරුම් කන් නෑ. සැකයක් නෑ. එදා රෑ රොජර් මගේ බංගලාවට ඇතුළුවෙලා හැම දෙයක්ම සෝදිසි කරන්න ඇති. මට ඒකට හදිස්සියෙම පේන්නි ගියා.

මගේ ඇඳ යට තිබුණු ලේ පැල්ලම් තැවරුණ පොරව රොජර් දකින්න ඇති. ඒ විතරක් නෙවෙයි එදා මම කැමිලගෙ හෙදරින්





අරන් ආපු කැමිලගෙයි මගෙයි සම්බන්ධතාවයක් තිබුණු බව ඔප්පු කරන්න පුළුවන් විධියෙ සිහිවටන, ලියුම් වගේ දේවල් මම ගිනි උදුනට දාලා පිච්චුවා. සමහර විට ඒ පුන්චුන් අතර තිබුණු නොපිළිස්සුණු දේවල් රොජර් දකින්න ඇති. කොහොමහරි අන්තිමට රොජර් ලන්ඩන් යනවා කිව්වම මම පුදුම වුණා. ඇත්තටම ඒ වෙලාවෙ මම හිතුවෙ රොජර් ඇත්තටම මැකල්වන්වලින් පිටවුණා කියලයි. අන්න එතනයි මට වැරදුණේ.

මේ අතර අහම්බෙන් වගේ රොජර්ගෙ පෙම්වතිය, ප්‍රින්සා රොජර්ව හොයාගෙන මැකල්වන් ආවා. මම තීරණය කළා කැමිලටයි, ගාසියටයි උන්න දඬුවම ප්‍රින්සාටත් දෙන්න. රොජර්ගෙන් පළිගන්න තියෙන හොඳම ක්‍රමේ ඒක කියල මට හිතුණා. සමහරවිට ප්‍රින්සාව මැකල්වන් එවපු එක රොජර් හිතාමතා අටවපු උගුලක් වෙන්න ඇති. කොහොමහරි රොජර් අන්තිමට මාව මේ තත්ත්වයට පත් කළා.

ඉතින් මහත්වරුනි, මගේ බෙල්ලට තොණ්ඩුව දාන්න කලින් තවත් දතගත යුතු අපැහැදිලි තැනක් තියෙනවද?"

හෙල්ගසන් විමසුමෙන් සැලූව විනිසුරුවරයා දෙස බලමිනි. එහෙත් මුළු අධිකරණ ශාලාවම මීයට පිම්බක් මෙන් නිහඬය.

හෙල්ගසන්ට එරෙහිව පැවති මිනීමැරීමේ චෝදනා සතරම ඉතා පැහැදිලිවම ඔප්පු වූ බැවින් ඔහුට මරණීය දණ්ඩනය නියම කරනු හැර වෙනත් විකල්පයක් අධිකරණයට ද ඉතිරි නොවීය. එහෙයින් හෙල්ගසන්ට මරණ දඬුවම නියම විය.

හෙල්ගසන් බන්ධනාගාරය වෙත රැගෙන යෑමට අධිකරණ ශාලාවෙන් පිටතට ගත් මොහොතේ රොජර් ඔහු වෙත පැමිණියේය. එහෙත් හෙල්ගසන්ට පැවසීමට කිසිවක් ඔහුට ද ඉතිරිව නොතිබිණි. නිහඬව තත්පර කිහිපයක් හෙල්ගසන් දෙස බලා සිටි රොජර් සුදානම් වූයේ එතැනින් ඉවතට යෑමටයි.

"රොජර්..." හෙල්ගසන් ඔහු ඇමතීය. රොජර් ඔහු දෙස බැලුවේ ප්‍රශ්නාර්ථයක් මුහුණට නගාගනිමිනි.

"හිතේ තරහක් තියාගෙන මැරෙන්න මම කැමති නෑ රොජර්. මගේ බෙල්ලට තොණ්ඩුව දම්ම එක ගැන මම රොජර්ට සාප කළාට. මේ මුළු ලෝකෙම රොජර්ට ආශිර්වාද කරයි. මං වගේ භයානක මිනීමරුවෙක්ට නිසි දඬුවම් දුන්න එකට. ඒත් මතක තියාගන්න රොජර්,ගැනු කියන්නෙ අවස්ථාවාදී ජාතියක්. අද එක ගැහැනියක් නිසා මගේ ජීවිතේ විනාග වුණා වගේ, හෙට තවත් ගැහැනියක් නිසා වෙන කාගෙ හරි ජීවිතයක් විනාග වෙන්න පුළුවන්"

එසේ පැවසූ හෙල්ගසන් බන්ධනාගාර නිලධාරීන් සමග එතැනින් පිටව ගියේය. හෙල්ගසන් පැවසූ කරුණ පිළිබඳ රොජර් මදක් කල්පනා කර බැලුවේය. එහි යම් සත්‍යතාවක් ඇති බව ඔහුට අවබෝධ විය. එහෙයින් ඔහුගේ මුවින් දිවූ සුසුමක් පහත හෙළුණේ නිරායාසයෙනි.

මදක් ප්‍රමාද වී හෝ ජීවිත හතරක් බිලිගත් උන්මත්තක මිනීමරුවා නීතියේ රැහැනට හසුකර ගත හැකි වීම පිළිබඳ මැකල්ටන්හි ජනතාව ඉතා සිතින් සතුටු වනු ඇත. නඩු විභාගය අවසානයේ හෙල්ගසන් බන්ධනාගාරය වෙත රැගෙන යෑමෙන් අනතුරුව රොජර් පෙරළා ලන්ඩනය බලා පිටත් විය. සැබැවින්ම මැකල්ටන්හි වික්‍රමය ඔහුට මරණාසන්න අත්දැකීමක් බඳු විය. එදින රාත්‍රියේ තානායමේ රැඳී සිටියේ නම් ඉයන් කෘෂ්ට සිදුවූවාක් මෙන්ම රොජර්ගේ ඉරණම ද ඔහු අතින් විසඳීමට ඉඩ තිබිණි.



kathapothak.blogspot.com

# ආපසු හැරී බැල්මක්

මැකල්ටන්හි ඝාතකයා එලෙස නීතියේ රැහැනට හසුවීමත් සමගම එහි ජන ජීවිතය යථා තත්ත්වයට පත් විය. පෙරළා ලන්ඩනය වෙත පැමිණි රොජර් ප්‍රථමයෙන් ප්‍රින්කා හමුවීම සඳහා ඇගේ නේවාසිකාගාරය වෙත ගියේය. ඔහු පැමිණෙනු දුක ඇය පැහසුම් සුසුමක් හෙළුවාය.

"රොජර්! මම මේ දනුත් එදා වෙච්ච දේ ගැනයි කල්පනා කර කර හිටියේ."

"මම කිව්වෙ, එහේ වාතාවරණය ඒ තරම් හොඳ නෑ කියලා. ඔයා ඒ ගැන නොහිතා හදිස්සියෙ එහෙ ආවා... එදා මම එතන නොහිටිය නම් මොකක් ද සිද්ධ වෙන්නෙ?"

"අපි ඒ කතාව අමතක කරමු රොජර්.පත්තරවල පළවුණ දේවල් දැකලා මට සැක හිතුණා.ඒකයි මම මැකල්ටන් ආවේ." ඇය පැවසුවාය.

පිට කබාය ගලවා පසෙකට දැමූ රොජර් සෝපාවේ වැතිරුණේ පසුගිය දින කිහිපයේ සිදු වූ ඛේදජනක සිදුවීම් මාලාව පිළිබඳ සිහි කරමිනි. මිනීමරුවන් පසුපස ලුහුබැඳීමේදී තම ආරක්ෂාව පිළිබඳව මීට වඩා සැලකිලිමත් විය යුතු බව මේ වන විට ඔහු මැනවින් අවබෝධ කරගෙන සිටියේය.

**සමාප්තයි.**

# මරණාසන්න අත්දැකීමක් !

## A NEAR DEATH EXPERIENCE !

"......ඔව්, සිසි සැකයක් නෑ. මේකත්
ඒ මිනීමරුවගෙම වැඩක් ! මේ මිනී මැරුම්
දෙකම සිද්ධකරලා තියෙන්නෙ එකම විදිහට.
අත පය වෙන්කරන්න
පාවිච්චි කරලා තියෙන්නෙ
ලොකු මන්නයක්, පිහියක්
වගේ තියුණු බර
ආයුධයක්....."

"දෙවැනි වරටත් වන රොදක තිබී
තරුණියකගේ දෑත්, දෙපා සහ
හිස සුන් මළ සිරුරක්
සොයා ගැනිණි.
ස්කොට්ලන්ඩ් යාඩ් හි
මැද්දුනත් විමත්
අසාමාන්‍ය බව
පෙනී යයි."


kathapothak.blogspot.com

මිල රු. 180/-

ISBN 978-955-98943-6-0

ප්‍රතිභා ප්‍රකාශනයකි
GONGITHOTA, WATTALA

MARANASANNA ATHDAKEEMAK
SADEEPA BOOK SHOP
Rs. 180.00